වසර මැද
රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව
2025

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

2025 ඔක්තෝබර් 31

වසර මැද

රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2025

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ

50 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලදී.

අනුර කුමාර දිසානායක

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය

2025 ඔක්තෝබර් 31

වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2025

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 50 වැනි වගන්තිය යටතේ ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලදී.

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 50 වැනි වගන්තිය අනුව, වසර මැද රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය සම්බන්ධයෙන් වන වාර්තාවක් මුදල් අමාත්‍යවරයා විසින් අදාළ වසරේ ඔක්තෝබර් මස අවසාන දින හෝ අදාළ වර්ෂයේ විසර්ජන පනත සම්මත කර මාස දහයක් ගතවීම හෝ යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ දී මහජනතාවගේ දැන ගැනීම සඳහා නිකුත් කිරීමටත්, ඉන් ඉක්බිතිව එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය බව දැක්වේ.

ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි දක්වා ඇති රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය හා සසඳමින් ආණ්ඩුවේ වර්ෂය මැද මූල්‍ය කාර්යසාධනය ඇගයීමේ පදනමක් සැළසීම මෙම වාර්තාවේ අරමුණ වේ.

2025 වසරේ පළමු මාස හය තුළ රජයේ ආදායම, වියදම, මුදල් ප්‍රවාහ කටයුතු හා ණය ගැනීම් පිළිබඳ කාර්යසාධනය මෙම වාර්තාවේ ඇතුළත් වේ. 2025 පළමු මාස හය සඳහා වන අයවැය තත්ත්වය පිළිබඳ තාවකාලික දත්ත ද ලබාගත හැකි තොරතුරු අනුව සාර්ව ආර්ථික කටයුතු වල කාර්යසාධනය, මිල ගණන් වෙනස්වීම්, විදේශ මූල්‍යනය, රාජ්‍ය ණය, නිල සංචිත සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ කාර්ය සාධනය පිළිබඳ තොරතුරු ද මෙම වාර්තාවේ ඇතුළත් වේ.

පටුන

පිටු අංකය

01 වන පරිච්ඡේදය	**ආර්ථික සන්දර්භය**		
	1.1	සමාලෝචනය	1
	1.2	උද්ධමනය	3
	1.3	මුදල් සහ ණය	4
	1.4	කොටස් වෙළෙඳපොළ	5
	1.5	විදේශ අංශයේ ප්‍රවණතා	5
	1.6	ගෝලීය ආර්ථික ප්‍රවණතා	8
	1.7	ගෝලීය වෙළෙඳාම	9
	1.8	මුදල් හා මූල්‍ය අංශය	10
02 වන පරිච්ඡේදය	**රාජ්‍ය මූල්‍ය ප්‍රවණතා**		
	2.1	සමාලෝචනය	11
	2.2	රාජ්‍ය ආදායම	13
	2.3	රාජ්‍ය වියදම	25
	2.4	භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය	31
	2.5	රාජ්‍ය ණය කළමනාකරණය	32
03 වන පරිච්ඡේදය	**රජය සතු ව්‍යවසායයන්හි කාර්යසාධනය**		
	3.1	සමාලෝචනය	35
	3.2	රජය සතු ප්‍රධාන ව්‍යාපාර දහය පිළිබඳ සමාලෝචනය	35
04 වන පරිච්ඡේදය	**විදේශ මූල්‍යයනය**		
	4.1	සමාලෝචනය	42
	4.2	විදේශ මූල්‍යයන එකඟතා	42
	4.3	විදේශ මූල්‍යයනය ප්‍රතිලබ්ධි හා උපයෝජනය	42
	4.4	විදේශ ණය ප්‍රමාණය සහ විදේශ ණය සේවාකරණය	43

මූලික ආර්ථික දර්ශක

දර්ශකය	කාලපරිච්ඡේදය	ඒකකය	වටිනාකම 2024	2025 (තාවකාලික)
මූර්ත අංශය				
ආර්ථික වර්ධනය	පළමු භාගය	%	4.6	4.8
කෘෂිකර්මාන්ත	පළමු භාගය	%	1.8	0.6
කර්මාන්ත	පළමු භාගය	%	10.5	7.9
සේවා	පළමු භාගය	%	2.3	3.3
උද්ධමනය වාර්ෂික (ලක්ෂ්‍යමය) (කො.පා.මි.ද. 2021= 100)	ජූනි අවසානයට	%	1.7	-0.6
සේවා වියුක්ති අනුපාතය	පළමු කාර්තුව	%	4.5	3.8
ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය	පළමු කාර්තුව	%	47.1	49.7
රාජ්‍ය මූල්‍ය අංශය				
අයවැය හිඟය	ජන.-ජූනි	රු.බිලි.	599	406
මුළු ආදායම	ජන.-ජූනි	රු.බිලි.	1,861	2,322
බදු ආදායම	ජන.-ජූනි	රු.බිලි.	1,709	2,152
බදු නොවන ආදායම	ජන.-ජූනි	රු.බිලි.	151	170
මුළු වියදම	ජන.-ජූනි	රු.බිලි.	2,463	2,731
වර්තන වියදම	ජන.-ජූනි	රු.බිලි.	2,218	2,507
රාජ්‍ය ආයෝජන	ජන.-ජූනි	රු.බිලි.	258	228
රාජ්‍ය ණය	ජූනි.අවසානයට	රු.බිලි.	28,563	29,635
විදේශ අංශය				
අපනයන	ජන.-ජූනි	ඇ.ඩො.මිලි.	6,144	6,492
එයින් කෘෂි අපනයන	ජන.-ජූනි	ඇ.ඩො.මිලි.	1,281	1,428
කාර්මික අපනයන	ජන.-ජූනි	ඇ.ඩො.මිලි.	4,837	5,045
රෙදිපිළි හා ඇඟළුම්	ජන.-ජූනි	ඇ.ඩො.මිලි.	2,408	2,606
වෙනත්	ජන.-ජූනි	ඇ.ඩො.මිලි.	2,429	2,439
ආනයන	ජන.-ජූනි	ඇ.ඩො.මිලි.	8,684	9,762
පාරිභෝගික භාණ්ඩ	ජන.-ජූනි	ඇ.ඩො.මිලි.	1,534	2,316
අන්තර් භාණ්ඩ	ජන.-ජූනි	ඇ.ඩො.මිලි.	5,634	5,576
එයින් ඛනිජ නිෂ්පාදන	ජන.-ජූනි	ඇ.ඩො.මිලි.	2,209	1,996
ආයෝජන භාණ්ඩ	ජන.-ජූනි	ඇ.ඩො.මිලි.	1,511	1,863
වෙළඳ ශේෂය	ජන.-ජූනි	ඇ.ඩො.මිලි.	-2,540	-3,270
සංචාරක පැමිණීම්	ජන.-ජූනි	සංඛ්‍යාව	1,010,249	1,168,044
සංචාරක ඉපැයීම්	ජන.-ජූනි	ඇ.ඩො.මිලි.	1,557	1,713
සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ	ජන.-ජූනි	ඇ.ඩො.මිලි.	3,144	3,738
සමස්ථ ගෙවුම් ශේෂය	ජන.-ජූනි	ඇ.ඩො.මිලි.	1,761	523
දළ නිල සංචිත	ජූනි අවසානය	ඇ.ඩො.මිලි.	5,654	6,081
විනිමය අනුපාතය (මාසය අග)	ජූනි අවසානය	ඇ.ඩොලරයට රුපියල්	305.7	299.9
විනිමය අනුපාතය (මාසික සාමාන්‍යය)	ජන.-ජූනි	ඇ.ඩොලරයට රුපියල්	303.8	299.9
මූල්‍ය අංශය				
නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය	ජූනි.අවසානයට	%	8.50	7.25
නිත්‍ය ණය පහසුකම් අනුපාතය	ජූනි.අවසානයට	%	9.50	8.25
ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය	ජූනි.අවසානයට	%	2.00	2.00
වාණිජ බැංකු වල බරිත සාමාන්‍ය නව ණය පොළී අනුපාතය	ජූනි.අවසානයට	%	11.45	10.28
වාණිජ බැංකු වල බරිත සාමාන්‍ය ණය පොළී අනුපාතය	ජූනි.අවසානයට	%	12.47	11.56
භාණ්ඩාගාර බිල්පත් බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය (දින 91)	ජූනි.අවසානයට	%	10.07	7.55
භාණ්ඩාගාර බිල්පත් බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය (දින 364)	ජූනි.අවසානයට	%	10.31	7.94
මුදල් සැපයුම් වර්ධනය (M_{2b})	ජූනි 2025/ ජූනි 2024	%	9.8	10.4
පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය	ජූනි 2025/ ජූනි 2024	%	6.2	17.9

ශ්‍රී ලංකාව : තෝරාගත් දර්ශක

දර්ශකය	කාලපරිච්ඡේදය	ඒකකය	වටිනාකම
විදුලි බලය			
විදුලි බලය සඳහා ඇති ප්‍රවේශය	2016	%	99.3
ජලය			
පිරිසිදු පානීය ජල සැපයුම් සඳහා ප්‍රවේශය	2024	ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස	98.8
නල ජල පහසුකම් සඳහා ප්‍රවේශය	2024	ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස	63.1
මාර්ග			
මාර්ග ඝනත්වය	2024	වර්ග කි.මී.	0.19
මාර්ග වල මුළු දිග	2024	කි.මී	1 44,975
සන්නිවේදනය			
ජංගම දුරකථන ඇතුළුව දුරකථන ඝනත්වය	2024	පුද්ගලයින් 100 කට	141.2
අන්තර්ජාලය සඳහා ප්‍රවේශය	2024	පුද්ගලයින් 100 කට	105.6
අධ්‍යාපනය			
පොදු අධ්‍යාපනය			
ප්‍රාථමික පාසල් සඳහා ඇතුළත්වීමේ අනුපාතය	2024	%	83.1
ගුරු/ශිෂ්‍ය අනුපාතය (රජයේ පාසැල්)	2024	සංඛ්‍යාව	16.3
සාක්ෂරතා අනුපාතය (සාමාන්‍යය)	2023	%	93.2
පරිගනක සාක්ෂරතා අනුපාතය (පළමු මාස 6)	2024	%	36.4
විශ්ව විද්‍යාල අධ්‍යාපනය			
ගුරු/ශිෂ්‍ය අනුපාතය	2024	සංඛ්‍යාව	23.0
වයස් විශේෂිත ලියාපදිංචි අනුපාතය (වයස අවුරුදු 19-22) [අ]	2024	%	9.9
සෞඛ්‍ය			
රෝහල් (බටහිර වෛද්‍ය)	2023	සංඛ්‍යාව	649
ඇඳන්	2023	සංඛ්‍යාව	90,392
රෝහල් ඇඳන්	2023	පුද්ගලයින් 1,000 කට	4.1
වෛද්‍යවරයෙක් සඳහා පුද්ගලයින්	2023	සංඛ්‍යාව	985
ජනගහනය			
ජනගහන ඝනත්වය	2024	වර්ග කි.මීටරයට පුද්ගලයින්	352
ජනගහන වර්ධනය	2023	%	-0.6
උපතේදී ආයු අපේක්ෂාව	2017	අවුරුදු	75.5
ළදරු මරණ අනුපාතිකය	2020	සජීවී උපත් 1,000 කට	6.4
මාතෘ මරණ අනුපාතිකය	2022	සජීවී උපත් 1,000 කට	22.6
දළ උපත් අනුපාතිකය	2024	පුද්ගලයින් 1,000 කට	10.1
දළ මරණ අනුපාතිකය	2024	පුද්ගලයින් 1,000 කට	7.8
යැපුම් අනුපාතිකය	2024	%	49.5
දරිද්‍රතාව			
දරිද්‍රතා දර්ශකය	2019	%	14.3
ගෘහ ඒකක ආදායමෙහි ගිනි සංගුණකය	2019	සංගුණකය	0.46
දරිද්‍රතා පරතර දර්ශකය	2019	%	2.8
දිනකට ලබා ගන්නා සාමාන්‍ය කැලරි ප්‍රමාණය	2019	කිලෝකැලරි	2,120
ජාත්‍යන්තර ශ්‍රේණි ගත කිරීම්			
මානව සංවර්ධන දර්ශකය	2023	රටවල් 193 ක් අතරින් ස්ථානය	78
දූෂණ සංජානන දර්ශකය	2024	රටවල් 180 ක් අතරින් ස්ථානය	121
ගෝලීය තරඟකාරීත්ව දර්ශකය	2019	රටවල් 141 ක් අතරින් ස්ථානය	84
ආර්ථික නිදහස් දර්ශකය	2024	රටවල් 184 ක් අතරින් ස්ථානය	148
ගෝලීය සාම දර්ශකය	2024	රටවල් 163 ක් අතරින් ස්ථානය	100
ඊ-රාජ්‍ය සංවර්ධන දර්ශකය	2024	රටවල් 193 ක් අතරින් ස්ථානය	98

(අ) අභ්‍යන්තර ලියාපදිංචි වූ සිසුන් පමණක් ඇතුළත් වේ.

1 වන පරිච්ඡේදය

ආර්ථික සන්දර්භය

1.1 සමාලෝචනය

කෘෂිකර්මාන්ත, කර්මාන්ත, සේවා සහ සහනාධාර අඩුකළ බදු ඇතුළුව ආර්ථිකයේ සියලුම අංශවල ප්‍රසාරණය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය 2024 වසරේ පළමු භාගයේ පැවති සියයට 4.6 ක ප්‍රසාරණයට සාපේක්ෂව 2025 වසරේ පළමු භාගයේ දී සියයට 4.8 කින් ප්‍රසාරණය විය. අඛණ්ඩව මාස 11 ක් මුළුල්ලේ වාර්තා වූ අවධමනයෙන් පසු, වාර්ෂික ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය 2025 වසරේ අගෝස්තු මාසයේදී ධනාත්මක කලාපයකට අවතීර්ණ වූ අතර, 2025 වසරේ සැප්තැම්බර් මාසයේ සිට ඉහළ යාමේ ප්‍රවණතාවයක් පිළිඹිබු කරන ලදී. මතුපිට උද්ධමනය, 2025 වසරේ අගෝස්තු මාසයේදී සියයට 1.2 සිට 2025 වසරේ සැප්තැම්බර් මාසයේදී සියයට 1.5 දක්වා වැඩි විය. 2025 වසරේ අගෝස්තු මස අවසාන වන විට දළ නිල සංචිත ඇ.ඩො. බිලියන 6.2 ක් වූ අතර ශ්‍රී ලංකා රුපියල පුළුල් ලෙස ස්ථාවරව පැවතුනි. ආදායම මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ළඟා කර ගැනීමේ ක්‍රියාවලිය හේතුවෙන් ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස බදු ආදායම 2023 වසරේ දී සියයට 9.9 ක සිට 2024 වසරේ දී සියයට 12.4 දක්වා ප්‍රතිශතාංක 2.5 කින් වර්ධනය විය. ආදායම් රැස් කිරීමේ ආයතනවල දූෂණ අවදානම් අවම කිරීම සඳහා ඩිජිටල්කරණය සහ බදු පරිපාලන ප්‍රයත්නයන් වැඩිදියුණු කිරීමත් සමඟ ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස බදු ආදායම 2025 වසරේ දී සියයට 14.8 ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය බොහෝ දුරට අවසන් වීම ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ප්‍රවේශයක් ලබා දී ඇත. වෙළඳ හිඟය පුළුල් වීම මධ්‍යයේ වුවද, සංචාරක ව්‍යාපාරයෙන් සහ සේවක ප්‍රේෂණ මඟින් වන ගලා ඒම් වර්ධනය වීම හේතුවෙන් 2025 වසරේ ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා කාලසීමාව තුළ ශ්‍රී ලංකාවේ විදේශ අංශය ශක්තිමත්ව පැවතිණි. සේවා අංශයේ ගලා ඒම් හේතුවෙන් ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා විය.

2024 වසරේ සැප්තැම්බර් මාසයේ පැවති මහ මැතිවරණයෙන් පසු රටේ ඇති වූ ආර්ථික ස්ථාවරත්වය පිළිබිඹු කරමින්, ශ්‍රී ලංකාව නිල වශයෙන් ණය පැහැර හැරීමේ මට්ටමෙන් මිදී ඇත. ෆිච්, මූඩීස් සහ එස් ඇන්ඩ් පී ශ්‍රේණිගත කිරීම් මඟින් ශ්‍රී ලංකාවේ ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නංවා ඇත: ෆිච් ශ්‍රේණිගත කිරීම් ශ්‍රී ලංකාවේ දිගුකාලීන විදේශ මුදල් නිකුත්කරන්නන්ගේ පැහැර හැරීම් ශ්‍රේණිගත කිරීම 'සීමාකරන ලද ණය පැහැර හැරීම්' මට්ටමේ සිට 'CCC+' මට්ටම දක්වා ඉහළ නංවා ඇත; මූඩීස් ආයෝජක සේවාව එහි දිගුකාලීන විදේශ මුදල් නිකුත්කරන්නන්ගේ ශ්‍රේණිගත කිරීම 'Ca' මට්ටමේ සිට සිට 'Caa1' මට්ටම දක්වා ඉහළ නංවා ඇත; එස් ඇන්ඩ් පී ගෝලීය ශ්‍රේණිගත කිරීම්, ශ්‍රී ලංකාවේ දිගුකාලීන සහ කෙටි කාලීන විදේශ මුදල් ශ්‍රේණිගත කිරීම් 'SD/SD' මට්ටමේ සිට 'CCC+/C' මට්ටම දක්වා ඉහළ නංවා ඇත. මේ අතර, රජය විසින් ශ්‍රී ලංකාවේ වර්ධන විභවතාවය වැඩි කිරීම සඳහා මධ්‍ය කාලීනව තිරසාර ආර්ථික වර්ධනයක් ළඟා කර ගනිමින් ආර්ථිකයේ ව්‍යුහාත්මක දුර්වලතා පිටුදකිමින් ආයතනික ප්‍රතිසංස්කරණ පවත්වා ගැනීම සඳහා අවධානය යොමු කළ දූෂණ විරෝධී ක්‍රියාවලියක නිරත වී සිටියි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම මඟින් සහාය දක්වන ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය සමඟ රජය බැඳී සිටී. ශ්‍රී ලංකාවේ සිව් අවුරුදු විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ සිව්වන සමාලෝචනය 2025 වසරේ ජූලි මස 1 වන දින සාර්ථකව නිම කරන ලදී. 2025 වසරේ ඔක්තෝබර් මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්ය මණ්ඩලය හා ශ්‍රී ලංකාවේ බලධාරීන් පස්වන සමාලෝචනය යටතේ කාර්ය මණ්ඩල එකඟතාවයකට එළඹෙන ලද අතර 2025 වසරේ දෙසැම්බර් මස වන විට ඇ.ඩො. මිලියන 347ක වාරිකයක් නිදහස් කිරීමට අපේක්ෂිතතය.

2025 වසරේ පළමු භාගයේදී ආර්ථිකයේ සියලුම අංශ සංවර්ධනය වී ඇත. ප්‍රධාන වශයෙන් වී වගාව, කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීවී වගාව සහ සත්ත්ව නිෂ්පාදනයේ ප්‍රසාරණය හේතුවෙන් 2025 වසරේ පළමු භාගයේදී කෘෂිකාර්මික අංශය සියයට 0.6 කින් සුළු වශයෙන් වර්ධනය විය. ප්‍රධාන වශයෙන් නිෂ්පාදන, ඉදිකිරීම්, පතල් හා කැණීම් ක්‍රියාකාරකම්වල වාර්තා වූ සැලකිය යුතු වර්ධනය හේතුවෙන් 2025 වසරේ පළමු භාගයේදී කර්මාන්ත අංශය සියයට 7.9 කින් වර්ධනය විය. තොග සහ සිල්ලර වෙළඳාම, ප්‍රවාහන සහ මූල්‍ය සේවා ක්‍රියාකාරකම්වල ප්‍රසාරණය හේතුවෙන් 2025 වසරේ පළමු භාගයේදී සේවා අංශය සියයට 3.3 කින් වර්ධනය විය. මේ අතර, සහනාධාර අඩු කළ බදු අංශය සියයට 10.6 කින් වර්ධනය වී එම අංශය මඟින් ආර්ථිකයට ලබා දෙන දායකත්වය පිළිඹිබු කරමින් කෘෂි කර්මාන්ත අංශය විසින් ලබාදෙන සියයට 8.8ක දායකත්වය ඉක්මවා යන ලදී.

අඛණ්ඩව මාස 11 ක් මුළුල්ලේ අවධමනයක් වාර්තා කිරීමෙන් අනතුරුව, 2025 වසරේ අගෝස්තු මාසයේදී මතුපිට උද්ධමනය ධනාත්මක කලාපයකට අවතීර්ණ විය. කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යාමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය, ආසන්න වශයෙන් වසරක පමණ අවධමනයකින් පසු 2025

වසරේ අගෝස්තු මාසයේදී සියයට 1.2 සිට 2025 වසරේ සැප්තැම්බර් මාසයේදී සියයට 1.5 දක්වා වැඩි විය. ආහාර උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය) 2025 වසරේ සැප්තැම්බර් මාසයේදී සියයට 2.9 දක්වා වේගයෙන් වර්ධනය වූ අතර, ආහාර නොවන කාණ්ඩයන්ගේ උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය) සියයට 0.7 ක මට්ටමේ පැවතුනි. සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අනුගමනය කරමින් සියයට 5 ක උද්ධමන ඉලක්කයක් කරා යමින් ඉදිරි කාල සීමාව තුළ උද්ධමනය ක්‍රමයෙන් වේගවත් වන බව පුරෝකතන මඟින් අනාවරණය වේ. මේ අතර, ආර්ථිකයේ යටිදැරි උද්ධමන ප්‍රවණතා පිළිබිඹු කරනු ලබන මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය) 2025 වසරේ සැප්තැම්බර් මාසයේදී සියයට 2.0 ක පැවතුනි.

දේශීය මෙන්ම ගෝලීය වශයෙන් ඇති වූ ප්‍රවණතා සැලකිල්ලට ගනිමින්, 2025 වසරේ සැප්තැම්බර් මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිපත්ති පොලී අනුපාතිකය වන එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සියයට 7.75 ක පවත්වා ගන්නා ලදී. 2024 වසරේ නොවැම්බර් මස 27 වන දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ලෙස එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය අර්ථ දක්වා ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරන ලද ආන්තිකයක් සහිතව නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමඟ සම්බන්ධ කර ඇත. නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පිළිවෙලින් සියයට 7.25 ක සහ සියයට 8.25 ක තබා ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සියයට 7.75 ක් ලෙස අඛණ්ඩව පවත්වා ගන්නා ලදී. වත්මන් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ආර්ථික වර්ධනය සඳහා සහාය වන අතරම සියයට 5.0 ක් වූ උද්ධමන ඉලක්කය ළඟා කර ගැනීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

1.1 වගුව : උද්ධමනයේ විචලනය (%)

වසර	මාසය	කොළඹ පාරිභෝගික මිළ දර්ශකය				ජාතික පාරිභෝගික මිළ දර්ශකය			
		මතුපිට උද්ධමනය		මූලික* උද්ධමනය		මතුපිට උද්ධමනය		මූලික උද්ධමනය	
		ලක්ෂ්‍යමය	වාර්ෂික සාමාන්‍යය	ලක්ෂ්‍යමය	වාර්ෂික සාමාන්‍යය	ලක්ෂ්‍යමය	වාර්ෂික සාමාන්‍යය	ලක්ෂ්‍යමය	වාර්ෂික සාමාන්‍යය
2024	ජනවාරි	6.4	14.2	2.2	11.3	6.5	13.4	2.2	12.3
	පෙබරවාරි	5.9	11.3	2.8	8.5	5.1	10.2	2.7	9.2
	මාර්තු	0.9	8.0	3.1	6.1	2.5	7.2	3.4	6.5
	අප්‍රේල්	1.5	5.7	3.4	4.4	2.7	5.2	3.0	4.6
	මැයි	0.9	3.9	3.5	3.3	1.6	3.7	3.1	3.3
	ජුනි	1.7	3.1	4.4	2.8	2.4	3.0	3.9	2.7
	ජූලි	2.4	2.8	4.4	2.7	2.5	2.9	3.0	2.5
	අගෝස්තු	0.5	2.5	3.6	2.7	1.1	2.8	2.3	2.3
	සැප්තැම්බර්	-0.5	2.4	3.3	2.8	-0.2	2.7	1.9	2.3
	ඔක්තෝබර්	-0.8	2.2	3.0	2.9	-0.7	2.5	1.7	2.4
	නොවැම්බර්	-2.1	1.7	2.7	3.1	-1.7	2.2	1.5	2.5
	දෙසැම්බර්	-1.7	1.2	2.7	3.3	-2.0	1.6	1.3	2.5
2025	ජනවාරි	-4.0	0.4	1.2	3.2	-4.0	0.7	-0.2	2.3
	පෙබරවාරි	-4.2	-0.5	0.7	3.0	-3.9	0.0	-0.6	2.0
	මාර්තු	-2.6	-0.8	0.7	2.8	-1.9	-0.4	-0.6	1.7
	අප්‍රේල්	-2.0	-1.1	0.8	2.6	-0.8	-0.7	-0.1	1.4
	මැයි	-0.7	-1.2	1.2	2.4	0.6	-0.8	0.3	1.2
	ජුනි	-0.6	-1.4	1.5	2.1	0.3	-0.9	0.6	0.9
	ජූලි	-0.3	-1.6	1.6	1.9	0.7	-1.1	0.9	0.7
	අගෝස්තු	1.2	-1.5	2.0	1.8	1.5	-1.0	1.5	0.7

මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**කොළඹ පාරිභෝගික මිළ දර්ශකය හා ජාතික පාරිභෝගික මිළ දර්ශකය (පදනම් වර්ෂය 2021 = 100) - ආහාර, බලශක්ති සහ ප්‍රවාහනය යන නිතර වෙනස් වන අයිතම හැර*

කොටස් වෙළෙඳපොළ සාධනීය වූ කාර්යසාධනයක් පිළිඹිබු කරමින් 2025 වසරේ ජුනි මස අවසානයේදී (වාර්ෂික ලක්ෂ්‍යමය) සමස්ත කොටස් මිල දර්ශකය (1985=100) ඒකක 18,027 ක් දක්වා සියයට 48.4 කින් වර්ධනය වූ අතර, (වාර්ෂික ලක්ෂ්‍යමය) ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ශ්‍රී ලංකා 20 දර්ශකය (2004=1,000) ඒකක 5,353 ක් දක්වා සියයට 49.2 කින් වර්ධනය විය.

2025 වසරේ පළමු මාස අට තුළ විදේශ අංශය සාධනීය කාර්යසාධනයක් පිළිඹිබු කරන ලදී. 2024 වසරේ පළමු මාස අට තුළ ඇ.ඩො. බිලියන 8.5 ක් වූ වෙළෙඳ භාණ්ඩ අපනයන 2025 වසරේ සමාන

කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. බිලියන 9.1 ක් දක්වා සියයට 6.7 කින් වර්ධනය විය. 2024 වසරේ පළමු මාස අට තුළ ඇ.ඩො. බිලියන 12.1 ක් වූ වෙළෙඳ භාණ්ඩ ආනයන 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුල ඇ.ඩො. බිලියන 13.3 ක් දක්වා සියයට 10.5 කින් වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 වසරේ පළමු මාස අට තුළ ඇ.ඩො. බිලියන 3.6 ක් වූ වෙළඳ හිඟය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. බිලියන 4.3 ක් දක්වා වර්ධනය විය.

2024 වසරේ පළමු මාස අට තුළ ඇ.ඩො. බිලියන 4.3 ක් ලෙස වාර්තා වූ ශ්‍රමික ප්‍රේෂණ 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. බිලියන 5.1 ක් දක්වා සියයට 19.3 කින් සැළකියයුතු ලෙස වර්ධනය විය. 2024 වසරේ පළමු මාස අට තුළ ඇ.ඩො. බිලියන 2.2 ක් ලෙස වාර්තා වූ සංචාරක ඉපැයීම්ද[1] 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. බිලියන 2.3 ක් දක්වා සියයට 5.7 කින් වර්ධනය විය. 2024 වසරේ පළමු මාස අට තුළ ඇ.ඩො. බිලියන 2.6 ක් වූ සේවා අංශයේ ශුද්ධ ගලා ඒම් 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. බිලියන 2.7 ක් කරා ළඟා විය.

ණය සේවාකරණ ගෙවීම් මධ්‍යයේ වුවද, 2025 වසරේ අගෝස්තු මස අවසාන වන විට චීන මහජන බැංකුවේ විදේශ විනිමය හුවමාරු පහසුකම ද ඇතුළත්ව දළ නිල සංචිත ප්‍රමාණය ඇ.ඩො. බිලියන 6.2 ක් විය. 2025 වසරේ සැප්තැම්බර් මස අවසාන වන විට, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල වසර ආරම්භයේ සිට මේ දක්වා සියයට 3.3 කින් අවප්‍රමාණය වී තිබේ.

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 50 වන වගන්තියට අනුව, 2025 වසරේ පළමු මාස හයට අදාළ සංවර්ධනයන් පහත කාණ්ඩයන්හි අන්තර්ගත වේ.

1.2 උද්ධමනය

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද. 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2025 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ සියයට -4.0 සිට 2025 වසරේ ජුනි මාසයේ දී සියයට -0.6 දක්වා ඉහළ යන ලදී. 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී (සියයට -0.5) ඍණ කලාපයට ඇතුළුවීමෙන් පසුව, 2025 වසරේ පෙබරවාරි මාසයේ දී උද්ධමනය එහි වාර්තා වූ අවම අගය වන සියයට -4.2 ට ළඟා විය. විශේෂයෙන්ම විදුලි ගාස්තු, ඉන්ධන සහ ද්‍රවීකෘත පෙට්‍රෝලියම් ගෑස් මිල කිහිපවතාවක්ම පහත දැමීම, දේශීය සැපයුම් දාමයන් වැඩිදියුණු කිරීම, සහ ගෝලීය සැපයුම් දාමයන් යථා තත්ත්වයට පත්වීම වැනි සැපයුම් අංශයේ සාධක මෙම අවධමනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ නමුත්, ප්‍රධාන වශයෙන්ම සංඛ්‍යානමය පදනමේ බලපෑම හේතුවෙන්, 2025 වසරේ මාර්තු මාසයේ සිට මෙම අවධමන ප්‍රවණතාවය ලිහිල් වීම ආරම්භ විය.

මේ අතර, නිතර මිල උච්ඡාවචනය වන අයිතම වන ආහාර, බලශක්තිය සහ ප්‍රවාහනය වැනි කාණ්ඩ බැහැර කිරීම මඟින් ආර්ථිකයේ යටිදැරි උද්ධමන ප්‍රවණතා පිළිබිඹු කරනු ලබන මූලික උද්ධමනය සැලකූ විට, කො.පා.මි.ද. (2021=100) යෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මූලික උද්ධමනය, 2025 වසරේ පළමු භාගය පුරාම ධන අගයන් වාර්තා කරන ලදී. එය 2025 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ සියයට 1.2 සිට 2025 වසරේ ජුනි මාසයේ දී සියයට 1.5 දක්වා වැඩි විය. මෙම සාපේක්ෂව ස්ථාවර මූලික උද්ධමනය මඟින් අවධමනය ඉල්ලුම මත පදනම් නොවූ බව පෙන්වාදෙන අතර, මූලික උද්ධමනයේ දක්නට ලැබෙන ප්‍රවණතාවය මඟින් බලශක්ති මිල සංශෝධනවල දෙවන අදියර බලපෑම් පිළිබිඹු වේ.

ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී (සියයට -0.2) ඍණ කලාපයට ඇතුළුවීමෙන් පසුව, 2025 වසරේ ජනවාරි මාසයේ දී එහි වාර්තා වූ අවම අගය වන සියයට -4.0 වාර්තා කරන ලදී. 2025 වසරේ මැයි මාසයේ දී සියයට 0.6 ක අගයක් වාර්තා කරමින් එය නැවත ධන කලාපයට ඇතුළු විය. කෙසේ නමුත්, 2025 වසරේ ජුනි මාසයේ දී මතුපිට උද්ධමනය නැවතත් සියයට 0.3 දක්වා පහත වැටුණි. ජාතික පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ මතුපිට උද්ධමනයේ වූ මෙම දිශානති වෙනස්වීම පාරිභෝගික භාණ්ඩ පැසෙහි සංයුතියේ ඇති වෙනස්කම් පිළිබිඹු කරයි: කො.පා.මි.ද.යෙහි භාණ්ඩ පැස තුළ ආහාර නොවන අයිතම වැඩි කොටසක් ඇති අතර, ජා.පා.මි.ද.යෙහි භාණ්ඩ පැස තුළ ආහාර මත සාපේක්ෂව වැඩි බරක් පැටවේ. එලෙසම, ජා.පා.මි.ද. (2021=100) යෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මූලික උද්ධමනය, 2025 වසරේ ජනවාරි මාසයේ දී සියයට -0.2 ක අගයක් වාර්තා කරමින් ඍණ කලාපයට ඇතුළු වූ අතර, 2025 වසරේ මැයි මාසයේ දී සියයට 0.3 ක් වාර්තා කරමින් නැවත ධන කලාපයට ඇතුළු වී, ඉන්පසු 2025 වසරේ ජුනි මාසයේ දී සියයට 0.6 දක්වා වැඩි විය.

බලශක්ති සහ ප්‍රවාහන මිල ගණන් ස්ථායී වීම සහ පවත්නා සහනශීලී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය හේතුවෙන් ඉල්ලුම් තත්ත්වයන් ක්‍රමයෙන් වැඩිදියුණු වීමත් සමඟ, 2025 වසරේ තෙවන කාර්තුවේ දී උද්ධමනය ධනාත්මක වී, ක්‍රමයෙන් සියයට 5 ක ඉලක්කයට ළඟා වනු ඇතැයි ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි.

1 2025 වසරේ අගෝස්තු මාසයේ දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරකයෙකු විසින් දිනකට දරනු ලබන සාමාන්‍ය වියදම් ඇස්තමේන්තුව අඩුවන පරිදි ගැලපීම් සිදු කරන ලදී.

1.3 මුදල් සහ ණය

ශ්‍රී ලංකා මහ බැංකුව, වසර ආරම්භයේ දී සියයට 8.00 ක් වූ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය, 2025 වසරේ මැයි මාසයේ දී පදනම් අංක 25 කින් අඩු කර සියයට 7.75 දක්වා පහත හෙළමින් මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කරන ලදී. ඒ අනුව, අනුපාතික පදනම් අංක ± 50 ක ආන්තිකයක් සහිතව එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමඟ සම්බන්ධ කර ඇති නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතය පිළිවෙලින් සියයට 7.25 සහ සියයට 8.25 දක්වා අඩු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, කෙටිකාලීන අනුපාත, බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය සහ බරිත සාමාන්‍ය නව කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර පොලී අනුපාතිකය වැනි ණය පොලී අනුපාත සහ අනෙකුත් ප්‍රධාන වෙළෙඳපොළ තැන්පතු සහ ණය පොලී අනුපාත ඇතුළුව බොහෝ වෙළෙඳපොළ පොලී අනුපාත පහත වැටුණි. 2025 වසරේ ජනවාරි මස සිට ජුනි මස දක්වා කාලසීමාව තුළ දී, ප්‍රාථමික වෙන්දේසිවල සියලුම කල්පිරීම්වලට අදාළ භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික පහළ ගිය අතර, ප්‍රාථමික සහ ද්විතියික වෙළෙඳපොළ යන දෙකෙහිම දිගුකාලීන කල්පිරීම්වලට අදාළ ඵලදා අනුපාතික පහත වැටුණි. 2025 වසරේ පළමු භාගය තුළ දී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය සියයට 2.00 ක් ලෙස නොවෙනස්ව පැවතුන අතර, එම නිසා ද්‍රවශීලතාවයට සෘජු බලපෑමක් ඇති නොවූ බැවින්, මුදල් තත්ත්වයන් සඳහා ප්‍රධාන වශයෙන් බලපෑම් ඇති කරන ලද්දේ ප්‍රතිපත්ති අනුපාත වෙනස්වීම් සහ වෙළඳපොළ මූලික ක්‍රියාමාර්ගයි.

මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම සහ ද්‍රවශීලතා තත්ත්වයන් වැඩිදියුණු වීමත් සමඟ, පුළුල් මුදල් සැපයුම (M2b) 2025 වසරේ ජනවාරි මස අවසානයේ දී වාර්තා වූ රු. බිලියන 14,439.1 ක සිට 2025 වසරේ ජුනි මස අවසානය වන විට රු. බිලියන 15,175.8 ක් දක්වා ඉහළ ගිය අතර, පෞද්ගලික අංශයේ ණය සැලකිය යුතු ලෙස ඉහළ යාම සහ ශුද්ධ විදේශීය වත්කම් ප්‍රසාරණය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. පෞද්ගලික අංශය වෙත ලැබුණු ණය ප්‍රවාහය, 2025 වසරේ ජනවාරි මස අවසානයේ දී වාර්තා වූ රු. බිලියන 8,151.4 ක සිට 2025 වසරේ ජුනි මස අවසානය වන විට රු. බිලියන 8,856.1 ක් දක්වා ඉහළ ගියේය. විදේශ අංශයේ කාර්යසාධනය වැඩිදියුණුවීම පිළිබිඹු කරමින්, ශුද්ධ විදේශීය වත්කම්, 2025 වසරේ ජනවාරි මස අවසානයේ දී වාර්තා වූ රු. බිලියන 747.4 ක සිට 2025 වසරේ ජුනි මස අවසානය වන විට රු. බිලියන 889.6 ක් දක්වා ඉහළ ගියේය.

1.2 වගුව : මුදල් හා වාණිජ බැංකු විසින් පුද්ගලික අංශයට ලබා දුන් ණය

රු. බිලියන

අයිතමය	2024						2025						
	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජුනි	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජුනි	2025 ජුනි/2024 ජුනි වර්ධනය (%)
සංචිත මුදල්	1,488.6	1,413.7	1,405.6	1,426.5	1,396.2	1,417.7	1,567.0	1,589.6	1,668.6	1,677.7	1,651.1	1,660.1	17.1
පුළුල් මුදල්	13,114.9	13,201.1	13,324.6	13,420.0	13,616.4	13,747.9	14,439.1	14,543.8	14,777.7	14,931.9	14,965.5	15,175.8	10.4
පුද්ගලික අංශයට ලබා දුන් ණය	7,314.2	7,321.5	7,393.4	7,377.2	7,437.9	7,512.4	8,151.4	8,256.9	8,414.6	8,501.6	8,634.6	8,856.1	17.9

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

1.3 වගුව : ප්‍රාග්ධන වෙළඳපොළ කාර්ය සාධනය

දර්ශකය	2021	2022	2023	2024	ජුනි අග වන විට	
					2024	2025
සමස්ත කොටස් මිල දර්ශකය (1985=100)	12,226	8,490	10,594	15,945	12,145	18,027
එස් ඇන්ඩ් පී. එස්. එල්. 20 දර්ශකය	4,233	2,636	3,010	4,862	3,589	5,353
වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන)	5,489	3,847	4,261	5,696	4,760	6,438
වෙළඳපොළ කටයුතු සිදු කරනු ලබන ලැයිස්තුගත සමාගම් ගණන	296	290	290	284	284	284
දෛනික පිරිවැටුම (රු. මිලියන)	4,888	2,972	1,697	2,240	1,777	4,085
විදේශ විකුණුම් (රු. මිලියන)	86,689	36,863	37,088	52,441	36,093	37,999
විදේශ මිලදී ගැනුම් (රු. මිලියන)	39,410	67,488	41,451	42,524	27,069	26,214
ශුද්ධ මිලදී ගැනුම් (රු. මිලියන)	-47,279	30,625	4,363	-9,918	-9,025	-11,785

මූලාශ්‍රය: කොළඹ කොටස් වෙළඳපොළ

1.4 කොටස් වෙළෙඳපොළ

2025 වසරේ පළමු භාගය තුළ දී ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳපොළ ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කරන ලදී. සමස්ත වෙළෙඳපොළ කාර්යසාධනය පිළිබිඹු කරන සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100), 2024 වසරේ ජූනි මස අවසානයේ දී වාර්තා කළ ඒකක 12,145 ට සාපේක්ෂව 2025 වසරේ ජූනි මස අවසානයේ දී ඒකක 18,027 ක් දක්වා සියයට 48.4 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. වඩාත්ම ද්‍රවශීල කොටස් නියෝජනය කරනු ලබන ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ශ්‍රී ලංකා 20 (2004=1,000) දර්ශකය ද, 2024 වසරේ ජූනි මස අග දී වාර්තා වූ ඒකක 3,589 ක සිට 2025 වසරේ ජූනි මස අවසානයේ දී ඒකක 5,353 ක් දක්වා සියයට 49.1 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ශක්තිමත් ආයතනික ක්‍රියාකාරිත්වය, ධනාත්මක ආර්ථික ඉදිරිදැක්ම සහ ලිහිල් මුදල් තත්ත්වයන් හේතුවෙන් දේශීය ආයෝජකයින්ගේ සහභාගීත්වය වැඩි වීම, මෙම ඉහළ යාමේ ප්‍රවණතාවයට ප්‍රධාන වශයෙන් හේතු විය.

කොළඹ කොටස් වෙළෙඳපොළෙහි වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 2024 වසරේ ජූනි මස අග දී වාර්තා වූ රු. බිලියන 4,760 ට සාපේක්ෂව 2025 වසරේ ජූනි මස අග දී රු. බිලියන 6,438 ක් දක්වා සියයට 35.2 කින් වර්ධනය විය. වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයේ මෙම වර්ධනය, ලැයිස්තුගත සමාගම්වල ඉහළ යන වටිනාකම සහ ශ්‍රී ලංකා කොටස් වෙළෙඳපොළ කෙරෙහි ආයෝජකයින්ගේ ඇති ආකර්ෂණය ඉහළ යාම පිළිබිඹු කරයි. තවද, කොළඹ කොටස් වෙළෙඳපොළ සාමාන්‍ය දෛනික පිරිවැටුම, 2024 වසරේ ජූනි මස අවසානයේ දී වාර්තා වූ රු. මිලියන 1,777 ට සාපේක්ෂව, 2025 වසරේ ජූනි මස අවසානයේ දී රු. මිලියන 4,085 ක් දක්වා සියයට 129.8 කින් කැපීපෙනෙන ලෙස වර්ධනය විය. මෙමඟින් කොටස් වෙළෙඳපොළෙහි වෙළෙඳ ක්‍රියාකාරකම්වල සුවිශේෂී ඉහළ යාමක්, වෙළෙඳපොළ ද්‍රවශීලතාවයේ සැලකිය යුතු ප්‍රසාරණයක් සහ ආයෝජකයින්ගේ විශ්වාසය හා සහභාගීත්වයේ වැඩිදියුණු වීමක් පිළිබිඹු වේ.

1.5 විදේශ අංශයේ ප්‍රවණතා

ශ්‍රී ලංකාවේ විදේශ අංශය 2025 වසරේ පළමු භාගයේදී ධනාත්මක ප්‍රවණතාවයක් පෙන්නුම් කළේය. වෙළෙඳ හිඟය පුළුල් වුවද, විදේශ ශ්‍රමික ප්‍රේෂණවලින් ලද ලැබීම් සහ සංචාරක අංශයෙන් ලද ඉපැයීම් වැඩිවීම මෙයට හේතු විය. විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් 2025 වසරේ පළමු භාගයේදී, ඇ. ඩො. මිලියන 3,738.0 ක් දක්වා සියයට 18.9 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, සංචාරක ඉපැයීම් ඇ. ඩො. මිලියන 1,712.6 ක් දක්වා සියයට 10.0 කින් වර්ධනය විය. අපනයන ආදායම ඇ. ඩො. මිලියන 6,492.1 දක්වා සියයට 5.7 කින් වැඩි වීමේ සහ ආනයන වියදම ඇ. ඩො. මිලියන 9,762.2 දක්වා සියයට 12.4 කින් ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳ හිඟය ඇ.ඩො. මිලියන 3,270.1 දක්වා පුළුල් විය. දළ නිල සංචිත 2024 වසරේ ජූනි මස අවසානයේ පැවති ඇ. ඩො. බිලියන 5.7 සිට 2025 වසරේ ජූනි මස අවසානයේ දී ඇ. ඩො. බිලියන 6.1 දක්වා වැඩි විය.

රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළෙහි 2024 වසරේ පළමු භාගයේ දී වූ ඇ.ඩො. මිලියන 198.1 ක ශුද්ධ ගලා යාමට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 90.1 ක ශුද්ධ ගලා ඒමක් වාර්තා විය. කොළඹ කොටස් වෙළඳපොළෙහි 2024 වසරේ පළමු භාගයේදී වූ ඇ. ඩො. මිලියන 19.1 ක ශුද්ධ ලැබීම් වලට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ. ඩො. මිලියන 39.2 ක ශුද්ධ ගලා යාමක් වාර්තා විය. සමස්ත ගෙවුම් ශේෂය 2024 වසරේ පළමු භාගයේදී වූ ඇ. ඩො. මිලියන 1,761.1 ක අතිරික්තයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ. ඩො. මිලියන 522.5 ක අතිරික්තයක් ලෙස වාර්තා විය. 2025 වසරේ ජූනි මස අවසන් වන විට ශ්‍රී ලංකා රුපියල ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව සියයට 2.5 කින් අවප්‍රමාණය විය.

අපනයන

ආර්ථිකය යථා තත්වයට පත් වීම සහ ගෝලීය අවිනිශ්චිත අස්ථාවරත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව හේතුවෙන් කාර්මික හා කෘෂිකාර්මික අපනයනවලින් ලැබුණු ආදායම වැඩිවීමත් සමඟ අපනයන ආදායම 2024 වසරේ පළමු භාගයේදී පැවති ඇ. ඩො. මිලියන 6,144.4 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ. ඩො. මිලියන 6,492.1 ක් දක්වා සියයට 5.7 කින් ඉහළ ගියේය. කාර්මික අපනයන ඉපැයීම් මුළු අපනයන ආදායමෙන් සියයට 77.7 කට දායක වී ඇති අතර, කෘෂිකාර්මික සහ ඛනිජ අපනයන ආදායම් පිළිවෙලින් මුළු අපනයන ආදායමෙන් සියයට 22.0 ක් සහ සියයට 0.2 ක් විය.

රෙදිපිළි හා ඇඟලුම් සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන වලින් ප්‍රධාන වශයෙන් අපනයන ආදායම වැඩිවීම හේතුවෙන් කාර්මික අපනයන ආදායම 2024 වසරේ පළමු භාගයේදී වූ ඇ. ඩො. මිලියන 4,837.2 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ. ඩො. මිලියන 5,044.5 දක්වා සියයට 4.3 කින් වැඩි විය. තේ, පොල් සහ කුළු බඩු අපනයන ආදායම ඉහළ යාමත් සමඟ කෘෂිකාර්මික අපනයන ආදායම 2024 වසරේ පළමු භාගයේදී වූ ඇ. ඩො. මිලියන 1,281.0 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ. ඩො. මිලියන 1,427.5 ක් දක්වා සියයට 11.4 කින් ඉහළ ගියේය. මේ අතර, ඛනිජ අපනයන ආදායම 2024 වසරේ පළමු භාගයේදී වූ ඇ. ඩො. මිලියන 12.4 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ. ඩො. මිලියන 10.1 දක්වා සියයට 18.2 කින් පහත වැටුණි.

ආනයන

ආර්ථික ක්‍රියාකාරකම් පුනර්ජීවනය වීමේ සහ විශේෂයෙන් මෝටර් රථ සඳහා පනවා තිබූ ආනයන සීමාවන් ඉවත් කිරීමේ බලපෑම පිළිබිඹු කරමින් පාරිභෝගික සහ ආයෝජන භාණ්ඩ මත ආනයන වියදම වැඩිවීම හේතුවෙන් ආනයන වියදම 2024 වසරේ පළමු භාගයේදී වූ ඇ. ඩො. මිලියන 8,684.4 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ. ඩො. මිලියන 9,762.2 ක් දක්වා සියයට 12.4 කින් වැඩි විය. පාරිභෝගික, අතරමැදි සහ ආයෝජන භාණ්ඩ සඳහා වන ආනයන වියදම් මුළු ආනයන වියදමෙන් පිළිවෙලින් සියයට 23.7 ක්, සියයට 57.1 ක් සහ සියයට 19.1 ක් විය.

1.4 වගුව : විදේශ වෙළෙඳාම (ජනවාරි - ජුනි 2025)

ඇ.ඩො. මිලියන

අයිතමය	2024	2025	වර්ධනය %
අපනයන	**6,144.4**	**6,492.1**	**5.7**
කෘෂිකාර්මික අපනයන	1,281.0	1,427.5	11.4
තේ	687.0	743.1	8.2
රබර්	11.8	14.7	24.6
පොල්	191.2	248.7	30.1
අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන	391.0	421.0	7.7
කාර්මික අපනයන	4,837.2	5,044.5	4.3
ආහාරපාන සහ දුම්කොළ	312.6	407.6	30.4
රෙදිපිළි සහ ඇඟලුම්	2,408.1	2,605.8	8.2
ඛනිජ තෙල් නිෂ්පාදන	533.1	465.3	-12.7
රබර් නිෂ්පාදන	487.1	453.1	-7.0
යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ	247.1	225.4	-8.8
අනෙකුත් කාර්මික නිෂ්පාදන	849.2	887.3	4.5
ඛනිජ	12.4	10.1	-18.2
අනෙකුත්	13.8	9.9	-28.3
ආනයන	**8,684.4**	**9,762.2**	**12.4**
පාරිභෝගික භාණ්ඩ	1,534.2	2,315.5	50.9
අහාර හා පාන වර්ග	843.6	1,094.5	29.7
අනෙකුත් පාරිභෝගික භාණ්ඩ	690.6	1,221.0	76.8
අතරමැදි භාණ්ඩ	5,634.2	5,575.6	-1.0
ඛනිජ තෙල්	2,209.2	1,995.7	-9.7
පොහොර	47.4	94.1	98.5
රෙදිපිළි සහ රෙදිපිළි උපාංග	1,327.5	1,334.4	0.5
රසායනික නිෂ්පාදන	464.3	488.6	5.2
ප්ලාස්ටික් සහ ඒ ආශ්‍රිත ද්‍රව්‍ය	268.2	298.3	11.2
අනෙකුත් අතරමැදි භාණ්ඩ	1,317.6	1,364.5	3.6
ආයෝජන භාණ්ඩ	1,510.9	1,862.6	23.3
යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	1,020.2	1,208.0	18.4
ප්‍රවාහන උපකරණ	61.3	173.7	183.3
ගොඩනැගිලි ද්‍රව්‍ය	428.3	479.1	11.9
අනෙකුත් ආයෝජන භාණ්ඩ	1.1	1.8	63.6
වර්ග නොකළ ආනයන	5.0	8.5	70.0
වෙළඳ ශේෂය	**-2,540.0**	**-3,270.1**	**28.7**

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

ආහාර හා පාන වර්ග සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා වන ආනයන වියදම වැඩිවීම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ සඳහා වන ආනයන වියදම 2024 වසරේ පළමු භාගයේදී වූ ඇ. ඩො. මිලියන 1,534.2 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ. ඩො. මිලියන 2,315.5 දක්වා සියයට 50.9 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, අතරමැදි භාණ්ඩ සඳහා වන ආනයන වියදම 2024 වසරේ පළමු භාගයේදී වූ ඇ. ඩො. මිලියන 5,634.2 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ. ඩො. මිලියන 5,575.6 දක්වා සියයට 1.0 කින් සුළු වශයෙන් පහත වැටී ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රෙදිපිළි හා රෙදිපිළි උපාංග සඳහා වන වියදම සියයට 0.7 කින්, රසායනික නිෂ්පාදන සඳහා වන වියදම සියයට 5.2 කින් සහ ප්ලාස්ටික් සහ ඒ ආශ්‍රිත භාණ්ඩ සඳහා වන වියදම සියයට 11.2 කින් වැඩි වුවද, ඉන්ධන ආනයන වියදම සියයට 9.7 කින් අඩු වීමයි. පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන වියදම ඇ. ඩො. මිලියන 1,420.3 දක්වා සියයට 7.3 කින් ද, බොරතෙල් ආනයන වියදම ඇ. ඩො. මිලියන 445.9 දක්වා සියයට 11.9 කින් ද, ගල් අඟුරු ආනයන වියදම ඇ. ඩො. මිලියන 129.5 දක්වා සියයට 24.0 කින් ද අඩුවීම හේතුවෙන් 2025

වසරේ පළමු භාගයේදී ඉන්ධන ආනයන වියදම ඇ. ඩො. මිලියන 1,995.7 ක් දක්වා සියයට 9.7 කින් අඩු විය.

ආයෝජන භාණ්ඩ සඳහා වන ආනයන වියදම 2024 වසරේ පළමු භාගයේදී වූ ඇ. ඩො. මිලියන 1,510.9 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ. ඩො. මිලියන 1,862.6 දක්වා සියයට 23.3 කින් වැඩි විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ආර්ථිකයේ පුනර්ජීවනයත් සමඟ ආයෝජන ක්‍රියාකාරකම් වැඩිදියුණු වීම හේතුවෙන් යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සඳහා වන වියදම ඇ. ඩො. මිලියන 1,208.0 ක් දක්වා සියයට 18.4 කින්, ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා වන වියදම ඇ. ඩො. මිලියන 479.1 ක් දක්වා සියයට 11.9 කින් සහ ප්‍රවාහන උපකරණ සඳහා වන වියදම ඇ. ඩො. මිලියන 173.7 ක් දක්වා සියයට 183.3 කින් ද වැඩි වීමයි.

සේවක ප්‍රේෂණ සහ සංචාරක අංශයේ ඉපැයීම්

විධිමත් මාර්ග හරහා සේවක ප්‍රේෂණ ලැබීම හේතුවෙන් 2024 වසරේ පළමු භාගයේදී වූ ඇ. ඩො. මිලියන 3,144.0 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ. ඩො. මිලියන 3,738.0 ක් දක්වා සේවක ප්‍රේෂණ සියයට 18.9 කින් වර්ධනය විය. මේ අතර, සංචාරක අංශය ශක්තිමත් ලෙස සහ විවිධාංගීකරණයකින් යුක්තව සිදු වූ පුනරුදය හේතුවෙන්, සංචාරක ඉපැයීම් 2024 වසරේ පළමු භාගයේදී වූ ඇ. ඩො. මිලියන 1,556.6 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ. ඩො. මිලියන 1,712.6 ක් දක්වා සියයට 10.0 කින් වැඩි විය. ඒ අනුව, සංචාරක පැමිණීම් 2024 වසරේ පළමු භාගයේදී වූ පුද්ගලයින් 1,010,249 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී පුද්ගලයින් 1,168,044 ක් දක්වා සියයට 15.6 කින් වර්ධනය විය. 2025 වසරේ පළමු භාගය තුළ දී වැඩිම සංචාරක පැමිණීම් ඉන්දියාව, රුසියාව, එක්සත් රාජධානිය, ජර්මනිය, චීනය සහ ප්‍රංශය යන රටවලින් වාර්තා වූ අතර දකුණු ආසියාව, යුරෝපය සහ ආසියා-පැසිෆික් කලාපවලින් ඉදිරියේ දී සංචාරක පැමිණීම්හි වර්ධනයක් අපේක්ෂා කෙරේ.

1.5 වගුව : ලෝක තත්ත්වය

	2024				
රට	ද.දේ.නි. වර්ධනය (වාර්ෂික ප්‍රතිශතික වෙනස)	උද්ධමනය (ප්‍රතිශතය)	සේවා වියුක්තිය (ප්‍රතිශතය)	රාජ්‍ය මූල්‍ය ශේෂය (ද.දේ.නි ප්‍රතිශතයක් ලෙස)	දළ ණය (ද.දේ.නි ප්‍රතිශතයක් ලෙස)
ආර්ජන්ටිනාව	-1.7	219.9	7.2	0.9	85.3
ඔස්ට්‍රේලියාව	1.0	3.2	4.0	-2.2	49.8
බ්‍රසීලය	3.4	4.4	6.9	-6.6	87.3
කැනඩාව	1.5	2.4	6.4	-2.1	110.8
චිලී	2.6	3.9	8.5	-2.7	42.0
චීනය	5.0	0.2	5.1	-7.3	88.3
ප්‍රංශය	1.1	2.3	7.4	-5.8	113.1
ජර්මනිය	-0.2	2.5	3.4	-2.8	63.9
ග්‍රීසිය	2.3	3.0	10.1	-0.3	150.9
ඉන්දියාව	6.5	4.7	4.9	-7.4	81.3
ඉන්දුනීසියාව	5.0	2.3	4.9	-2.3	40.2
ඉතාලිය	0.7	1.1	6.6	-3.4	135.3
ජපානය	0.1	2.7	2.6	-2.5	236.7
කොරියාව	2.0	2.3	2.8	-0.6	52.5
මැලේසියාව	5.1	1.8	3.2	-4.0	70.4
මෙක්සිකෝව	1.5	4.7	2.7	-5.7	58.4
රුසියාව	4.1	8.4	2.5	-2.2	20.3
සිංගප්පූරුව	4.4	2.4	2.0	4.4	174.3
දකුණු අප්‍රිකාව	0.6	4.4	32.8	-6.1	76.4
ස්පාඤ්ඤය	3.2	2.9	11.3	-3.2	101.8
ශ්‍රී ලංකාව	5.0	1.2	4.4	-6.8	96.1
තායිලන්තය	2.5	0.4	1.0	-1.3	63.2
එක්සත් රාජධානිය	1.1	2.5	4.3	-5.7	101.2
එක්සත් ජනපදය	2.8	3.0	4.0	-7.3	120.8
වියට්නාමය	7.1	3.6	2.2	-1.6	32.9
වෙනිසියුලාව	5.3	49.0	…	-3.6	164.3

මූලාශ්‍රය: "World Economic Outlook", ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, අප්‍රේල් 2025
… ලැ.නො.

1.6 ගෝලීය ආර්ථික ප්‍රවණතා[2]

2025 වසරේ පළමු භාගයේ දී ගෝලීය ආර්ථිකය කෙරෙහි පෙර වසරේ දී බලපෑ අභියෝග තරමක් ලිහිල් වීමක් පෙන්නුම් කරන ලදී. දැඩි මූල්‍ය කොන්දේසි, පෙර පැවති සැපයුම් කම්පනවල ක්‍රමයෙන් ලිහිල් වන බලපෑම් සහ ආර්ථිකයන් කිහිපයක තවමත් ඉහළ මට්ටමක පවතින ණය ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි සෘණ බලපෑමක් ඇති කළ ද, පරිභෝජනය සහ සේවාවන්හි ප්‍රධාන අංශවල ඔරොත්තු දීමේ හැකියාව වර්ධනයට සහාය විය. පෙර වසර වල දී මූල්‍ය ප්‍රතිපත්ති දැඩි කිරීමේ බලපෑම වැඩි ලෙස දැනීමත් සමඟ ගෝලීය උද්ධමනය එක් එක් කලාපය හරහා අසමාන ලෙස වුවද අඛණ්ඩව පහත වැටුණි. ඇතැම් සැපයුම් දාම බාධාවන් හේතුවෙන් බලශක්ති හා ආහාර වෙළෙඳපොළ මිල අස්ථාවර වුවද, පෙර වසරවලදී ළඟා වූ උපරිමයට සාපේක්ෂව පාරිභෝගික භාණ්ඩ වෙළෙඳපොළ ක්‍රමයෙන් මධ්‍යස්ථ මට්ටමකට ළඟා විය. ඒ අතරම, සැපයුම් දාම වැඩිදියුණු වීම සහ දියුණු ආර්ථිකයන් සහ ඇතැම් නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි ඉල්ලුම යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් ගෝලීය වෙළඳාම 2023-2024 වසර වල දී වාර්තා වූ මන්දගාමී වර්ධනයෙන් මිදී යළි යථා තත්ත්වයට පත්වීමේ සලකුණු පෙන්නුම් කරන ලදී. මූල්‍ය තත්ත්වයන් දැඩිව පැවතියද, දියුණු ආර්ථිකයන්හි මූල්‍ය ප්‍රතිපත්ති නුදුරේ දී ලිහිල් කරනු ඇතැයි යන අපේක්ෂාව නිර්-උද්ධමන තත්ත්වයන් හේතුවෙන් තවදුරටත් ශක්තිමත් වීම වෙළෙඳපොළ අපේක්ෂාවන් ඉහළ යෑමට හේතු විය.

ගෝලීය වර්ධනය

2024 වසරේ දී ගෝලීය නිෂ්පාදනය සියයට 3.2 කින් පමණ වර්ධනය වනු ඇතැයි ඇස්තමේන්තු කර තිබූ අතර 2025 වසරේ දී එය බොහෝ දුරට නොවෙනස්ව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉහළ පොලී අනුපාතික පසුගාමී බලපෑම හමුවේ දේශීය ඉල්ලුම සහ ආයෝජන පහත වැටීම හේතුවෙන් දියුණු ආර්ථිකයන්හි වර්ධනය තරමක් හීන විය. පරිභෝජනය සහ ආයෝජන ශක්තිමත්ව පැවතීම හේතුවෙන් එක්සත් ජනපදය සාපේක්ෂව ශක්තිමත් වර්ධනයක් පවත්වා ගෙන ගිය අතර දුර්වල කාර්මික නිෂ්පාදනය සහ ඉල්ලුම අඩු මට්ටමක පැවතීම හේතුවෙන් මධ්‍යම යුරෝ කලාපයේ වර්ධනය අඩු විය. පශ්චාත් වසංගත ප්‍රතිසාධන බලපෑම් වියැකී ගියද ජපානයේ වර්ධනයේ වේගය අඩු විය.

නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් තුළ වර්ධනය මිශ්‍ර ස්වභාවයක් පෙන්නුම් කරන ලදී. විශාල ආසියානු ආර්ථිකයන් කිහිපයක ශක්තිමත් වර්ධනය හේතුවෙන් වෙළෙඳ පීඩනයන්ට මුහුණ දුන් ඇතැම් වෙළෙඳ භාණ්ඩ අපනයනකරුවන්ගේ මන්දගාමී ක්‍රියාකාරිත්වය හිලව් විය. දේපල වෙළඳාම් අංශයේ සහ ජන විකාශනයේ ව්‍යුහාත්මක අභියෝග හමුවේ දේපල වෙළෙඳපොළ ස්ථාවර කිරීම සහ දේශීය පරිභෝජනය උත්තේජනය කිරීම සඳහා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීම හරහා චීන ආර්ථිකය මධ්‍යස්ථ ලෙස වර්ධනය විය. 2026 වසරේ දී නිර්-උද්ධමනය හේතුවෙන් වඩාත් ලිහිල් මූල්‍ය ප්‍රතිපත්ති සඳහා ඉඩ සැළසීම සහ ආයෝජන ක්‍රියාකාරකම් වැඩි දියුණු වීම හරහා ගෝලීය වර්ධනය ක්‍රමයෙන් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කරන නමුත් ගෝලීය වර්ධනය පිළිබඳ මධ්‍යකාලීන පුරෝකථන ඓතිහාසික සාමාන්‍යයට වඩා අඩු මට්ටමක පැවතුනි.

උද්ධමනය

2025 වසරේ පළමු භාගයේදී උද්ධමන පීඩනය තවදුරටත් අඩු විය. ආහාර හා බලශක්ති මිල අඩු වීම සහ පෙර පැවති සැපයුම්දාම බාධා පහව යෑම හේතුවෙන් ගෝලීය මතුපිට උද්ධමනය වඩාත් පහත වැටී ඇත. ඇතැම් දියුණු ආර්ථිකයන්හි සේවා මිල ගණන් සහ වැටුප් නොවෙනස්ව ඉහළව පැවතීම හේතුවෙන් මන්දගාමී වේගයකින් වුවද මූලික උද්ධමනය ද පහත වැටුණි. දියුණු ආර්ථිකයන් තුළ උද්ධමනය මහ බැංකු ඉලක්ක කරා ළඟා වූ අතර, මුදල් ඒකක අවප්‍රමාණය වීම සහ දේශීය සැපයුම සීමාවීම හේතුවෙන් නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් කිහිපයක උද්ධමනය අපේක්ෂිත මට්ටමට වඩා ඉහළින් පැවතුණි.

ඒ අනුව, 2026 වසරේ දී බොහෝ ආර්ථිකයන්හි මතුපිට උද්ධමනය ඉලක්කගත පරාසයන් කරා පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. නිර්-උද්ධමන ක්‍රියාවලියට ඇති අවදානම් අතර උග්‍ර භූ-දේශපාලනික හා වෙළඳ ආතතීන්, තෙල් සැපයුමට ඇති විය හැකි බාධා සහ ඵලදායිතාව ඉක්මවා යන අඛණ්ඩ වැටුප් වර්ධනය ඇතුළත් වේ.

පාරිභෝගික භාණ්ඩ වෙළෙඳපොළ

2022 සහ 2023 වසර වලදී නිරීක්ෂණය කරන ලද අස්ථාවරත්වයට සාපේක්ෂව පාරිභෝගික භාණ්ඩ මිල වර්ධනය අඩු විය. 2025 වසරේ පළමු භාගයේදී ප්‍රමාණවත් සැපයුම් තත්ත්වයන් සහ දුර්වල ගෝලීය ඉල්ලුම හමුවේ ජාත්‍යන්තර තෙල් මිල අඩු විය. කෙසේ වෙතත්, ප්‍රධාන නිෂ්පාදන කලාපවල ගැටුම් වරින් වර සැපයුම්දාම පිළිබඳ අවිනිශ්චිතතාවයන් ඇති කළ බැවින් ජාත්‍යන්තර තෙල් මිල අස්ථාවරව පැවතුනි. ඉහළ තෙල් තොග පවත්වා ගැනීම සහ සැපයුම් ප්‍රභවයන් විවිධාංගීකරණය කිරීම හේතුවෙන් යුරෝපයේ ස්වාභාවික ගෑස් මිල පහත වැටුණි.

ආහාර නිෂ්පාදනය කරනු ලබන ප්‍රධාන රටවල් කිහිපයක අස්වැන්න ඉහළව පැවතීම හේතුවෙන් ආහාර භාණ්ඩ මිල අඩු විය. දේශගුණික විපර්යාස හේතුවෙන් හටගත් කාලගුණික කම්පන කෙටිකාලීන උච්චාවචනයන් ඇති කළද, ධාන්‍ය සැපයුම ඉහළ යාමෙන් ගෝලීය ආහාර වෙළෙඳපොල පීඩන සමනය විය. පුනර්ජනනීය බලශක්තිය සහ විදුලි

---

2. *World Economic Outlook Update (2025 ජූලි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල) සහ External sector report (2025 ජූලි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල) මත පදනම්ව ඇත.*

වාහන නිෂ්පාදනය සඳහා අත්‍යවශ්‍ය ඛනිජ සඳහා ඇති ඉල්ලුම හේතුවෙන් ලෝහ මිල වඩාත් ස්ථාවරත්වයක් පෙන්නුම් කළද ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පැවති දුර්වලතා හේතුවෙන් ඇතැම් කලාප තුළ ඉල්ලුම අඩු විය.

1.7 ගෝලීය වෙළෙඳාම

ගෝලීය වෙළඳ පරිමාව 2023 වසරේ දී තීව්‍ර ලෙස අඩු වීමෙන් පසුව, 2024 වසරේ අග භාගයේ සිට 2025 වසරේ පළමු භාගය දක්වා විහිදෙන ලෙස යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කරයි. නාවික පිරිවැය අඩු වීම සහ සැපයුම්දාම කාර්යක්ෂමතාව වැඩි දියුණු වීම හේතුවෙන් නිෂ්පාදන වෙළඳ ප්‍රවාහයන් පුළුල් විය. දියුණු ආර්ථිකයන්හි ඉල්ලුම යථා තත්ත්වයට පත්වීමට සමගාමීව ආසියාව තුළ පාරිභෝගික විදුලි උපාංග සහ කාර්මික යෙදවුම් සඳහා ඉල්ලුම නොවෙනස්ව පැවතීම ගෝලීය වෙළදාමට ධනාත්මකව බලපෑමක් ඇති කර තිබේ. කෙසේ වෙතත්, එක්සත් ජනපදය විසින් පනවා ඇති තීරුබදු වැනි ආරක්ෂණවාදී ප්‍රතිපත්ති, භූ-දේශපාලනික ඛණ්ඩනයන් සහ ඇතැම් යුරෝපා සහ ලතින් ඇමරිකානු කලාපීය රටවල අපේක්ෂිත මට්ටමට අඩු වර්ධනය හේතුවෙන් දේශසීමා හරහා සිදු කෙරෙන වෙළදාම අඛණ්ඩ අභියෝගයන්ට මුහුණපා ඇත.

විශේෂයෙන් සංචාරක හා ඩිජිටල් සේවා සැපයීම වැනි සේවා වෙළදාම නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් තුළ විදේශීය අංශයේ ක්‍රියාකාරකම් පවත්වා ගැනීම සඳහා සහාය විය. ඉදිරියේදී, ගෝලීය ආයෝජන අඩු වීම සහ ප්‍රතිපත්තිමය අවිනිශ්චිතතාවයන් හමුවේ ලෝක වෙළෙඳාම යථා තත්ත්වයට පත්වීම මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

1.6 වගුව : ජාත්‍යන්තර භාණ්ඩ මිළ ගණන්

අයිතමය	ඒකකය	තත්‍ය		ඇස්තමේන්තු	
		2023	2024	2025	2026
බලශක්ති					
ගල් අඟුරු ඔස්ට්‍රේලියාව	මෙ.ටො/ඩොලර්	172.8	136.1	100.0	95.0
බොරතෙල් සාමාන්‍ය	බැරලයට ඩොලර්	82.6	80.7	64.0	60.0
ස්වාභාවික වායු එක්සත් ජනපද	මෙට්‍රික් බ්‍රිතාන්‍යය තාප ඒකක මිලියනයකට/ ඩොලර්	2.5	2.2	3.3	3.4
බලශක්ති නොවන					
කෘෂිකාර්මික					
පාන වර්ග					
කොකෝවා	කිලෝග්‍රෑමයට ඩොලර්	3.28	7.33	8.00	7.00
කෝපි, රොබොස්ටා	කිලෝග්‍රෑමයට ඩොලර්	2.63	4.41	5.50	5.00
තේ	කිලෝග්‍රෑමයට ඩොලර්	2.74	3.04	2.50	2.80
ආහාර					
මේද සහ තෙල්					
පාම් තෙල්	මෙ.ටො/ඩොලර්	886	963	1,020	1,040
සෝයා පිටි	මෙ.ටො/ඩොලර්	541	442	370	369
සෝයා බෝංචි	මෙ.ටො/ඩොලර්	598	462	382	386
ධාන්‍ය					
බඩඉරිඟු	මෙ.ටො/ඩොලර්	253	191	187	183
සහල්	මෙ.ටො/ඩොලර්	554	588	421	422
තිරිඟු	මෙ.ටො/ඩොලර්	340	269	263	260
අනෙකුත් ආහාර					
සීනි	කිලෝග්‍රෑමයට ඩොලර්	0.52	0.45	0.44	0.43
අමුද්‍රව්‍ය					
කපු	කිලෝග්‍රෑමයට ඩොලර්	2.09	1.91	1.65	1.70
රබර්	කිලෝග්‍රෑමයට ඩොලර්	1.38	1.75	2.00	1.90
ඉරූ දැව,අරටු සහිත ලී	ඝන මීටරයට ඩොලර්	678	697	690	700
ලෝහ සහ ඛනිජ වර්ග					
ඇලුමිනියම්	මෙ.ටො/ඩොලර්	2,256	2,419	2,175	2,100
තඹ	මෙ.ටො/ඩොලර්	8,490	9,142	8,200	8,000
නිකල්	මෙ.ටො/ඩොලර්	21,521	16,814	15,800	16,000

මූලාශ්‍රය: Commodity Markets Outlook - අප්‍රේල් 2025

1.8 මුදල් හා මූල්‍ය අංශය

උද්ධමනය ඉලක්ක කරා තිරසාර ලෙස පහත වැටීම සහතික කිරීම සඳහා බොහෝ දියුණු ආර්ථිකයන්හි මහ බැංකු පොලී අනුපාත තවදුරටත් ඉහළ මට්ටමක පවත්වා ගැනීම හේතුවෙන් 2025 වසරේ මුල් භාගයේදී මුදල් හා මූල්‍ය තත්වයන් දැඩිව පැවතුණි. නිර්-උද්ධමනය පිළිබඳ පැහැදිලි ප්‍රගතියක් නිරීක්ෂණය වුවද, සැපයුම් කම්පන සහ වැටුප් ප්‍රවණතා හේතුවෙන් උද්ධමනය ඉහළ යාමේ අවදානම ගැන සැලකිලිමත් වෙමින් මූල්‍ය බලධාරීන් ප්‍රතිපත්ති අනුපාත අඩු කිරීමේ දී සුපරික්ෂාකාරී විය.

2025 වසරේ අග භාගයේ දී මූල්‍ය තත්ත්වයන් ලිහිල් වනු ඇතැයි යන්න සනිටුහන් කරමින්, කොටස් වෙළෙඳපොළ ලාභාංශ වාර්තා කරමින් සහ ණය ව්‍යාප්තිය අඩු කරමින් මූල්‍ය වෙළෙඳපොළ ආයෝජකයන්ගේ විශ්වාසය වැඩි දියුණු කිරීමට සහාය විය. ප්‍රධාන ආර්ථිකයන්හි භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතික ඉහළ මට්ටමක පැවතුන නමුත් උද්ධමන අපේක්ෂාවන් පහත වැටීමට ප්‍රතිචාර වශයෙන් ස්ථාවර වීමට පටන් ගත්තේය. විදේශ මූල්‍යකරණ අවශ්‍යතා ඉහළ රටවල පසුබෑමක් පෙන්නුම් කළද, ආයෝජකයන්ගේ විශ්වාසය වැඩි දියුණු වීම, නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් සඳහා ධනාත්මක ලෙස බලපෑ අතර, එහි ප්‍රතිපලයක් ලෙස ස්වෛරීත්ව පොළී අනුපාත අඩු වී විවිධ ආයෝජන ප්‍රවාහ ගලා ඒම් වැඩි විය.

පෙර වසරවලට සාපේක්ෂව ගෝලීය මූල්‍ය අවදානම් අඩු වුවද, ඉහළ ප්‍රාග්ධන තෝලන අනුපාත, ඇතැම් විශාල ආර්ථිකයන්හි දේපල වෙළෙඳපොළ විචලන සහ ඇතැම් නැගී එන සහ අඩු ආදායම්ලාභී රටවල ස්වෛරී ණය පීඩනය වැනි අවදානම් තවදුරටත් පවතී. ගෝලීය මූල්‍ය තත්ත්වය සුමටව පවත්වා ගැනීම මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කිරීම සුපරික්ෂාකාරීව නිශ්චය කිරීම සහ ණය දුර්වලතා අවම කිරීම සහ මනා සහයෝගීතාවයකින් ක්‍රියා කිරීම මත තවදුරටත් රඳා පවතී.

2 වන පරිච්ඡේදය

රාජ්‍ය මූල්‍ය ප්‍රවණතා

2.1 සමාලෝචනය

2025 වසරේ පළමු භාගය තුළ, ආදායම් පදනම් කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය, දූෂණ විරෝධී ප්‍රයත්නයන් සහ යථා තත්ත්වයට පත් වූ සාර්ව ආර්ථික ස්ථාවරත්වය මඟින් සහාය ලබමින්, ආදායම් එක් රැස් කිරීම ශක්තිමත් වීම තුළින් රාජ්‍ය මූල්‍ය අංශය සිය සාධනීය වර්ධනය නැවත ලඟා කර ගැනීමට සමත් විය. දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5.1 කට ආසන්න අගයක් ගනිමින් එනම් බදු ආදායම දළ දේශිය නිෂ්පාදිතයට දක්වන අනුපාතය 2022 වසරේ දී වූ සියයට 7.3 සිට 2024 වසරේ දී සියයට 12.4 දක්වා වර්ධනය වෙමින් 2022-2024 කාලය තුළ සිදු කරන ලද ආදායම් පදනම් කරගත් රාජ්‍ය මූල්‍ය ගැලපීම් වර්තමානයේ දී ඵල දරමින් පවති. සාධාරණ සහ වර්ධනයට හිතකර රාජ්‍ය මූල්‍ය ගැලපීම් තහවුරු කිරීම පිණිස තිරසාර ආදායම් ප්‍රවාහයක් ස්ථාපනය කිරීම සඳහා රජය කටයුතු කරමින් සිටියි. මේ සඳහා, අනෙකුත් කරුණු අතර, වියදම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, ප්‍රමුඛතා ව්‍යාපෘති සඳහා ප්‍රාග්ධන වියදම් ඉහළ නැංවීම සහ සෘජු බදුවල දායකත්වය ඉහළ නැංවීම, සමාජ ආරක්ෂණ වැඩසටහන් ඉලක්කගත කිරීම සහ බදු පරිපාලනය ඩිජිටල්කරණය කිරීම ආදිය ඇතුළත් වේ.

අඛණ්ඩව රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය තහවුරු කිරීමේ ප්‍රයත්නයන් පිළිබිඹු කරමින්, 2024 වසරේ පළමු භාගය තුළ වාර්තා වූ රු. බිලියන 543.4 ක ප්‍රාථමික අතිරික්තයට සාපේක්ෂව, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු.බිලියන 859.0 ක ප්‍රාථමික අතිරික්තයක් වාර්තා කරන ලදී. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම ආදායම ඉහළ යාම සහ ප්‍රාග්ධන වියදම් අඩු වීම හේතු විය. මෙය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ 2025 වසරේ පළමු භාගය සඳහා ප්‍රාථමික අතිරික්ත ඉලක්කය ලෙස නියම කර තිබූ රු. බිලියන 130 ක ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායකය (QPC) අභිබවා යන ලදී. අයවැය හිඟය 2024 වසරේ පළමු භාගය තුළ පැවැති රු. බිලියන 598.7 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 405.6 දක්වා රු. බිලියන 193.1 කින් අඩු විය.

බදු සහ බදු නොවන ආදායම් සහ ප්‍රදාන ඇතුළු රජයේ සමස්ත ආදායම 2024 වසරේ පළමු භාගය තුළ පැවති රු. බිලියන 1,864.6 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 2,325.1 දක්වා සියයට 24.7 කින් එනම් රු. බිලියන 460.5 කින් වර්ධනය වී ඇති අතර, එය රු බිලියන 4,990.0 ක් වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 46.6 ක ආදායම් ලඟා කර ගැනීමකි. බදු ආදායම 2024 වසරේ පළමු භාගය තුළ පැවැති රු. බිලියන 1,709.3 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 2,152.1 දක්වා සියයට 25.9 කින් වර්ධනය වී ඇති අතර, එය රු. බිලියන 4,590.0 ක් වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 46.9 ක ලඟා කර ගැනීමකි. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම, ප්‍රතිපත්ති පාදක ලද ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය තහවුරු කිරීමේ පියවරයන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමේ පූර්ණ බලපෑම තහවුරු වීම, වැඩි දියුණු කළ ආදායම් පරිපාලනය, ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීම සහ වාහන ආනයනය කිරීමේ තහනම ඉවත් කිරීම ඇතුළු ආනයන සීමාවන් ඉවත් කිරීම ආදිය හේතු විය.

ආදායම් බදුවලින් ලැබෙන ආදායම 2025 වසරේ පළමු භාගය තුළ දී රු. බිලියන 488.5 දක්වා සියයට 9.2 කින් වර්ධනය වී ඇති අතර, එය රු. බිලියන 1,167.0 ක වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 41.9 ක ආදායම් ලඟා කර ගැනීමකි. මෙම ආදායම් වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ පුද්ගල සහ සංස්ථාපිත ආදායම් බද්දෙන් ලැබෙන ආදායම 2024 වසරේ පළමු භාගයේ දී වූ රු. බිලියන 359.9 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 402.4 දක්වා රු. බිලියන 42.5 කින් වර්ධනය වීමය.

භාණ්ඩ හා සේවා මත බද්දෙන් ලද ආදායම 2024 වසරේ පළමු භාගය තුළ වූ රු. බිලියන 1,043.9 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,365.2 දක්වා සියයට 30.8 කින් වර්ධනය විය. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ එකතු කළ අගය මත බද්දෙහි බදු අනුපාත ඉහළ නැංවීම, මෝටර් රථ සඳහා එකතු කළ අගය මත බදු පැනවීම, බදු සඳහා ලියාපදිංචි වීමේ සීමාව පහත හෙළීම, බදු නිදහස් කිරීම් විශාල වශයෙන් ඉවත් කිරීම, මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම් එකතු කිරීම ඉහළ යාම සහ ආනයන සීමාවන් ඉවත් කිරීම තුළින් එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම ඉහළ යාමයි. මෙම ආදායම් වර්ධනය සඳහා 2025 වසරේ පෙබරවාරි මස 01 වන දින සිට වාහන ආනයනය සම්පූර්ණයෙන්ම යථා තත්ත්වයට පත් වීම හේතුවෙන් මෝටර් රථ මත වන නිෂ්පාදන බද්දෙන් ලද ආදායමේ සැළකිය යුතු ලෙස වර්ධනය වීම සහ සමාජ ආරක්ෂණ දායකත්ව බදු සඳහා ලියාපදිංචි වීමේ සීමාව පහත හෙළීම හේතුවෙන් එම බද්දෙන් ලද ආදායම ඉහළ යාම ආදිය හේතු විය.

ආනයන සීමාවන් ඉවත් කිරීම හේතුවෙන් ආනයන මඟින් ලද බදු ආදායම ඉහළ යාම පිළිබිඹු කරමින්, විදේශ වෙළෙඳාම මත පනවන ලද බදුවලින් ලැබෙන ආදායම, 2024 වසරේ පළමු භාගය තුළ වූ රු. බිලියන

218.2 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 298.4 දක්වා සියයට 36.8 කින් වර්ධනය විය. විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම රු. බිලියන 77.6 දක්වා සියයට 70.5 කින් වර්ධනය විය. මෙම ආදායම් වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම ලූණු හා සහල් ආනයනය මඟින් රු. බිලියන 10 ක පමණ දායකත්වයක් ලැබීම සහ වෙළෙඳ භාණ්ඩ ආනයන පරිමාව ඉහළ යාම ආදිය හේතු විය. රේගු ආනයන බද්දෙන් ලද ආදායම රු. බිලියන 94.0 දක්වා සියයට 92.7 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම මෝටර් රථ ආනයනය සඳහා අදාළ රේගු ආනයන බද්ද මත සියයට 20 ක සහ සියයට 50 ක අධිභාරයක් පැනවීම සහ වාහන ආනයනය ඉහළ යාම ආදිය හේතු විය. සෙස් බද්ද මඟින් ලද ආදායම රු. බිලියන 41.5 දක්වා සියයට 9.3 කින් සුළු වශයෙන් වර්ධනය විය. වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද මඟින් ලද ආදායම සියයට 0.7 කින් සුළු වශයෙන් අඩු විය.

බදු නොවන ආදායම 2024 වසරේ පළමු භාගය තුළ වූ රු. බිලියන 151.3 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 169.6 දක්වා සියයට 12.1 කින් සුළු වශයෙන් වර්ධනය විය. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ දඩ, ගාස්තු සහ අය කිරීම්, පොලී ආදායම සහ සමාජ ආරක්ෂණ දායකත්වය මඟින් ලැබෙන ආදායම ඉහළ යාමයි.

2.1 වගුව : අයවැය සාරාංශය (2025 ජන. - ජූනි)

රු. මිලියන

අයිතමය	2024	2025 (අ)
ආදායම් හා ප්‍රදාන	**1,864,607**	**2,325,104**
ආදායම	1,860,632	2,321,719
බදු ආදායම	1,709,305	2,152,087
බදු නොවන ආදායම	151,327	169,632
ප්‍රදාන	3,975	3,385
වියදම	**2,463,305**	**2,730,707**
පුනරාවර්තන	2,218,442	2,506,828
පොලී ගෙවීම්	1,142,105	1,264,591
අනෙකුත්	1,076,337	1,242,237
රාජ්‍ය ආයෝජන	258,306	228,064
අනෙකුත්	-13,443	-4,185
ජංගම ගිණුමේ අතිරික්තය (+) හිඟය (-)	**-357,810**	**-185,109**
ප්‍රාථමික අතිරික්තය (+) හිඟය (-)	543,407	858,988
සමස්ත අයවැය අතිරික්තය (+) හිඟය (-)	**-598,698**	**-405,603**
මූල්‍යනය	**598,698**	**405,603**
විදේශීය මූල්‍යනය	**82,885**	**-120,042**
ණය ගැනීම්	167,131	137,715
ණය ආපසු ගෙවීම්	-84,246	-257,757
දේශීය මූල්‍යනය	515,814	525,645
ණය ගැනීම්	1,069,398	1,312,750
ණය ආපසු ගෙවීම්	-553,585	-787,104

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

රජයේ වියදම 2025 වසරේ පළමු භාගය තුළ දී රු. බිලියන 2,730.7 දක්වා සියයට 10.9 කින් සුළු වශයෙන් වැඩි විය. 2025 වසරේ පළමු භාගය තුළ සමස්ත වියදමෙන් සියයට 91.8 ක් පමණ වූ පුනරාවර්තන වියදම, 2024 වසරේ පළමු භාගය තුළ වූ රු. බිලියන 2,218.4 සිට රු බිලියන 2,506.8 දක්වා සියයට 13.0 කින් වැඩි විය. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ පොලී වියදම් සියයට 10.7 කින් ඉහළ යාමය. එය 2024 වසරේ පළමු භාගය තුළ පැවති රු. බිලියන 1,142.1 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,264.6 දක්වා වර්ධනය වී ඇති අතර, එය සමස්ත ආදායමෙන් සියයට 54.5 ක් පමණ වේ. පොලී අනුපාත අඩු කිරීම සහ අඩු උද්ධමනය හේතුවෙන් 2024 වසරට සාපේක්ෂව පොලී අනුපාත අඩු වී තිබුණද, පොලී වියදම් ඉහළ යාම මඟින් පූර්ව අර්බුද සමයේ සිට පැවත එන ඉහළ ණය ප්‍රමාණය පිළිබිඹු වන අතර, එය ණය සේවාකරණ පිරිවැය සඳහා ද අඛණ්ඩව බලපානු ඇත. වැටුප් සහ වේතන 2024 වසරේ පළමු භාගය තුළ පැවැති රු. බිලියන 480.3 සිට 2025 වසරේ

සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 555.1 දක්වා සියයට 15.6 කින් වැඩි විය. මෙය බොහෝ දුරට 2025 වසරේ අප්‍රේල් මස 1 වන දා සිට ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය අංශයේ මූලික වැටුප් සංශෝධනයේ බලපෑම පිළිබිඹු කරයි. සහනාධාර සහ පැවරුම් සඳහා වන වියදම 2024 වසරේ පළමු භාගය තුළ පැවති රු. බිලියන 449.3 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 530.7 දක්වා සියයට 18.1 කින් වැඩි වී ඇති අතර, එය පුනරාවර්තන වියදමෙන් සියයට 21.2 ක් නියෝජනය කරනු ලබයි.

ප්‍රාග්ධන අයවැය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම 2024 වසරේ පළමු භාගය තුළ පැවැති රු. බිලියන 244.9 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 223.9 දක්වා සියයට 8.6 කින් අඩු විය. 2025 වසරේ පළමු මාස තුන සඳහා වියදම් ආවරණය කිරීම පිණිස 2024 වසරේ දෙසැම්බර් මස 6 වන දින අතුරු සම්මත ගිණුමක් පමණක් අනුමත කරන ලද බැවින්, 2025 වසරේ පළමු මාස තුන තුළ ප්‍රාග්ධන වියදම් බොහෝ දුරට සීමා විය. 2025 වසරේ අයවැය ප්‍රමාද වී ආරම්භ කිරීම හේතුවෙන්, 2025 වසරේ මාර්තු මස 21 වන දින 2025 අංක 03 දරන විසර්ජන පනත අනුමත කිරීමෙන් පසු ප්‍රාග්ධන වියදම් නැවත ආරම්භ කළද, වසරේ පළමු අර්ධය තුළ ප්‍රාග්ධන වියදම් 2024 සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව අඩු විය.

2.2 වගුව : ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම සහ වියදම (2025 ජන. - ජූනි)

රු. බිලියන

අයිතමය		ඇස්තමේන්තුගත (වාර්ෂික)	තාවකාලික (ජන.-ජූනි.)	සාධනය (%)
මුළු ආදායම සහ ප්‍රදාන		**4,990**	**2,325**	**46.6**
මුළු ආදායම		**4,960**	**2,322**	**46.8**
	බදු ආදායම	4,590	2,152	46.9
	බදු නොවන ආදායම	370	170	45.8
	ප්‍රදාන	30	3	11.3
මුළු වියදම		**7,190**	**2,731**	**38.0**
	වර්තන වියදම	5,886	2,507	42.6
	ප්‍රාග්ධන වියදම සහ ශුද්ධ ණයදීම්	1,304	224	17.2

මූලාශ්‍ර : ජාතික අයවැය දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

2.2 රාජ්‍ය ආදායම

2025 වසරේ පළමු භාගය තුළ ප්‍රදාන ඇතුළත් නොවන සමස්ත රාජ්‍ය ආදායම 2024 වසරේ එම කාලසීමාවට වාර්තා වූ රු. බිලියන 1,860.6 ට සාපේක්ෂව රු. බිලියන 2,321.7 ක් දක්වා සියයට 24.8 කින් ඉහළ යන ලදී. 2025 වසරේ පළමු භාගය තුළ බදු ආදායම 2024 වසරේ වූ රු. බිලියන 1,709.3 ට සාපේක්ෂව රු. බිලියන 2,152.1 දක්වා සියයට 25.9 ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

බදු ආදායමේ මෙම ඉහළ යෑමට පහත කරුණු ප්‍රධාන වශයෙන් හේතු විය.

1. මෝටර් රථ සඳහා වූ නිෂ්පාදන බදු ආදායම සියයට 335.6 කින්, එනම් රු. බිලියන 99.5 කින් වර්ධනය වී ඇත. ඒ සඳහා 2025 වසරේ පෙබරවාරි මාසයේ සිට සියලු වර්ගයේ මෝටර් රථ සඳහා ආනයන සීමා ලිහිල් කිරීම තුළින් 2025 වසරේ ජනවාරි සිට ජූනි දක්වා කාලය තුළ මෝටර් රථ ආනයනය, මෝටර් රථ 126,829 දක්වා සියයට 361 කින් වැඩි වීම මෙන්ම 2025 වසරේ ජනවාරි 11 දින සිට ක්‍රියාත්මක වන පරිදි උද්ධමනයට අනුකූල දර්ශක ගත කිරීම අනුව මෝටර් රථ සඳහා වන නිෂ්පාදන බදු අනුපාත සියයට 5.9 කින් වැඩි කිරීම ප්‍රධාන වශයෙන් හේතු විය.

2. එකතු කළ අගය මත බදු ආදායම සියයට 27.6 කින්, එනම් රු. බිලියන 170.4 කින් වර්ධනය වී ඇත. මෙය, 2025 වසරේ පෙබරවාරි මාසයේ සිට සියලු වර්ගයේ මෝටර් රථ සඳහා ආනයන සීමා ලිහිල් කිරීම හේතුවෙන් ආනයන මත එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 354.0 දක්වා සියයට 34.3 කින් ඉහළ යාම සහ දේශීය ක්‍රියාකාරකම් හි වර්ධනය, එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට 18 දක්වා ඉහළ නැංවීමේ සහ වාර්ෂික එකතු කළ අගය මත බදු ලියාපදිංචි කිරීමේ සීමාව රු. මිලියන 80 සිට රු. මිලියන 60 දක්වා අඩු කිරීමේ පූර්ණ බලපෑම, සහ පරිපාලනමය ක්‍රියාමාර්ග හේතුවෙන් දේශීය එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 433.4 දක්වා සියයට 22.6 කින් වැඩි වීම සිදුවිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2024 වසරේ පළමු මාස හයට සාපේක්ෂව 2025 වසරේ පළමු භාගයේ දී එකතු කළ අගය මත බදු ලියාපදිංචි කිරීම් සියයට 44.2 කින් ගොනු 27,261ක් දක්වා වැඩි වී ඇත.

2.3 වගුව : ඇස්තමේන්තුගත සහ තථ්‍ය බදු ආදායම (2025 ජන. - ජූනි)

රු. බිලියන

අයිතමය	වාර්ෂික ඇස්තමේන්තුව	තථ්‍ය (ජන.-ජූනි)[අ]
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ආදායම් සහ ලාභ මත බදු	1,167	488
එකතු කළ අගය මත බද්ද - දේශීය	825	433
සමාජ ආරක්ෂණ දායක බද්ද- දේශීය	190	109
වෙනත්	13	8
උප එකතුව	**2,195**	**1,038**
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව		
ආනයන බදු	240	94
එකතු කළ අගය මත බද්ද - ආනයන	790	354
සමාජ ආරක්ෂණ දායක බද්ද- ආනයන	74	33
වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද	185	85
සෙස් ආනයන / අපනයන	100	41
විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද	126	78
නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු	599	291
දුම්වැටි	130	44
ඛනිජ තෙල්	230	112
මෝටර් වාහන සහ අනෙකුත්	239	135
වෙනත්	1	6
උප එකතුව	**2,115**	**982**
සුරා බදු දෙපාර්තමේන්තුව		
මත්පැන්/දුම්කොළ	242	109
උප එකතුව	**242**	**109**
අනෙකුත්		
විදුලි සංදේශ බද්ද	18	8
බලපත්‍ර ගාස්තු සහ අනෙකුත්	20	15
උප එකතුව	**38**	**23**
මුළු බදු ආදායම	**4,590**	**2,152**

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

[අ] : තාවකාලික

3. රේගු ආනයන බද්ද සියයට 92.7 කින්, එනම් රු. බිලියන 45.2 කින් ඉහළ ගොස් ඇති අතර මෝටර් රථ සඳහා සියයට 20.0 ක රේගු ආනයන බද්දක් යෙදීම සහ අදාළ රේගු ආනයන බද්ද මත සියයට 50.0 ක අධිභාරයක් අය කිරීම මෙන්ම අදාළ කාලය තුළ භාණ්ඩ ආනයනය වැඩි වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

4. ආදායම් බදු සියයට 9.2 කින්, එනම් රු. බිලියන 41.3 කින් වර්ධනය වී ඇති අතර උපයන විට ගෙවීමේ බද්ද රු. බිලියන 113.4 දක්වා සියයට 13.2 කින් ඉහළ යාම සහ පුද්ගල ආදායම් බද්ද රු. බිලියන 30.8 දක්වා සියයට 37.4 කින් ඉහළ යාම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. මෙම ආදායම් කාර්යසාධනය තුළින් ඉහළ ගිය වැටුප් හා ඉපැයීම් පෙන්නුම් කරන අතර පුද්ගල ආදායම් බදු ලියාපදිංචි කිරීම් සියයට 45.4 කින් මිලියන 1.1 දක්වා පුළුල් වීම සහ සංස්ථාපිත බදු ලියාපදිංචි කිරීම් සියයට 23 කින් 111,824 දක්වා පුළුල් වීම තුළින් බදු පරිපාලන ක්‍රියාමාර්ගයන්ගේ ශක්තිමත් වර්ධනය පිළිබිඹු කරයි.

5. විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සියයට 70.5 කින්, එනම් රු. බිලියන 32.1 කින් ඉහළ ගොස් ඇති අතර අර්තාපල් සහ ළූණු ආනයනය සඳහා වූ බදු අනුපාත ඉහළ දැමීම මෙන්ම ප්‍රධාන වෙළඳ භාණ්ඩ ආනයනය කිරීමේ ප්‍රමාණය වර්ධනය වීම ද මෙම ආදායම් ඉහළ යාම සඳහා හේතු විය.

6. සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සියයට 18.7 කින්, එනම් රු. බිලියන 22.3 කින් ඉහළ ගොස් ඇති අතර එයට දේශීය හා විදේශීය කටයුතු වල ව්‍යාප්තිය මෙන්ම 2024 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2025 වසරේ පළමු භාගයේදී සමාජ

ආරක්ෂණ දායකත්ව බදු ගොනු ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව සියයට 36.5 කින් 13,975 දක්වා වැඩි වීම පිළිබිඹු කරමින් වන බදු පරිපාලන ක්‍රියාමාර්ගයන්ගේ ශක්තිමත් භාවය හේතු විය.

7. පෙට්‍රෝලියම් නිෂ්පාදන තුළින් ලද නිෂ්පාදන බදු ආදායම සියයට 15.5 කින්, එනම් රු. බිලියන 15.0 කින් වැඩි වී ඇති අතර එයට මෝටර් රථ ආනයන සීමා ලිහිල් කිරීමත් සමඟ පෙට්‍රල් සහ ඩීසල් සඳහා ඇති ඉල්ලුම වැඩිවීම නිසා 2024 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2025 වසරේ පළමු භාගයේදී පෙට්‍රෝලියම් ආනයනය සියයට 15.0 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

8. මත්පැන් තුළින් ලද සුරාබදු ආදායම සියයට 9.2 කින්, එනම් රු. බිලියන 9.1 කින් වැඩි වී ඇති අතර ඊට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2025 වසරේ ජනවාරි 11 දින සිට ක්‍රියාත්මක වන පරිදි උද්ධමනයට අනුකූල දර්ශකගත කිරීම තුළින් සුරාබදු අනුපාත සියයට 5.9 කින් වැඩි කිරීම සහ බදු අනුකූලතාව ඉහළ යාමයි.

9. සෙස් බද්ද තුළින් ලද ආදායම සියයට 9.3 කින්, එනම් රු. බිලියන 3.5 කින් වැඩි වී ඇති අතර ඊට එම බද්දට යටත් භාණ්ඩ ආනයන වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු විය.

2.1 රූප සටහන : රජයේ ආදායම් සංයුතිය (2025 ජන. - ජූනි)



මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

2.4 වගුව : රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ සාරාංශය (2025 ජන. - ජූනි)

රු. මිලියන

අයිතමය	2024	2025 (අ)	වර්ධනය %
බදු ආදායම	**1,709,305**	**2,152,087**	**25.9**
ආදායම් බදු	447,252	488,506	9.2
දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු	600,370	699,990	16.6
එකතු කළ අගය මත බද්ද	353,392	433,364	22.6
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	91,187	108,561	19.1
නිෂ්පාදන බදු	155,695	158,023	1.5
ජාතිය ගොඩනැගීමේ බද්ද	95	43	-55.1
ආනයන මත පදනම් වූ බදු	636,469	926,988	45.6
රේගු බදු	48,758	93,952	92.7
එකතු කළ අගය මත බද්ද	263,552	353,967	34.3
ජාතිය ගොඩනැගීමේ බද්ද	3	405	…
වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද	85,992	85,431	-0.7
විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද	45,500	77,579	70.5
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	28,115	33,061	17.6
නිෂ්පාදන බදු	126,636	241,136	90.4
සෙස්	37,914	41,456	9.3
බලපත්‍ර ගාස්තු සහ අනෙකුත්	25,214	36,604	45.2
බදු නොවන ආදායම	**151,327**	**169,632**	**12.1**
මුළු ආදායම	**1,860,632**	**2,321,719**	**24.8**

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) : තාවකාලික

2025 වසරේ පළමු භාගය තුළ බදු නොවන ආදායම සියයට 12.1 කින්, එනම් රු. බිලියන 18.3 කින් වැඩිවීම සමස්ත ආදායම් ඉහළ යාමට දායක විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් පොලී ආදායම රු. බිලියන 10.1 කින් සහ දඩ, ගාස්තු හා අය කිරීම් රුපියල් බිලියන 2.3 කින් ඉහළ යාම හේතු විය. මේ අතර, එම කාලය තුළ රාජ්‍ය අංශයේ ඉහළ වැටුප් හා වේතන මෙන්ම, 2024 වසරේ අප්‍රේල් මාසයේ සිට ක්‍රියාත්මක වූ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා වූ සියලුම රාජ්‍ය සේවකයින්ගේ දායකත්වය සියයට 8 දක්වා ඉහළ නැංවීම පිළිබිඹු කරමින් සමාජ ආරක්ෂණ දායකත්වයන්ගෙන් ලද ආදායම රු. බිලියන 9.8 කින් වැඩි විය.

බදු ආදායම

2025 වසරේ මුල් භාගයේදී, බදු ආදායම රු. බිලියන 2,152.1ක් වූ අතර මෙය රු. බිලියන 2,321.7 ක් වූ රජයේ සමස්ත ආදායමෙන් (ප්‍රදාන හැර) සියයට 92.7ක ප්‍රතිශතයක් වේ. 2025 වසරේ පළමු මාස හය තුළ එකතු කළ අගය මත බද්ද, නිෂ්පාදන බද්ද සහ විදේශ වෙළෙඳාමින් ලද බදු තුළින් ලද ඉහළ බදු ආදායම් එකතු කිරීම, සෘජු බදු ආදායම සමස්ත බදු ආදායමට දරන අනුපාතය 2024 වසරේ වූ සියයට 26.2 සිට සියයට 22.7 දක්වා අඩුවීමට හේතු විය. 2025 වසරේ මැද භාගය වන විට බදු ආදායම් එකතුව, රු. බිලියන 4,590.0 ක වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 46.9ක මට්ටමට ළඟා වී තිබුණි.

ආදායම් බදු

ආදායම් බදු මගින් ලද ආදායම 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ රු. බිලියන 447.3 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 488.5 දක්වා සියයට 9.2කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. බදු අනුකූලතාවය වැඩිදියුණු කිරීම් සහ බදු නිදහස් කිරීම් ඉවත් කිරීම හේතුවෙන් අත්තිකාරම් පුද්ගල ආදායම් බදු සහ සංස්ථාපිත බදු ගෙවීම් ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන්ම බලපා ඇත.

අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද මගින් ලද ආදායම 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ රු. බිලියන 100.2 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 113.4 දක්වා සියයට 13.2 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය වූ අතර, සංස්ථාපිත බදු ආදායම ද රු. බිලියන 237.4 සිට රු. බිලියන 258.3 දක්වා සියයට 8.8 කින් වර්ධනය විය. 2025 වසරේ අප්‍රේල් මස පළමු වන දින සිට ක්‍රියාත්මක කරන ලද මත්පැන්, දුම්කොළ ඔට්ටු සහ සූදු කර්මාන්ත සඳහා සංස්ථාපිත බදු අනුපාතය සියයට 40 සිට සියයට 45 දක්වා ඉහළ දැමීමත් සේවා අපනයනය සඳහා සියයට 15 ක බදු අනුපාතයක් පැනවීමත් සමඟ ඉදිරි කාලපරිච්ඡේදයන්හිදී බදු පදනම පුළුල් වීම සහ ඉහළ විදේශ විනිමය ඉපැයීම් සහිත වර්ධනය වෙමින් පවතින ක්ෂේත්‍රයක් ග්‍රහණය කර ගැනීම තුළින් සංස්ථාපිත බදු එකතු කිරීම තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රධාන වශයෙන් 2025 වසරේ ජනවාරි මස සිට රාජ්‍ය අංශයේ වැටුප් වැඩි වීම හා 2025 වසරේ අප්‍රේල් මස සිට පෞද්ගලික අංශයේ අවම වැටුප් මට්ටම ඉහළ දැමීම හේතුවෙන් පුද්ගල ආදායම් බද්ද මගින් ලද ආදායම ද රු. බිලියන 22.4 සිට රු. බිලියන 30.7 දක්වා කැපී පෙනෙන ලෙස වර්ධනය විය. 2025 වසරේ අප්‍රේල් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පොලිය මත රඳවා ගැනීමේ බදු අනුපාතය සියයට 5 සිට සියයට 10 දක්වා ඉහළ දැමුවද, පොලිය මත රඳවා ගැනීමේ බද්දෙන් ලැබුණු ආදායම 2024 වසරේ පළමු භාගයේ දී වාර්තා කළ රු. බිලියන 87.1 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 86.1ක් දක්වා සියයට 1.2 කින් අඩු විය. ආර්ථිකය ස්ථායිකරණය සහ උද්ධමනය පාලනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2025 වසර තුළ හඳුන්වා දුන් පොලී අනුපාත අඩු කිරීම මේ සඳහා ප්‍රධාන වශයෙන්ම බලපා ඇත.

තනි පුද්ගල බදු ගෙවන්නන්ගේ ගණුදෙනු පිලිබඳ තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා මූල්‍ය ආයතනවල බැඳීමක් ඇති කිරීම, පුද්ගල ආදායම් බදු ගෙවන්නන් සඳහා ඉලෙක්ට්‍රොනික බදු ගොනු විවෘත කිරීම අනිවාර්යය කිරීම, මුදල් ආපසු ගෙවීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සහ වැඩිපුර ගෙවූ මුදල් ආපසු ගෙවීම කඩිනම් කිරීම, මුදලින් කෙරෙන ගණුදෙණු අධෛර්යමත් කිරීමේ අරමුණින් එක් දිනක් තුල දී හෝ තනි ගණුදෙනුවක දී හෝ එක් අවස්ථාවක දී හෝ රු. 500,000 හෝ ඊට වැඩි එකතුවක් ලෙස වන ගණුදෙනු බදු අරමුණු සඳහා වියදම් ලෙස අඩු කිරීමට ඉඩ නොදීම සහ රාජ්‍ය ආයතන ඇතුළු පුද්ගලයන් විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත නිතිපතා තොරතුරු හුවමාරු කරගැනීම සඳහා රෙගුලාසියක් නිකුත් කිරීම ආදී බදු පරිපාලනය ශක්තිමත් කිරීම උදෙසා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ එලෙස බදු ආදායම එකතු කිරීමේ කැපී පෙනෙන වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2025 වසරේ පළමු භාගයේ දී සංස්ථාපිත බදු සඳහා වූ නව ලියාපදිංචි කිරීම් සියයට 23කින් සහ පුද්ගල ආදායම් බද්ද සඳහා වූ නව ලියාපදිංචි කිරීම් සියයට 45කින් ඉහළ යැමත් සමඟ හඳුන්වාදෙන ලද මෙම පරිපාලනමය ක්‍රියාමාර්ගයන් බදු පදනම පුළුල් වීම සඳහා දායක වී ඇත.

2.5 වගුව : ආදායම් බදු කාර්යසාධනය (2025 ජන. - ජූනි)

රු. මිලියන

අයිතමය	2024	2025 (අ)	වර්ධනය %
සංස්ථාපිත හා සංස්ථාපිත නොවන	259,742	289,055	11.3
උපයන විට ගෙවීම්/ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු	100,177	113,364	13.2
ආර්ථික සේවා ගාස්තු	237	17	-92.9
රඳවා ගැනීමේ බද්ද	87,096	86,070	-1.2
එකතුව	**447,252**	**488,506**	**9.2**

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) : තාවකාලික

එකතු කළ අගය මත බද්ද

එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම නාමික වශයෙන්, 2024 වසරේ පළමු භාගයේදී වූ රු. බිලියන 616.9 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 787.3 ක් දක්වා සියයට 27.6 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇති අතර, එය 2025 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 48.8 ක ළඟාකර ගැනීමක් වේ. දේශීය ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රසාරණය වීම හේතුවෙන් 2025 වසරේ පළමු භාගයේදී දේශීය ක්‍රියාකාරකම් මත එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම රු. බිලියන 433.4 ක් දක්වා සියයට 22.6 කින් වර්ධනය විය. 2025 වසරේ පළමු භාගයේදී ආනයන මත එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම රු. බිලියන 354.0 ක් දක්වා සියයට 34.3 කින් වර්ධනය විය. 2025 වසරේ පෙබරවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි සියලුම කාණ්ඩවල වාහන සඳහා ආනයන සීමාවන් ඉවත් කිරීම මෙම වර්ධනයට හේතු විය.

2.6 වගුව : එකතු කළ අගය මත බදු කාර්යසාධනය (2025 ජන. - ජූනි)

රු. මිලියන

අයිතමය	2024	2025 (අ)	වර්ධනය %
දේශීය	353,392	433,364	22.6
ආනයන	263,552	353,967	34.3
ශුද්ධ ආදායම	**616,944**	**787,331**	**27.6**

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) : තාවකාලික

නිෂ්පාදන බදු

නිෂ්පාදන බදු මඟින් ලද ආදායම 2024 වසරේ පළමු භාගයේ දී උපයන ලද රු. බිලියන 282.3 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 399.2 දක්වා සියයට 41.4 කින් ඉහළ ගියේය. දුම්වැටිවලින් ලද ආදායමේ අඩුවීමක් වාර්තා වුවද, මෝටර් රථ, ඛණිජ තෙල්, මත්පැන්, සහ අනෙකුත් නිෂ්පාදන බදු අයකළ හැකි අයිතමයන්ගෙන් ලද ආදායමේ වර්ධනය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. නිෂ්පාදන බදු ආදායම, වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 47.6 ක තත්‍ය අගයක් ලඟාකර ගනිමින් බදු ආදායමෙන් සියයට 18.6 කට සහ සමස්ත ආදායමෙන් සියයට 17.2 කට දායක විය.

ප්‍රධාන වශයෙන් 2025 වසරේ පෙබරවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෝටර් රථ ආනයනය සඳහා වූ තාවකාලික සීමාවන් ඉවත් කිරීම හේතුවෙන් 2024 වසරේ පළමු භාගයේදී රු. බිලියන 29.6 ක් වූ මෝටර් රථ මත පනවා ඇති නිෂ්පාදන බද්දෙන් ලද ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 129.1 දක්වා සියයට 335.6 කින් විශාල වශයෙන් වර්ධනය විය.

ඛණිජ තෙල් නිෂ්පාදන මඟින් ලද ආදායම 2024 වසරේ පළමු භාගයේදී වූ රු. බිලියන 97.0 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 112.0 දක්වා සියයට 15.5 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2025 වසරේ පළමු භාගයේදී ඉල්ලුම ඉහළ යාම සහ ආර්ථික ක්‍රියාකාරකම් ශක්තිමත් වීම හේතුවෙන් ඉන්ධන ආනයනය වැඩි වීමයි.

2.7 වගුව : නිෂ්පාදන බදු/සුරාබදු ආදායම් කාර්යසාධනය (2025 ජන. - ජූනි)

රු. මිලියන

අයිතමය	2024	2025 (අ)	වර්ධනය %
මත්පැන්	99,116	108,240	9.2
දුම්වැටි හා දුම්කොළ	53,624	44,023	-17.9
මෝටර් වාහන	29,649	129,146	335.6
ඛනිජ තෙල්	96,987	111,990	15.5
අනෙකුත්	2,956	5,760	94.8
එකතුව	**282,331**	**399,159**	**41.4**

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) : තාවකාලික

මේ අතර, පැණිරස පාන වර්ග, ශීතකරණ, පාම් තෙල් සහ මේද අම්ල ඇතුළු නිෂ්පාදන බද්දට යටත් අනෙකුත් අයිතම මඟින් ලද නිෂ්පාදන බදු ආදායම 2024 වසරේ පළමු භාගයේදී වූ රු. බිලියන 3.0 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 5.8 දක්වා සියයට 94.8 කින් සැලකියයුතු ලෙස වැඩි විය. වාර්ෂික උද්ධමනය මත ගැළපුම්කරන ලද දර්ශක යාන්ත්‍රණයක් හඳුන්වා දීම මඟින් 2025 වසරේ ජනවාරි මස 11 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිෂ්පාදන බදු අනුපාත සියයට 5.9 කින් ඉහළ නැංවීම මෙන්ම 2025 වසරේ පළමු භාගයේදී ඉල්ලුම වැඩි වීම සහ ආර්ථික ක්‍රියාකාරකම් ශක්තිමත් වීම හේතුවෙන් ආනයන වැඩි වීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, දුම්වැටි මඟින් ලද ආදායම 2024 වසරේ පළමු භාගයේදී වූ රු. බිලියන 53.6 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 44.0 දක්වා සියයට 17.9 කින් අඩු විය.

2.2 රූප සටහන : නිෂ්පාදන බදු කාර්යසාධනය (2024 සහ 2025 ජන. - ජූනි)



මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

මත්පැන් මත සුරාබද්ද මඟින් ලද ආදායම 2024 වසරේ පළමු භාගය තුළ දී වාර්තා වූ රු. බිලියන 99.1 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 108.2 දක්වා සියයට 9.2 කින් වර්ධනය වූ අතර මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ 2025 වසරේ ජනවාරි මස 11 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සුරා බදු අනුපාත සියයට 5.9 කින් වැඩි කිරීමය. සමස්ත මත්පැන් නිෂ්පාදනය 2024 වසරේ පළමු භාගය තුළ දී නිරපේක්ෂ ලීටර් මිලියන 15.9 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ නිරපේක්ෂ ලීටර් මිලියන 17.4 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර එය 2023 වසරේ වාර්තා වූ නිෂ්පාදනයට ළඟා වීමකි. දේශීයව නිෂ්පාදනය කරන ලද සැර මත්පැන් මත නිෂ්පාදන බද්ද මඟින් ලද ආදායම 2024 වසරේ පළමු භාගය තුළ වාර්තා වූ රු. බිලියන 61.9 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 77.1 ක් දක්වා සියයට 24.5 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. කෙසේ වුවද, සකේ මත සුරා බද්දෙන් ලද ආදායම සියයට 228 කින් විශාල වශයෙන් වර්ධනය වූ අතර බීර මත සුරා බද්දෙන් ලද අදායම සියයට 7.1 කින් මධ්‍යස්ත වශයෙන් වැඩි විය. 2025 වසරේ පළමු භාගය තුළ මත්පැන් මත සුරාබද්ද මඟින් ලද ආදායම ඇස්තමේන්තුගත නිෂ්පාදන/ සුරාබදු මුළු ආදායමෙන් සියයට 45.1 කි.

වෙනත් බදු

වෙනත් බදු වලින් උපයන ලද ආදායම, 2024 වසරේ පළමු මාස හය තුළ දී වාර්තා කරන ලද රු. බිලියන 362.8 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 477.1 ක් දක්වා සියයට 31.5 කින් වර්ධනය විය.

රේගු ආනයන බද්දෙන් උපයන ලද ආදායම 2024 වසරේ පළමු මාස හය තුළ දී වාර්තා වූ රු. බිලියන 48.8 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 94.0 දක්වා සියයට 92.7 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය වී තිබේ. රේගු ආනයන බදු අනුපාත ඉහළ නැංවීම හා වාහන ආනයනය ඉහළ යාම මෙයට ප්‍රධාන හේතුව වේ.

සෙස් බද්දෙන් උපයන ලද ආදායම, 2024 වසරේ පළමු මාස හය තුළ දී වාර්තා වූ රු. බිලියන 37.9 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 41.5 ක් දක්වා සියයට 9.3 කින් වර්ධනය වී තිබේ. සෙස් බද්දට යටත් ආනයන වැඩි වීම මෙයට හේතු විය. ඒ අනුව, ආනයන මත පනවනු ලබන සෙස් බද්දෙන් උපයන ලද ආදායම 2024 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී උපයන ලද රු. බිලියන 35.5 සිට 2025 වසරේ පළමු අර්ධය තුළ රු. බිලියන 40.8 දක්වා සියයට 15.0 කින් වර්ධනය වී තිබේ. මේ අතර, අපනයන වලින් ලැබුණු සෙස් ආදායම 2024 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී උපයන ලද රු. බිලියන 1.0 සිට 2025 වසරේ පළමු අර්ධයේ දී රු. බිලියන 0.6 දක්වා සියයට 39.1 කින් අඩු වී ඇත. මෙම කාලපරිච්ඡේදය තුළ සෙස් බද්දෙන් රැස් කරන ලද ආදායම 2025 සඳහා වාර්ෂික ඇස්තමේන්තුගත රු. බිලියන 100.0 න් සියයට 41.5 ක ළඟාකර ගැනීමකි.

වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්දෙන් උපයන ලද ආදායම, 2024 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී උපයන ලද රු. බිලියන 86.0 ට සාපේක්ෂව 2025 වසරේ පළමු අර්ධයේ දී රු. බිලියන 85.4 දක්වා සියයට 0.7 කින් අඩු විය. මෙය 2025 සඳහා වාර්ෂික ඇස්තමේන්තුගත ආදායම වන රු. බිලියන 185 න් සියයට 46.2 ක ළඟා කර ගැනීමකි.

අර්තාපල් සහ එණු බදු අනුපාත වැඩි කිරීම, ලූණු සහ සහල් ආනයනය කිරීම සහ තිරසාර ආර්ථික ප්‍රබෝධයෙහි ප්‍රතිඵලයක් ලෙස ආනයන ප්‍රමාණයන් ඉහළ යාම හේතුවෙන් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් ලැබෙන ආදායම 2024 වසරේ සමාන කාලපරිච්ඡේදයේ ආදායමට සාපේක්ෂව 2025 වසරේ පළමු අර්ධය තුළ රු බිලියන 77.6 ක් දක්වා සියයට 70.5 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී තිබේ.

සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ උපයන ලද රු. බිලියන 119.3 ක් වූ ආදායම 2025 වසරේ පළමු අර්ධයේ දී රු. බිලියන 141.6 ක් දක්වා සියයට 18.7 කින් වර්ධනය වී ඇති අතර එය ආනයන සහ දේශීය ක්‍රියාකාරකම් වල වර්ධනය පිළිබිඹු කරයි. විදුලි සංදේශ බද්දෙන් ලැබුණු ආදායම 2024 වසරේ සමාන කාලපරිච්ඡේදයේ ආදායම වූ රු. බිලියන 8.8 ට සාපේක්ෂව 2025 වසරේ පළමු අර්ධයේ දී රු. බිලියන 8.0 ක් දක්වා සියයට 9.1 කින් අඩු වී ඇත. මේ අතර, මෝටර් රථ බදු සහ අනෙකුත් අදාළ බදු වලින් ලැබුණු ආදායම 2024 වසරේ සමාන කාලපරිච්ඡේදයේ ආදායම වූ රු. බිලියන 16.4 ට සාපේක්ෂව 2025 වසරේ පළමු අර්ධයේ දී රු. බිලියන 28.6 ක් දක්වා සියයට 74.3 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. මෙම කාර්ය සාධනය 2025 වසර සඳහා වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව වූ රු. බිලියන 34 න් සියයට 84.1 ක් නියෝජනය කරයි.

බදු නොවන ආදායම

බදු නොවන ආදායම 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී උපයන ලද රු. බිලියන 151.3 ට සාපේක්ෂව 2025 වසරේ පළමු අර්ධයේ දී රු. බිලියන 169.6 දක්වා සියයට 12.1 කින් වර්ධනය විය. දඩ, ගාස්තු සහ අයකිරීම්, පොලී ආදායම සහ සමාජ ආරක්ෂණ දායකත්වයන්ගෙන් ලැබුණු ඉහළ ආදායම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

2025 වසරේ පළමු අර්ධයේ දී දඩ, ගාස්තු සහ අයකිරීම් වලින් ලැබෙන ආදායම 2024 වසරේ සමාන කාලච්ඡේදයේ ආදායම වූ රු. බිලියන 79.3 සිට රු. බිලියන 81.6 ක් දක්වා සියයට 2.9 කින් වර්ධනය විය. මෙම ආදායම් කාණ්ඩය බදු නොවන ආදායමේ ප්‍රධාන මූලාශ්‍රය වන අතර එය මුළු බදු නොවන ආදායමෙන් සියයට 48.3 ක් විය. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවාවන් සඳහා ඇති ඉල්ලුම වැඩිවීම මෙම ආදායම් වර්ධනයට හේතු විය.

ඒසේම, 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී උපයන ලද පොලී ආදායම රු. බිලියන 23.4 සිට 2025 පළමු අර්ධයේ දී රු. බිලියන 33.5 දක්වා සියයට 43.1 කින් වර්ධනය වී ඇත. රජය සතු ව්‍යවසායන්ගෙන් ලද ලාභ සහ ලාභාංශ ආදායම් 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී උපයන ලද රු. බිලියන 14.9 සිට 2025 වසරේ පළමු අර්ධයේ දී රු. බිලියන 12.2 දක්වා සියයට 18.1 කින් අඩු වී ඇත. සමාජ ආරක්ෂණ දායකත්වයන්ගෙන් ලැබෙන ආදායම 2024 වසරේ එම කාලපරිච්ඡේදය තුළ උපයන ලද රු. බිලියන 19.8 සාපේක්ෂව 2025 වසරේ පළමු අර්ධයේ දී රු. බිලියන 29.5 දක්වා සියයට 49.3 කින් වර්ධනය වී ඇත. කුලී ආදායමෙන් ලැබෙන ආදායම 2025 වසරේ පළමු අර්ධයේ දී රු. බිලියන 2.7 දක්වා අඩු වී ඇති අතර එය 2024 වසරේ පළමු අර්ධයේ ආදායම වූ රු. බිලියන 3.2 ට සාපේක්ෂව සියයට 15.9 ක අඩුවීමකි. සමස්තයක් වශයෙන්, 2025 වසරේ පළමු අර්ධයේ දී එකතු කරන ලද බදු නොවන ආදායම 2025 වසර සඳහා ඇස්තමේන්තුගත රු. බිලියන 370.0 න් සියයට 45.8 ළගාකර ගැනීමකි.

2.8 වගුව : රාජ්‍ය ආදායම් විචලතා විශ්ලේෂණය

රු. බිලියන.

අයිතමය	2024 ජනවාරි - ජූනි	2025 වාර්ෂික ඇස්තමේන්තුව	2025(අ) ජනවාරි - ජූනි	විචලනය සඳහා ප්‍රධාන හේතු
ආදායම් බද්ද	447.3	1,167.0	488.5	2025 වසරේ පළමු මාස හය තුළ ආදායම් බදු ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 41.9 ක් ලඟාකරගෙන ඇති අතර, මෙම ආදායම් කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් පහත සඳහන් හේතු බලපා ඇත. - බදු පරිපාලනය ශක්තිමත් කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග සමඟින් 2024 වසරේ දෙවන අර්ධයේ සිට 2025 වසරේ පළමු අර්ධය වනවිට ලියාපදිංචි වූ බදු ගොනු සංඛ්‍යාව 1,238,653 දක්වා සියයට 43 කින් ඉහළයාම. - 2025.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි පොළිය මත රඳවාගැනීමේ බදු අනුපාතය සියයට 5 සිට සියයට 10 දක්වා ඉහළ දැමීම. - රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැටුප් වැඩි කිරීම. - ආර්ථික ක්‍රියාකාරකම් වල ක්‍රමිකව ඇති වූ පුනර්ජීවනය සහ පොලී මත රඳවාගැනීමේ බදු අනුපාතය ඉහළ නංවමින් සංශෝධනය කළ ද බදු අයකල හැකි ආදායම බද්දට යටත් සීමාවට වඩා පහළින් ඇති බවට ප්‍රකාශ කරන ලද තනි පුද්ගලයින්ට ප්‍රදානය කරනු ලබන බදු නිදහස මෙන්ම ප්‍රතිපත්ති පොලී අනුපාතයන් පහළයෑම හේතුවෙන් 2025 වසරේ මුල් අර්ධයේ රඳවාගැනීමේ බදු මඟින් ලද ආදායම 2024 වසරේ සමාන කාලයට සාපේක්ෂව සියයට 1.2 කින් පහළ ගොස් ඇත.
එකතුකළ අගය මත බදු	616.9	1,615.0	787.3	2025 වසරේ මුල් මාස හය තුළ එකතු කළ අගය මත බදු තුළින් ලද ආදායම පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී රු. බිලියන 787.3 ක් දක්වා සියයට 27.6 කින් ඉහළ ගොස් ඇති අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 48.8 ළඟාකරගැනීමකි. මෙම කාර්යසාධනය සඳහා පහත සඳහන් හේතු ප්‍රධාන වශයෙන් බලපා ඇත. - මෝටර් රථවාහන ආනයනය සඳහා පනවා තිබූ සීමාවන් ඉවත් කිරීම - සමස්ත ආනයන සියයට 12.4 කින් ඉහළයාම සහ - දේශීය ආර්ථික ක්‍රියාකාරකම් පුළුල්වීම.

රු. බිලියන.

අයිතමය	2024 ජනවාරි - ජූනි	2025 වාර්ෂික ඇස්තමේන්තුව	2025[අ] ජනවාරි - ජූනි	විචලනය සඳහා ප්‍රධාන හේතු
නිෂ්පාදන බද්ද	282.3	841.0	399.2	2025 වසරේ මුල් මාස හය තුළ නිෂ්පාදන බදු මගින් ලද ආදායම පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී රු. බිලියන 399.2 ක් දක්වා සියයට 41.4 කින් ඉහළ ගොස් ඇති අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 47.5 ක් වේ. මෙම කාර්සාධනය සඳහා ප්‍රධාන වශයෙන් පහත හේතු බලපා ඇත. - සියලුම වර්ගයේ මෝටර් රථවාහන ආනයන සඳහා පැවති ආනයන තහනම 2025 වසරේ පෙබරවාරි මස සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කිරීම හේතුවෙන් මෝටර් රථවාහන මගින් ලද නිෂ්පාදන බදු ආදායම ඉහළයාම - මෝටර් රථවාහන, සිගරට්, සීනි පදනම් වූ පාන වර්ග ආදි නිෂ්පාදන බද්ද යටතට අයත් සියලුම අයිතම සඳහා 1989 අංක 13 දරණ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ වාර්ෂික උද්ධමන ගැලපුම් දර්ශකගතකරණය මත පදනම්ව නිෂ්පාදන බදු අනුපාත සියයට 5.9 කින් ඉහළ දැමීම - වාර්ෂික උද්ධමන ගැලපුම් දර්ශකගතකරණය මත පදනම්ව මත්පැන් මත වූ සුරා බදු අනුපාත සියයට 5.9 කින් ඉහළ දැමීම - ඉහළ ඛණිජතෙල් ආනයන හේතුවෙන් ඛණිජතෙල් මත වූ නිෂ්පාදන බදු ආදායම සියයට 15.5 කින් ඉහළයාම - සීනි පදනම් වූ පාන වර්ග, ශීතකරණ සහ පාම් තෙල් මේද අම්ල වැනි අනෙකුත් නිෂ්පාදන බද්දට යටත් අයිතම තුළින් ලද ආදායම රු. බිලියන 5.8 ක් දක්වා සියයට 94.8 කින් ඉහළ යාම කෙසේවුවද, සමාලෝචිත කාලය තුළදී සිගරට් මගින් ලද ආදායම සියයට 17.9 කින් පහළ ගොස් ඇති අතර,එය නිෂ්පාදන බදු ආදායම කෙරෙහි සෘණාත්මකව බලපෑම් එල්ලකර ඇත.
ආනයන බදු	48.8	240.0	94.0	ආනයන බදු ආදායම 2025 වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුවෙන් සියයට 39.1 ක් ලබා කරගෙන ඇති අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ; - 2025 ජනවාරි මස 28 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෝටර් රථවාහන ආනයන මත සියයට 20 ක ආනයන බද්දක් පැනවීම - 2025 පෙබරවාරි 01 සිට බලපැවැත්වෙන පරිදි මෝටර් රථවාහන ආනයන මත අධිභාරයක් පැනවීම - 2025 වසරේ මුල් මාස හය තුළ ආනයන සියයට 12.4 කින් ඉහළයාම
වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද	86.0	185.0	85.4	වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 46.2 ක් ලබා කර ගනිමින් වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද මගින් ලද ආදායම 2025 වසරේ මුල් මාස හය තුළ රු. බිලියන 85.4 දක්වා සියයට 0.7 කින් ආන්තිකව පහළගොස් ඇත. මෙම පහළයාම සඳහා මූලික වශයෙන් පහත හේතු බලපා ඇත. - 2024 මාර්තු 29 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සිංගප්පූරු- ශ්‍රීලංකා නිදහස් වෙළඳ ගිවිසුමේ විධිවිධාන වලට අනුකූලව සිංගප්පූරුවෙන් භාණ්ඩ ආනයනය කරනු ලබන අවස්ථාවේ දී භාණ්ඩ වර්ග 595 ක් වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්දෙන් ඉවත් කිරීම හා තවත් භාණ්ඩ වර්ග 3,117 ක් සඳහා සහනදායි අනුපාත හඳුන්වා දීම - සමාලෝචිත කාලය තුළ වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්දට යටත් භාණ්ඩ ආනයන පහළ යාම.

රු. බිලියන.

අයිතමය	2024 ජනවාරි - ජූනි	2025 වාර්ෂික ඇස්තමේන්තුව	2025[(අ)] ජනවාරි - ජූනි	විචලනය සඳහා ප්‍රධාන හේතු
විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද	45.5	126.0	77.6	2025 වසරේ මුල් මාස හය තුළදී විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මගින් ලද ආදායම 2024 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 70.5 කින් සැලකියයුතු ලෙස ඉහළ ගොස් ඇති අතර එය 2025 වසරේ අයවැය ඇස්තමේන්තුවෙන් සියයට 61.6 ලඟා කරගැනීමකි. මෙම කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ; - අර්තාපල්, සහල් හා ලූණු සඳහා වූ බදු අනුපාතයන් ඉහළ දැමීම සහ - තෙල් සහ මේදය, කිරි ආශ්‍රිත නිෂ්පාදන, ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන සහ ධාන්‍ය ආදි ප්‍රධාන පරිභෝජන භාණ්ඩ ආනයන වටිනාකම සියයට 29.8 කින් ඉහළයාම
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	119.3	264.0	141.6	වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 53.6 ක් ලඟාකරගනිමින් 2025 වසරේ මුල් මාස හය තුළ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද මගින් ලද ආදායම සියයට 18.7 කින් ඉහළ ගොස් ඇති අතර, මෙම කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් පහත හේතු බලපා ඇත. - 2025 වසරේ මුල් මාස හය තුළ ඉහළ ගිය ආනයන මගින් ඇති කල බලපෑම - දේශීය ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් වීම
අනෙකුත් බදු	63.2	152.0	78.5	2025 වසර සඳහා වන වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 51.0 ක් ලඟාකරගනිමින් 2025 වසරේ මුල් මාස හය තුළ අනෙකුත් බදු මගින් ලද ආදායම රු. බිලියන 78.5 දක්වා සියයට 24.2 කින් ඉහළගොස් ඇත. මේ සඳහා මූලික වශයෙන් පහත හේතු බලපා ඇත. - ආනයන ඉහළ යාම හේතුවෙන් සෙස් බදු මගින් ලද ආදායම සියයට 9.3 කින් ඉහළ යාම - මෝටර් රථවාහන ආනයන සඳහා පැවති සීමාවන් ඉවත් කිරීමත් සමගින් 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 1.1 ක් වූ මෝටර් රථවාහන මත වූ සුඛෝපභෝගී මෝටර් රථවාහන බද්ද 2025 වසරේ මුල් මාස හය තුළ රු. බිලියන 11. 4 දක්වා වැඩිවීම කෙසේ වුවද, අඩු විදුලි සංදේශ සේවා පරිභෝජනය හේතුවෙන් විදුලි සංදේශ බද්ද මගින් ලද ආදායම සියයට 9.1 කින් පහළ යාම වෙනත් බදු ආදායමේ කාර්යසාධනය අඩු වීම සඳහා හේතු වී ඇත.
බදු නොවන ආදායම	151.3	370.0	169.6	පොලී ආදායම් සහ දඩ, අයකිරීම් හා ගාස්තු මගින් ලද ඉහළ ආදායම් කාර්යාධනයෙහි ප්‍රතිඵලයක් ලෙස 2025 වසරේ මුල් මාස හය තුළ බදු නොවන මූලාශ්‍ර මගින් ලද ආදායම සියයට 12.1 කින් ඉහළ ගොස් ඇත. 2025 වසරේ මුල් මාස හය තුළ බදු නොවන ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 45.8 ක් ලඟාකරගෙන ඇත. කෙසේ වුවද, කුලී ආදායම හා රාජ්‍ය ව්‍යාපාර මගින් ලද ලාභ හා ලාභාංශ ආදායම් පහළ යාම වාර්ෂික ඇස්තමේන්තුවෙන් විචලනය පුළුල් වීම සඳහා බලපා ඇත.
එකතුව	**1,860.6**	**4,960.0**	**2,321.7**	

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී.
[(අ)] තාවකාලික

විශේෂ සටහන 2.1 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග 2025 වසරේ ජනවාරි සිට ජූනි දක්වා

<table>
<tr><th>ක්‍රියාත්මක වන දිනය</th><th>ක්‍රියාමාර්ග</th></tr>
<tr><td colspan="2">ආදායම් බද්ද - 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට සංශෝධන</td></tr>
<tr><td>2025.04.01</td><td>
2025 අංක 2 දරන දේශීය ආදායම් බදු (සංශෝධන) පනත

(1) පුද්ගල ආදායම් බදු අනුපාත ව්‍යුහය
පුද්ගලයෙකු සඳහා ලබා දෙන පුද්ගල ආදායම් බදු සහනය, වසරකට රු. 1,800,000 /- ක් දක්වා ඉහළ නැංවීම සහ පුද්ගලයෙකු සඳහා බදු අය කළ හැකි ආදායම මත අදාළ වන බදු අනුපාත පහත පරිදි සංශෝධනය කිරීම.

(රු. මිලියන)
<table>
<tr><th></th><th colspan="2">වාර්ෂික බදු අයවන ආදායම</th></tr>
<tr><th>ආන්තික බදු අනුපාතය (%)</th><th>පෙර පැවති බදු ස්ථර</th><th>වත්මන් බදු ස්ථර</th></tr>
<tr><td>0</td><td>1.2 දක්වා</td><td>1.8 දක්වා</td></tr>
<tr><td>6</td><td>1.2 – 1.7</td><td>1.8 – 2.8</td></tr>
<tr><td>12</td><td>1.7 – 2.2</td><td>–</td></tr>
<tr><td>18</td><td>2.2 – 2.7</td><td>2.8 – 3.3</td></tr>
<tr><td>24</td><td>2.7 – 3.2</td><td>3.3 – 3.8</td></tr>
<tr><td>30</td><td>3.2 – 3.7</td><td>3.8 – 4.3</td></tr>
<tr><td>36</td><td>3.7 ට වැඩි</td><td>4.3 ට වැඩි</td></tr>
</table>
(2) සංස්ථාපිත ආදායම් බදු අනුපාත සංශෝධනය
(i) ඔට්ටු සහ සූදු ක්‍රීඩාව මඟින් ලැබෙන ඉපයීම් සහ ලාභ මත සහ අපනයනය කිරීම සඳහා හැර නිෂ්පාදනය කර විකුණනු ලබන හෝ ආනයනය කර විකුණනු ලබන ඕනෑම මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදන සඳහා ලැබෙන ඉපයීම් සහ ලාභ මත ආදායම් බදු අනුපාතය සියයට 40 සිට සියයට 45 දක්වා වැඩි කිරීම.
(ii) ශ්‍රී ලංකාවෙන් පිටත දී ප්‍රයෝජනයට ගැනීම සඳහා ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටතදී යම් තැනැත්තකු වෙත සපයනු ලබන සේවා සඳහා ගෙවීම්, විදේශ ව්‍යවහාර මුදලින් බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන අවස්ථාවක දී, එම සේවා සැපයීමෙන් ලැබෙන ඉපයීම් හා ලාභ මත සියයට 15ක අනුපාතයට ආදායම් බදු පැනවීම.
(iii) යම් විදේශීය මූලාශ්‍රයකින් ලැබෙන ඉපයීම් හා ලාභ විදේශීය ව්‍යවහාර මුදලින් බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන අවස්ථාවක දී එම විදේශීය මූලාශ්‍රයෙන් ලැබෙන ඉපයීම් සහ ලාභ මත සියයට 15ක අනුපාතයට ආදායම් බදු පැනවීම.

(3) අත්තිකාරම් ආදායම් බදු (රඳවා ගැනීමේ බදු) අනුපාතය
පොළී හෝ වට්ටම් මත අත්තිකාරම් ආදායම් බදු (රඳවා ගැනීමේ බදු) අනුපාතය සියයට 5 සිට සියයට 10 දක්වා වැඩි කිරීම.
</td></tr>
<tr><td colspan="2">මුද්දර ගාස්තු - 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත</td></tr>
<tr><td>2025.04.01</td><td>
2025.03.27 දිනැති අංක 2429/39 දරන ගැසට් නිවේදනය
- යම් දේපලක බද්දට හෝ කුලියට දීමට අදාල යම් සාධන පත්‍රයක් මත පනවනු ලබන මුද්දර ගාස්තුව, කල්බදු හෝ කුලී ගිවිසුමේ (කුලී සින්නක්කර ගිවිසුම් හැර) සම්පූර්ණ කාලපරිච්ඡේදය අධි මිලද ඇතුළුව ගෙවිය යුතු එකතු කල් බද්දේ හෝ කුලියෙහි, සෑම රුපියල් 1,000/- ක් හෝ ඉන් කොටසක් සඳහා, රු. 10/- සිට රු. 20/- දක්වා වැඩි කිරීම.
</td></tr>
<tr><td colspan="2">එකතු කළ අගය මත බද්ද - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත</td></tr>
<tr><td></td><td>2025 අංක 4 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත</td></tr>
<tr><td>2024.01.01</td><td>1) 2002 අංක 14 දරන වැට් බදු පනතෙන් බදු නිදහස් කිරීම් ඉවත් කිරීමේ අනපේක්ෂිත බලපෑම වලක්වා ගැනීම, පනතේ පැහැදිලි බව පවත්වා ගැනීම හා 2023 අංක 32 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මඟින් හඳුන්වා දී ඇති එකතු කළ අගය මත බදු ප්‍රතිසංස්කරණ වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීම.</td></tr>
<tr><td>2025.04.11</td><td>2) භාණ්ඩ වැට් බද්දෙන් නිදහස් කර ඇති බව හෝ ආනයනකරු/ අපනයනකරු වැට් බදු ලියාපදිංචි සීමාවට පහලින් සිටින බව නොසලකා, වාණිජමය අරමුණින් ආනයන/ අපනයන සිදු කරන විට, ස්ථිර වැට් බදු ලියාපදිංචි සහතිකය නිකුත් කිරීම.</td></tr>
<tr><td>2025.04.11</td><td>3) වැට් බද්දෙන් නිදහස් කරන ලද සැපයුම් /මිලදී ගැනීම් සම්බන්ධයෙන් වැට් බදු වාර්තා ගොනු කිරීමට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් උපදෙස් නිකුත් කිරීම.</td></tr>
<tr><td>2025.04.11</td><td>4) දේශීයව නිපදවන දියර කිරි සහ යෝගට් සැපයීම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම.</td></tr>
<tr><td>බ.පැ.2025.10.01</td><td>5) 2025 ඔක්තෝබර් මස 01 දින සිට නිර්වාසික තැනැත්තකු විසින් ඉලෙක්ට්‍රොනික වේදිකාවක් හරහා සිදුකරන සේවා සැපයීම සඳහා එකතු කළ අගය මත බදු පැනවීම.</td></tr>
<tr><td>බ.පැ.2025.10.01</td><td>6) සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) යෝජනා ක්‍රමය 2025 ඔක්තෝබර් මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කර, මුදල් ආපසු ගෙවීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අවදානම මත පදනම් වූ ආපසු ගෙවීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීම.</td></tr>
</table>

විශේෂ සටහන 2.1 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග 2025 වසරේ ජනවාරි සිට ජූනි දක්වා සම්බන්ධිතයි ......

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද - 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත	
2025.01.11	2025.01.10 දිනැති අංක 2418/43 දරන ගැසට් නිවේදනය - වාර්ෂික උද්ධමන ගැලපුම් දර්ශක මත පදනම්ව ඒකක අනුපාත සහිත නිෂ්පාදන බදු අයකළ හැකි සියලුම භාණ්ඩ වල බද්ද සියයට 5.9 කින් වැඩි කිරීම.
2025.02.01	2025.01.31 දිනැති අංක 2421/42 දරන ගැසට් නිවේදනය - විදුලි වාහන සඳහා වන නිෂ්පාදන බද්ද සියයට 100 කින් වැඩි කිරීම.
2025.04.29	2025.04.28 දිනැති අංක 2434/04 දරන ගැසට් නිවේදනය - බාහිර විදුලි බල ප්‍රභවයට සම්බන්ධ කිරීමෙන් ආරෝපණය කළ නොහැකි, විදුලි සමුච්චකය ආරෝපණය කිරීම සඳහා පමණක් එන්ජිම භාවිතා කරන (පෙට්‍රල්, ඩීසල් හෝ අර්ධ ඩීසල්) විද්‍යුත් මෝටර් රථ සඳහා අලුතින් නිර්මාණය කරන ලද නව ජාතික උප බෙදුම් රේගු සංකේතාංක සඳහා නිෂ්පාදන බද්ද පැනවීම.
සුරා බද්ද - සුරාබදු ආඥා පනත (52 වන අධිකාරය)	
2025.01.11	සුරාබදු නිවේදන අංක 01/2025 (2025.01.10 දිනැති අංක 2418/42 දරන ගැසට් නිවේදනය) - වාර්ෂික උද්ධමන ගැලපුම් දර්ශක මත පදනම්ව මත්පැන් මත සුරා බද්ද සියයට 5.9 කින් වැඩි කිරීම.
දුම්කොළ බද්ද - 1999 අංක 08 දරන දුම්කොළ බදු පනත	
2025.04.02	2025.04.01 දිනැති අංක 2430/16 දරන ගැසට් නිවේදනය - බීඩි සඳහා අදාළ වන දුම්කොළ බද්ද ඒකකයට රු. 2/- සිට රු. 3/- දක්වා වැඩි කිරීම.
රේගු ආනයන බද්ද - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත	
2025.01.28	ආදායම් සංරක්ෂණ ආඥා අංක 01/2025 (2025.01.27 දිනැති අංක 2421/05 දරන ගැසට් නිවේදනය) - මෝටර් රථ ආනයනය සඳහා සියයට 20 හෝ සියයට 20 ක නිශ්චිත තීරු බදු අනුපාතයක් සමග (මිශ්‍ර තීරු බදු අනුපාතය) රේගු ආනයන බද්දක් පැනවීම.
2025.04.29	ආදායම් සංරක්ෂණ ආඥා අංක 02/2025 (2025.04.28 දිනැති අංක 2434/02 දරන ගැසට් නිවේදනය) - බාහිර විදුලි බල ප්‍රභවයට සම්බන්ධ කිරීමෙන් ආරෝපණය කළ නොහැකි, විදුලි සමුච්චකය ආරෝපණය කිරීම සඳහා පමණක් එන්ජිම භාවිතා කරන (පෙට්‍රල්, ඩීසල් හෝ අර්ධ ඩීසල්) විද්‍යුත් මෝටර් රථ සඳහා නව ජාතික උප බෙදුම් රේගු සංකේතාංක නිර්මාණය කිරීම.
රේගු අධිභාරය - රේගු ආඥාපනත (235 වන අධිකාරය)	
2025.02.01	2025.01.31 දිනැති අංක 2421/43 දරන ගැසට් නිවේදනය - මෝටර් රථ ආනයනය සඳහා ආනයන බදු මත අධිභාරයක් පැනවීම.
2025.04.29	2025.04.28 දිනැති අංක 2434/03 දරන ගැසට් නිවේදනය - බාහිර විදුලි බල ප්‍රභවයට සම්බන්ධ කිරීමෙන් ආරෝපණය කළ නොහැකි, විදුලි සමුච්චකය ආරෝපණය කිරීම සඳහා පමණක් එන්ජිම භාවිතා කරන (පෙට්‍රල්, ඩීසල් හෝ අර්ධ ඩීසල්) විද්‍යුත් මෝටර් රථ සඳහා අලුතින් නිර්මාණය කරන ලද නව ජාතික උප බෙදුම් රේගු සංකේතාංක සඳහා අධිභාරයෙන් සියයට 50ක් පැනවීම.
විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද - 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත	
2025.01.01	2024.12.31 දිනැති අංක 2417/20 දරන ගැසට් නිවේදනය - අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු ආනයනික අයිතම 63 ක් සඳහා පනවා ඇති විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය 2025 දෙසැම්බර් මස 31 දින දක්වා දීර්ඝ කිරීම.
2025.01.28	2025.01.27 දිනැති අංක 2421/03 දරන ගැසට් නිවේදනය - 2025 මාර්තු මස 03 දින දක්වා රාමසාන් උත්සව සමය වෙනුවෙන් රට ඉඳි ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 199/-ක බදු සහනයක් සැලසීම.
ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි - 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනත	
2025.01.28	2025 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.01.27 දිනැති අංක 2421/04 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - වාණිජමය හෝ භාණ්ඩ ප්‍රවාහන කාර්යයන් සඳහා යොදා ගන්නා වාහන ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීම.
2025.02.01	2025 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.01.31 දිනැති අංක 2421/44 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - පුද්ගලික භාවිතය සඳහා යොදා ගන්නා මෝටර් වාහන (කාර්, වෑන්, ස්පෝර්ට් යුටිලිටි වාහන ආදිය) ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීම සහ උපරිම වයස් සීමාවන් ඉක්මවන මෝටර් රථ සඳහා ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවය පැනවීම.

විශේෂ සටහන 2.1 : ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග 2025 වසරේ ජනවාරි සිට ජූනි දක්වා සම්බන්ධිතයි ......

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
2025.03.19	2025 අංක 03 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.03.19 දිනැති අංක 2428/07 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - භාවිතා කළ මෝටර් රථ සඳහා අපනයන පරීක්ෂණ සහතික නිකුත් කිරීමට සියලුම රටවල් සඳහා බලයලත් පරීක්ෂකවරයෙකු ලෙස බියුරෝ වෙරිටාස් ආයතනය පත් කිරීම, සහ අපනයන රටෙහි බැංකුවේ මුද්‍රාව (2013 අප්‍රේල් 03 දිනැති අංක 1804/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ අංක 5 දරන රෙගුලාසිය ප්‍රකාරව අවශ්‍යවන) නොමැතිව ලැබුණු මෝටර් රථවල අපනයන පරීක්ෂණ සහතික මාර්ගගත සත්‍යාපනය හරහා නිකුත් කිරීමට බලපත්‍රලාභී බැංකුවලට බලය පැවරීම.
2025.04.29	2025 අංක 04 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.04.19 දිනැති අංක 2434/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - 2023.01.01 දිනැති අංක 2312/77 දරන ඇති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ආනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම අත්හිටවූ අයිතම ලැයිස්තුව සමාලෝචනය කර තෝරාගත් අයිතම එම ලැයිස්තුවෙන් ඉවත් කිරීම සහ ඕනෑම රටක ලියාපදිංචි නොකළ (නවතම) විද්‍යුත් යතුරුපැදි ආනයනය කිරීම, ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම.
2025.05.05	2025 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.05.05 දිනැති අංක 2435/02 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - 2025 අප්‍රේල් 28 දිනැති අංක 2434/02 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් විද්‍යුත් මෝටර් රථ සඳහා ප්‍රකාශයට පත් කරන ලද සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවල ජාතික උප බෙදුම්, මෝටර් වාහන ආනයනය සඳහා අදාල වන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි සඳහා ඇතුලත් කිරීම.
2025.05.19	2025 අංක 06 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.05.19 දිනැති අංක 2437/04 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 2501.00 යටතේ වර්ගීකරණය කරන ලද අමු අයඩිනීකරණය නොකළ ලුණු සහ ආහාරයට ගත හැකි අයඩිනීකරණය කළ ලුණු (කුඩු කළ සහ කැට ලුණු) ආනයනය සඳහා වන ආනයන පාලන බලපත්‍ර අවශ්‍යතාව 2025 ජූනි 10 දක්වා ඉවත් කිරීම. *
අපගමන බද්ද - 2003 අංක 25 දරන මුදල් පනත	
2025.01.31	2025.01.31 දිනැති අංක 2421/30 දරන ගැසට් නිවේදනය - මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළින් ගුවන් යානා මඟින් ශ්‍රී ලංකාවෙන් පිටවන පුද්ගලයන් සඳහා, බදු නිදහස් කිරීමේ කාලය ජාත්‍යන්තර ගුවන් සේවාවක් මෙහෙයුම් ආරම්භ කළ දින සිට වසර තුනක කාලයක් සම්පූර්ණ වන හෝ 2025.12.28 යන දෙකෙන් පළමුවෙන් එළබෙන දිනය දක්වා දීර්ඝ කිරීම. - කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ-රත්මලානෙන් සහ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළින් ගුවන් ගමන් මෙහෙයුම් ආරම්භ කර, ගුවන් යානා මඟින් ශ්‍රී ලංකාවෙන් පිටවන පුද්ගලයන් සඳහා ඇ.ඩො. 30ක සහනදායී අනුපාතය දීර්ඝ කිරීම.
ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද - 2004 අංක 11 දරන මුදල් පනත	
2025.04.01	2025.04.01 දිනැති අංක 2430/14 දරන ගැසට් නිවේදනය - පැමිණෙන ජාත්‍යන්තර ඇමතුම්, විශේෂිත දුරකථන අංක මත පැමිණෙන ජාත්‍යන්තර ඇමතුම්, දේශීය ප්‍රවේශ ගාස්තු , විදුලි සංදේශ සංවර්ධන ගාස්තු සහ පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු සඳහා ගෙවිය යුතු වත්මන් බදු අනුපාතය 2025 ජනවාරි 01 සිට 2027 දෙසැම්බර් 31 දක්වා වසර තුනක් සඳහා දීර්ඝ කිරීම.
මෝටර්රථ සඳහා සුඛෝපභෝගී බද්ද - 2018 අංක 35 දරන මුදල් පනත	
2025.02.01	2025.01.31 දිනැති අංක 2421/41 දරන ගැසට් නිවේදනය - විදුලි මෝටර් රථ හැර, සෑම ඉන්ධන කාණ්ඩයකම මෝටර්රථ සඳහා වන සුඛෝපභෝගී බදු සීමාව රු. මිලියන 1.5 කින් සංශෝධනය කිරීම.
2025.04.29	2025.04.28 දිනැති අංක 2434/05 දරන ගැසට් නිවේදනය - බාහිර විදුලි බල ප්‍රභවයට සම්බන්ධ කිරීමෙන් ආරෝපණය කළ නොහැකි, විදුලි සමුච්චකය ආරෝපණය කිරීම සඳහා පමණක් එන්ජිම භාවිතා කරන (පෙට්‍රල්, ඩීසල් හෝ අර්ධ ඩීසල්) විදුලි මෝටර් රථ සඳහා අලුතින් නිර්මාණය කරන ලද නව ජාතික උප බෙදුම් ශ්‍රේණි සංකේතාංක සඳහා වන සුඛෝපභෝගී බද්ද පැනවීම.

*** - මෙම ගැසට් පත්‍රය මේ වනවිට බලාත්මක නොවේ.**

2.3 රාජ්‍ය වියදම

රාජ්‍ය වියදම 2024 වසරේ පළමු මාස හය තුළ දී වූ රු. බිලියන 2,463.3 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 2,730.7 ක් දක්වා සියයට 10.9 කින් වැඩි විය. පුනරාවර්තන වියදම් 2024 වසරේ පළමු මාස හය තුළ දී වූ රු. බිලියන 2,506.8 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 2,218.4 ක් දක්වා සියයට 13.0 කින් වැඩි විය. ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම් 2024 වසරේ පළමු මාස හය තුළ දී වූ රු. බිලියන 244.9 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 223.9 ක් දක්වා සියයට 8.6 කින් අඩු විය.

2.9 වගුව : රාජ්‍ය වියදම් කාර්ය සාධනය: (2025 ජන.- ජූනි)

රු. මිලියන

අයිතමය	ජන. - ජූනි	
	2024	2025)[ආ]
පුනරාවර්තන වියදම්	**2,218,442**	**2,506,828**
වැටුප්	480,326	555,136
විශ්‍රාම වැටුප්	188,086	208,371
පොලී ගෙවීම්	1,142,105	1,264,591
වෙනත්	407,925	478,730
ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම්	**244,863**	**223,879**
එකතුව	**2,463,305**	**2,730,707**

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(ආ) තාවකාලික

පොලී ගෙවීම්

දේශීය හා විදේශීය ණය සඳහා පොලී ගෙවීම් ඇතුළු සමස්ත පොලී ගෙවීම් සඳහා වියදම 2024 වසරේ පළමු මාස හයෙහි වූ රු. බිලියන 1,142.1 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,264.6 ක් දක්වා සියයට 10.7 කින් වැඩි විය. මෙයට, 2024 වසරේ පළමු මාස හයෙහි දේශීය ණය සඳහා වන පොලී ගෙවීම්, රු. බිලියන 1,073.7 සිට රු. බිලියන 1,117.5 දක්වා සියයට 4.1 කින් හා විදේශීය ණය සඳහා වන පොලී ගෙවීම් රු. බිලියන 68.4 සිට රු. බිලියන 147.1 දක්වා සියයට 115.2 කින්, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වැඩි වීම හේතු විය.

වැටුප් සහ විශ්‍රාම වැටුප්

පළාත් සහා ඇතුළු රාජ්‍ය සේවකයින්ගේ වැටුප් හා වේතන සඳහා දරන ලද වියදම 2024 වසරේ පළමු මාස හය තුළ දී වූ රු. බිලියන 480.3 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 555.1 ක් දක්වා සියයට 15.6 කින් වැඩි විය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව රාජ්‍ය සේවකයින්ගේ මූලික වැටුප වැඩිවීම මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

කෙසේ වෙතත්, විශ්‍රාමිකයන් සංඛ්‍යාව වැඩි වීම හේතුවෙන් විශ්‍රාම වැටුප් සඳහා වන වියදම 2024 පළමු මාස හය තුළ දී වූ රු. බිලියන 188.1 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රුපියල් බිලියන 208.4 ක් දක්වා සියයට 10.8 කින් වැඩි විය.

සුබසාධන වියදම්

2025 වසරේ පළමු මාස හය තුළ අස්වැසුම මුදල් ප්‍රදාන, වැඩිහිටි දීමනා, වකුගඩු රෝගීන් සඳහා මූල්‍ය ආධාර, ආබාධිත පුද්ගල දීමනා, ආබාධිත රණවිරුවන්ට ආධාර, ගැබිණි මව්වරුන්ට පෝෂ්‍යදායි ආහාර පැකේජය (පෝෂණ මල්ල), පාසල් පෙළ පොත්, නිල ඇඳුම් ඇතුළු සමාජ සුබසාධන, සමාජ ආරක්ෂණය, පොහොර සහනාධාරය සහ සංවර්ධන සහායන් ඇතුළු සුබසාධන වියදම් ලෙස රජය විසින් රු. බිලියන 461.9 ක් වැය දරා ඇත.

2025 වසර සඳහා අස්වැසුම සහ අනෙකුත් වර්ගීකරණ කුටුම්භ මුදල් සහනාධාර සඳහා රු. බිලියන 232.5 ක අයවැය ප්‍රතිපාදන වෙන් කරන ලද අතර එයින් රු. බිලියන 75.3 ක් 2025 වසරේ මුල් මාස හය තුළ අඩු ආදායම්ලාභී පවුල් සඳහා මුදල් ප්‍රදාන ලබා දීමට වැය දරා ඇත.

රජයේ රෝහල්වලට වෛද්‍ය සැපයුම් ඇතුළු සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන සඳහා 2025 වසරේ පළමු මාස හය තුළ දරන ලද වියදම රු. බිලියන 44.7 කි. නොමිලේ පෙළපොත්, නිල ඇඳුම්, දුෂ්කර පාසල්වල සිසුන් සඳහා පාවහන් වැනි අධ්‍යාපන සුබසාධන වැඩසටහන් සඳහා 2025 වසරේ පළමු මාස හය තුළ වියදම රු. බිලියන 4 කි. එමෙන්ම රසායනික පොහොර සඳහා වූ රජයේ සහනාධාරය වෙනුවෙන් 2025 වසරේ පළමු මාස හය තුළ දී දරන ලද වියදම රු. බිලියන 21.9 කි

ආංශික වියදම්

පාසල් අධ්‍යාපනය

2025 වසරේ පළමු මාස හය තුළ පාසල් අධ්‍යාපනය සඳහා රු. බිලියන 189.2 ක මුදලක් වැය කර ඇති අතර, එයින් රු. බිලියන 184.6 ක් පුනරාවර්තන වියදම් වන අතර රු. බිලියන 4.6 ක් ප්‍රාග්ධන වියදම් වේ.

රජය විසින් පාසල් ආහාර පෝෂණ වැඩසටහන, පාසල් පෙළපොත් මුද්‍රණය, පාසල් නිල ඇඳුම් සහ දුෂ්කර පාසල්වල සිසුන් සඳහා පාවහන් ලබා දීම, කාන්තා ශිෂ්‍යාවන් සඳහා සනීපාරක්ෂක තුවා ලබා දීම සහ සුරක්ෂා සිසු රක්ෂණාවරණය වැනි සුභසාධන වැඩසටහන් සඳහා අඛණ්ඩව ආයෝජනය කළ අතර, එම වැඩසටහන් සඳහා රු. බිලියන 16.9 ක් වැය වී ඇත. ඒ අනුව මෙම සුබසාධන වැඩසටහන් සඳහා දරන ලද වියදම 2024 වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 48.7 කින් පමණ වැඩි වී ඇත.

2.10 වගුව : ප්‍රධාන සුභසාධන වැඩසටහන් සඳහා වියදම් (2025 ජන. - ජූනි)

රු. මිලියන

වැඩසටහනේ නම	2024	2025 (අ)
සමාජ සුභසාධනය		
රජයේ රෝහල් සඳහා වෛද්‍ය සැපයුම් (ආයුර්වේද රෝහල් ඇතුළුව)	28,961	44,740
පාසල් ළමුන් සඳහා සෞඛ්‍ය රක්ෂණය (සුරක්ෂා)	–	444
විශ්‍රාමිකයන් සඳහා අග්‍රහාර රක්ෂණ ක්‍රමය	460	486
පෙර පාසල් ගුරුවරුන් සඳහා දීමනා	111	334
රණවිරු මාපිය රැකවරණ දීමනාව	1,084	699
රජයේ සේවකයින් සඳහා දේපල ණය පොලී	855	725
ආර්ථික වශයෙන් ලාභ නොලබන මාර්ග සඳහා ශ්‍රී ලංගමට ලබාදෙන සහනාධාර, සමාජීය වශයෙන් අනිවාර්ය බස් සේවා (සිසු සැරිය, ගැමි සැරිය සහ නිසි සැරිය) සහ සන්නද්ධ හමුදා නිදහස් ගමන් ප්‍රවේශපත්‍ර	1,529	1,985
1990 "සුව සැරිය" නොමිලේ ගිලන්රථ සේවාව	591	1,162
ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සඳහා පොළී ගෙවීම්	20,000	10,000
ලෝක ආහාර වැඩසටහන	485	110
වෙනත්	1,566	906
සමාජ ආරක්ෂණය		
අඩු ආදායම්ලාභී පවුල් සඳහා ආධාර	64,079	75,329
අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයින් සඳහා ආධාර	2,514	6,828
වැඩිහිටි පුද්ගලයින් සඳහා මූල්‍ය ආධාර	5,527	21,086
වකුගඩු රෝගීන් සඳහා මූල්‍ය ආධාර	1,183	2,296
පාසල් ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මූල්‍යාධාර	-	2,815
විශ්‍රාම වැටුප්	188,086	208,371
මියගිය හා තුවාල ලැබූ රණවිරුවන් සඳහා සේවා වන්දී	23,338	24,806
ගොවි විශ්‍රාම වැටුප	2,434	2,630
වෙනත්	96	152
සෞඛ්‍ය හා පෝෂණ		
ත්‍රිපෝෂ වැඩසටහන	978	1,126
ගැබිණි මව්වරුන් සඳහා පෝෂණීය ආහාර පැකේජය (පෝෂණ මල්ල)	2,790	3,058
පාසල් පෝෂ්‍යදායි ආහාර වැඩසටහන	6,349	12,215
පෙර පාසල් ළමුන් සඳහා උදැසන ආහාරය	344	767
වෙනත්	336	144
අධ්‍යාපනය		
පාසල් පෙළ පොත්	3,364	1,530
පාසල් නිල ඇඳුම්	1,034	54
දුෂ්කර හා අතිදුෂ්කර පාසල් වල ළමුන් සඳහා පාවහන්	200	2,474
ශිෂ්‍යත්ව- 5 ශ්‍රේණියේ සිසුන්	418	253
මහපොළ සහ ශිෂ්‍යාධාර	1,250	2,405
රාජ්‍ය විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි වූ ශිෂ්‍යයින් සඳහා වූ ණය යෝජනා ක්‍රමය	812	758
පාසල් සහ උසස් අධ්‍යාපන වාර ප්‍රවේශපත්‍ර	4,725	5,900
වෙනත්	134	406
සංවර්ධන සහායයන්		
පොහොර සහ බෝග සහනාධාර	20,398	21,997
වෙනත්	337	3,004
එකතුව	**386,367**	**461,995**

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

(අ) *තාවකාලික*

එමෙන්ම, 2025 වසරේ සිට රජය විසින් 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව දීමනාව රු. 1,500 දක්වාත්, ක්‍රීඩා පාසල්වල ශිෂ්‍යයන් සඳහා ලබාදෙන පෝෂණ ආහාර දීමනාව රු. 10,000 දක්වාත් වැඩි කර ඇත.

ප්‍රාග්ධන වියදම වන රු. බිලියන 4.6, ප්‍රධාන ලෙස ජාතික පාසල් සහ පළාත් පාසල්වල නවීකරණ හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වියදම් කර ඇත.

2.11 වගුව: 2025 වර්ෂයේ ජනවාරි සිට ජූනි දක්වා කාලය තුළ පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වූ වියදම්

රු. මිලියන

විස්තරය	ජන. - ජූනි	
	2024	2025
පුනරාවර්තන වියදම්		
පාසල් ගුරුවරුන් සහ අනෙකුත් කාර්ය මණ්ඩල පුද්ගල පඩිනඩි	135,839	165,975
ජාතික	29,372	33,356
පළාත්	106,467	132,619
සුබසාධන වැඩසටහන්	11,414	16,971
විභාග ඇගයීම් කටයුතු	2,361	3,314
ප්‍රාග්ධන වියදම්		
පාසල් පුනරුත්ථාපන හා යටිතල පහසුකම් සංවර්ධනය	290	362
ගුරු සංවර්ධනය	29	94
සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය	512	52
අධ්‍යාපන විද්‍යාපීඨවල තාක්ෂණ විෂය ධාරාව ස්ථාපිත කිරීම	517	559
පළාත් අධ්‍යාපනය	820	2,873

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

උසස් අධ්‍යාපනය

2024 වසරේ පළමු මාස හයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා වන වියදම රු. බිලියන 45.6 ක් දක්වා සියයට 20.3 කින් වැඩි විය. පුනරාවර්තන වියදම 2024 වසරේ පළමු මාස හයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 37.2 ක් දක්වා සියයට 26.9 කින් වැඩි වූ අතර ප්‍රාග්ධන වියදම රු. බිලියන 8.4 ක් දක්වා සියයට 2.4 කින් අඩු විය.

රජය විසින් විශ්වවිද්‍යාල සිසුන් සඳහා ලබාදෙන මහපොළ ශිෂ්‍යත්ව වාරිකය රු. 5,000 සිට රු. 7,500 දක්වාත් ශිෂ්‍යාධාර වාරිකය රු. 4,000 සිට රු. 6,500 දක්වාත් වැඩි කරමින් 2024 වසරට සාපේක්ෂව රු. බිලියන 2 ක අමතර ප්‍රතිපාදන විශ්වවිද්‍යාල වෙත වෙන් කළ අතර 2025 මුල් මාස හය තුළ ඒ සඳහා දරන ලද සත්‍ය වියදම රු. බිලියන 2.4 ක් විය.

2.12 වගුව : උසස් අධ්‍යාපනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වන වියදම් (2025 ජන. - ජූනි දක්වා)

රු. මිලියන

විස්තරය	ජන. - ජූනි	
	2024	2025[අ]
පුනරාවර්තන වියදම		
විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා පුද්ගල පඩිනඩි ගෙවීම	24,050	29,928
මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම	1,250	2,405
මූලධන වියදම		
විශ්වවිද්‍යාලවල පහසුකම් වැඩිදියුණු කිරීම	1,526	3,089
විද්‍යා සහ තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය - ආසියානු සංවර්ධන බැංකුව)	3,108	4,126
සබරගමුව විශ්වවිද්‍යාලය සඳහා වෛද්‍ය පීඨයක් ස්ථාපිත කිරීම - අදියර ii (ශ්‍රී ලංකා රජය -සෞදි රජය)	472	222
වයඹ විශ්වවිද්‍යාලයේ නගර සංවර්ධන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය - කුවේට් රජය)	163	133
අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති	850	174

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

[අ] තාවකාලික

නිපුණතා සංවර්ධනය හා වෘත්තීය අධ්‍යාපනය

2025 වසරේ පළමු මාස 06 තුළ දී නිපුණතා සංවර්ධනය හා වෘත්තීය අධ්‍යාපනය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 4,334 ක් ද මූලධන වියදම් සඳහා රු. මිලියන 424 ක් ද ලෙස රු. මිලියන 4,758 ක වියදමක් දරන ලදී.

2024 වසරට සාපේක්ෂකව රු .මිලියන 200 ක අමතර ප්‍රතිපාදන වෙන් කරමින් වෘත්තීය අධ්‍යාපනයේ යෙදී සිටින සිසුන් සඳහා හිමි වන "නිපුණතා සිසු දිරිය" මාසික දීමනාව රු. 4,000 සිට රු. 5,000 දක්වා වැඩි කිරීමට 2025 වසරේදී කටයුතු කරන ලද අතර ඒ සඳහා 2025 වසරේ පළමු මාස හය තුළ දරන ලද සත්‍ය වියදම රු .මිලියන 317ක් විය.

විද්‍යා සහ තාක්ෂණය

2025 වසරේ පළමු මාස හය තුළ දී විද්‍යා හා තාක්ෂණය සඳහා රු. මිලියන 1,416 ක සමස්ත වියදමක් දරන ලද අතර එයින් පිළිවෙලින් රු. මිලියන 1,240ක් පුනරාවර්තන වියදම සඳහා ද රු. මිලියන 176 ක් ප්‍රාග්ධන වියදම් සඳහා දරන ලදී.

2: 13 වගුව : නිපුණතා සංවර්ධනය හා ක්ෂේත්‍රයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වෙනුවෙන් දරන ලද වියදම (2025 ජන. - ජුනි දක්වා)

රු.මිලියන

විස්තරය	ජන. - ජුනි	
	2024	2025(අ)
නිපුණතා සංවර්ධනය හා වෘත්තීය අධ්‍යාපනය	2,721	2,810
කාර්මික අධ්‍යාපනය හා පුහුණුව	1,112	1,258
ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණුව ලබා දීම (ශ්‍රී ලංකා රජය - GIZ)	7	221
තාක්ෂණ විද්‍යාල/ කාර්මික විද්‍යාල 7ක් නවීකරණය කිරීම	83	54
ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක වැඩසටහන	70	34
වෘත්තීය පුහුණු කටයුතු වැඩි දියුණු කිරීම	40	3
වෘත්තීය හා තාක්ෂණික පුහුණු සංවර්ධනය	6	8
නිපුණතා සිසු දිරිය ශිෂ්‍යාධාර වැඩසටහන	45	317
වෘත්තීය අධ්‍යාපනය ලබන සිසුන් සඳහා ශිෂ්‍ය වාර ප්‍රවේශපත්‍ර	70	53

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

2.14 වගුව: විද්‍යා හා නවෝත්පාදන ක්ෂේත්‍රයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වෙනුවෙන් දරන ලද වියදම (2025 ජන.-ජුනි දක්වා)

රු. මිලියන

විස්තරය	ජන. - ජුනි	
	2024	2025(අ)
ද්විපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය ගිවිසුම් සහ අනෙකුත් රටවල් සමඟින් විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාවය	0.024	2.4
පර්යේෂණ ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීම	-	0.3

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

සෞඛ්‍ය

2025 වසරේ පළමු මාස හය තුළ පළාත් සභා සහ මධ්‍යම රජයේ සෞඛ්‍ය වියදම් සලකා බැලීමේ දී 2024 වසරේ එම කාල සීමාවට සාපේක්ෂව බටහිර හා දේශීය වෛද්‍ය යන ක්ෂේත්‍ර දෙකෙහි සෞඛ්‍ය සේවාවන් සඳහා වන රජයේ මුළු වියදම එනම් රු. බිලියන 202.7 දක්වා සියයට 20 කින් වැඩි වී ඇත. සමස්ත සෞඛ්‍ය වියදම්වලින් පුනරාවර්තන වියදම රු. බිලියන 190.2 ක් වන අතර මූලධන වියදම රු. බිලියන 12.6 කි. පුනරාවර්තන වියදම් සැලකීමේ දී එහි ප්‍රධාන කාණ්ඩයක් වන වෛද්‍ය සැපයුම් සංරචකය යටතේ ඖෂධ, ශල්‍ය උපකරණ සහ රසායනාගාර උපකරණ සඳහා රු. බිලියන 44.8 ක් වියදම් කර ඇත.

2.15 වගුව : සෞඛ්‍ය අංශයේ ප්‍රධාන කාර්යයන් සඳහා වන වියදම (2025 ජන. - ජුනි දක්වා)

රු. මිලියන

විස්තරය	ජන. - ජුනි	
	2024	2025(අ)
මුළු පුනරාවර්තන වියදම්	**158,091**	**190,152**
සේවා සැපයීමේ වියදම්	85,705	95,953
එයින් වෛද්‍ය නිලධාරීන් සහ කාර්යය මණ්ඩල වැටුප් සඳහා වන වියදම	67,711	75,753
වෛද්‍ය සැපයීම්	28,961	44,793
පළාත් සෞඛ්‍ය	43,425	49,406
රාජ්‍ය ආයෝජන වියදම	**10,569**	**12,620**
වෛද්‍ය උපකරණ	577	2,326
සෞඛ්‍ය පද්ධතීන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය- ආසියානු සංවර්ධන බැංකුව	1,254	903
කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති පෙර සූදානම් කිරීමේ ව්‍යාපෘතිය - (ශ්‍රී ලංකා රජය - ලෝක බැංකුව)	844	-
රේඛීය අමාත්‍යාංශය යටතේ ගැනෙන රෝහල්වල හදිසි ප්‍රතිකාර ඒකක වැඩිදියුණු කිරීම	215	79
ශ්‍රී ලංකාවේ පිළිකා රෝගීන් සඳහා ඉහළ ගුණාත්මකභාවයකින් යුත් අධි ශක්ති විකිරණ ප්‍රතිකාර ලබාදීම	-	495
හෙද පීඨය නේවාසිකාගාරය ඉදිකිරීම	83	83
මහනුවර ජාතික රෝහලේ ඇටමිදුළු බද්ධ කිරීමේ ඒකකයක් ඉදි කිරීම	32	62
රිජ්වේ ආර්යා ළමා රෝහලේ හෘද මධ්‍යස්ථානයක් ඉදිකිරීම	125	184
මොණරාගල දිස්ත්‍රික් මහ රෝහලෙහි තට්ටු පහකින් සමන්විත ශල්‍ය වාට්ටු හා ශල්‍යාගාර සංකීර්ණය ඉදිකිරීම	-	71
බදුල්ල පළාත් මහ රෝහලේ දස මහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම	-	98
වෙනත් මූලධන ආයෝජන වියදම්	4,644	8,006
පළාත් සෞඛ්‍ය ආයෝජන	2,795	396

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

කෘෂිකර්මය

වැව්ලි, පශු සම්පත්, ධීවර හා ඉඩම් සංවර්ධනය යන උප අංශයන් ද ඇතුළත්ව කෘෂිකර්ම අංශය සඳහා 2024 වසරේ පළමු මාස හය තුළ දරා ඇති වියදම වන රු. බිලියන 53.3 ට සාපේක්ෂව එම අංශ සඳහා 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී දරා ඇති වියදම රු. බිලියන 59.4 දක්වා සියයට 11 කින් වැඩිවී ඇත. 2024/25 මහ කන්නය ආරම්භයේ සිට පොහොර සහනාධාරය හෙක්ටයාරයකට රු. 15,000 සිට රු. 25,000 දක්වා වැඩි කිරීම මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. 2025 වසරේ පළමු මාස හය තුළ දරන ලද මුළු වියදමෙන්, රු. බිලියන 21.99 ක් පොහොර සහනාධාර වැඩසටහන සඳහා ද, රු. බිලියන 1.47 ක් වැව්ලි ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ද, රු. මිලියන 812 ක් ධීවර ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ද, රු. මිලියන 455ක් ඉඩම් සංවර්ධනය සඳහා ද, රු. මිලියන 190 ක් කෘෂි භෝග සඳහා ද, ඉතිරිය පශු සම්පත් සංවර්ධනයට සහ කෘෂිකර්ම අංශයට අවශ්‍ය පහසුකම් සැලසීම උදෙසා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ද වැය කර ඇත.

ජල සම්පාදන හා සනීපාරක්ෂාව

සුරක්ෂිත පානීය ජලය සහ ගුණාත්මක සනීපාරක්ෂක සේවා ලබා ගැනීම තහවුරු කිරීම සඳහා රු. මිලියන 8,980 ක වියදමක් 2025 වසරේ පළමු මාස හය තුළ රජය විසින් දරා ඇත. එයින් රු. මිලියන 299 ක් හා රු. මිලියන 8,681 ක් පිළිවෙලින් පුනරාවර්තන වියදම් හා ප්‍රාග්ධන වියදම් වශයෙන් වැය කර ඇත. සමස්ත ජනතාවට සුරක්ෂිත පානීය ජලය ලබා දීම සහතික කිරීම සඳහා නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම, නව ජල සම්පාදන යෝජනා ක්‍රම ඇති කිරීම සහ දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති කඩිනම් කිරීම අරමුණු කරගත් ධාරිතා වැඩි දියුණු කිරීමේ හා බෙදාහැරීම් පුළුල් කිරීමේ ජාතික වැඩසටහන 2025 වසර තුළ ද ක්‍රියාත්මක වේ.

මාර්ග සහ පාලම්

2025 වසරේ මුල් මාස හය තුළ මාර්ග සහ පාලම් සඳහා වියදම රු. මිලියන 77,874 ක් වන අතර එය පෙර වසරේ අදාළ කාල පරිච්ඡේදයට සාපේක්ෂව සියයට 18.0 ක පමණ අඩුවීමකි.

වියදම් විශ්ලේෂණයේ දී අධිවේගී මාර්ග සංවර්ධනය සඳහා වන වියදම රු. මිලියන 20,608 සිට රු. මිලියන 15,793 දක්වා අඩු වී ඇති බව පෙනේ. මේ තුළ මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා වන වියදම් ප්‍රමුඛස්ථානය ගන්නා අතර කුළුණු මත ඉදි කෙරෙන වරාය පිවිසුම් අධිවේගී මාර්ගය ඇතුළු අනෙකුත් අධිවේගී මාර්ග ව්‍යාපෘති සැලකිය යුතු ලෙස අඩු වියදම් වාර්තා කර ඇත.

සමස්ත මාර්ග සංවර්ධන ප්‍රගතිය ස්ථාවරව පැවතීම සඳහා උප වැඩසටහන් අතර ප්‍රතිපාදන නැවත වෙන් කිරීම සැලකිය යුතු ලෙස හේතු වී ඇත. විශේෂයෙන් මාර්ග නඩත්තුව සහ වැඩිදියුණු කිරීමේ වියදම කැපී පෙනෙන වැඩිවීමක් පෙන්නුම් කළ අතර එය පවතින මාර්ග ජාලය සංරක්ෂණය කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ ප්‍රගතිය තහවුරු කරයි. අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය ද පෙර වසරට සාපේක්ෂව වැඩි ප්‍රගතියක් වාර්තා කර ඇත.

පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීමේ කටයුතු වඩාත් වැදගත් ක්ෂේත්‍රවලින් එකක් වන අතර එම ව්‍යාපෘතිවල වියදම දෙගුණයකට වඩා වැඩි වී තිබේ. කොම්පඤ්ඤවීදිය දුම්රිය ස්ථානය අසල සහ උත්තරානන්ද මාවතෙහි දුම්රිය මාර්ගයට ඉහළින් ගුවන් පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ. අනෙකුත් කුඩා පාලම් ව්‍යාපෘතිවල ප්‍රගතිය ද ක්‍රමයෙන් වැඩි වී ඇති නිසා මෙම අංශයේ සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කරයි.

එමෙන්ම, මාර්ග ප්‍රතිසංස්කරණය සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය බැංකුවලින් මාර්ග සංවර්ධන අධිකාරිය ලබාගත් ණය සඳහා පොළී සහ ප්‍රාග්ධන ආපසු ගෙවීම වෙනුවෙන් මුළු වියදමෙන් වැඩිම කොටසක් දරා ඇති අතර එය ආසන්න ලෙස රු. මිලියන 29,526 කි.

ප්‍රවාහන

2024 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2025 වසරේ මුල් මාස හය තුළ ප්‍රවාහන අංශය සඳහා රජයේ වියදම සියයට 12.0 කින් රු. බිලියන 30.8 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර, එයින් රු. බිලියන 22.3 ක් සහ රු. බිලියන 8.5 ක් පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා පිළිවෙලින් වැය කර ඇත. 2024 වසරේ මුල් මාස හයට සාපේක්ෂව 2025 වසරේදී මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය ඉදිකිරීමේ ප්‍රගතිය ද සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේ.

2025 වසරේ මුල් මාස හය තුළ, කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය සහ මහව සිට ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළු ප්‍රධාන යටිතල පහසුකම් සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව රුපියල් බිලියන 6.2 ක් වැය කළේය. මෙම වියදම දුම්රිය ජාලයේ සුළු හා ප්‍රධාන අලුත්වැඩියාවන් සමඟ පවතින දුම්රිය මාර්ග නඩත්තු කිරීම ද ආවරණය කළේය.

2025 වසරේ මුල් භාගයේදී බස් ප්‍රවාහනය සඳහා වියදම රු. බිලියන 7 කි. මෙම වියදම ආර්ථික වශයෙන් ලාභ නොලබන මාර්ගවල ශ්‍රී ලංගම බස් රථ ධාවනය කිරීම සහ පාසල් සහ උසස් අධ්‍යාපන වාර ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම වැනි සුභසාධන සේවාවන් සඳහා වැය කරන ලදී. මෝටර් රථ ප්‍රවාහන පනත ක්‍රියාත්මක කිරීම සඳහා මෙම කාලය තුළ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව රු. බිලියන 0.98 ක් වියදම් කර ඇත.

2.16 වගුව : මාර්ග සහ පාලම් සඳහා වියදම් (2025 ජන. - ජුනි දක්වා)

රු. මිලියන

	ව්‍යාපෘතිය / වැඩසටහන	ජන.- ජුනි(අ)	
		2024	2025 (අ)
1	**අධිවේගී මාර්ග සංවර්ධනය**	**20,608**	**15,793**
	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය	14,427	14,577
	කොළඹ - රත්නපුර - පැල්මඩුල්ල අධිවේගී මාර්ගය	1,787	523
	කණු මතින් දිවෙන නව කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා වන අධිවේගී මාර්ගය	-	3
	කණු මත දිවෙන වරාය පිවිසුම් අධිවේගී මාර්ගය	3,894	690
	දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය	500	-
2	**මාර්ග සංවර්ධනය**	**25,551**	**25,054**
	මාර්ග නඩත්තුව හා වැඩි දියුණු කිරීම	7,192	11,000
	කොළඹ දිස්ත්‍රික් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය	792	777
	බස්නාහිර පළාත් ජාතික මහාමාර්ග ව්‍යාපෘතිය	368	124
	ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන	3,220	2,913
	A 17 මාර්ග කොටස පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය (රක්වාන - සූරියකන්ද)	394	378
	අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය	2,652	3,830
	ප්‍රධාන මාර්ග හා අධිවේගී මාර්ග වෙත ප්‍රවේශය සඳහා සහ මාර්ග තදබදය අවම කිරීම සඳහා විකල්ප මාර්ග පද්ධතියක් සංවර්ධනය කිරීම	9,095	5,588
	අනෙකුත් මාර්ග සංවර්ධනය	1,838	444
3	**මාර්ග පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීම**	**344**	**704**
4	**පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම**	**1,257**	**3,174**
	ජාතික මාර්ග ජාලයේ හානි වූ සහ දුර්වල පාලම් පුනරුත්ථාපනය	106	230
	පරණ පාලම් කොටස් යොදා ගනිමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම	125	151
	කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් දෙකක් සැලසුම් කොට ඉදිකිරීම	97	81
	කොම්පඤ්ඤවීදිය දුම්රිය ස්ථානය අසල සහ උත්තරානන්ද මාවතෙහි දුම්රිය මාර්ගයට ඉහළින් ගුවන් පාලම් ඉදිකිරීම	829	2576
	ජාතික මහාමාර්ගයන්හි පාලම් 25 ක් ප්‍රතිසංස්කරණය කිරීම	100	136
5	**"මග නැගුම" ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන**	**915**	**388**
6	**ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම (ප්‍රමුඛ මාර්ග ව්‍යාපෘති හැර අනෙකුත් ව්‍යාපෘති)**	**3,128**	**3,235**
7	**මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය හිඟය පියවීම සඳහා ලබා දුන් මූල්‍ය දායකත්වය**	**43,145**	**29,526**
8	**අනෙකුත්**	**-**	**-**
	එකතුව	**94,948**	**77,874**

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

නිවාස සංවර්ධනය

නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන නාගරික පුනර්ජීවන වැඩසටහන යටතේ නිවාස ඉදිකිරීම, ගැටුම්වලින් පීඩාවට පත් වූ පවුල් නැවත පදිංචි කිරීම/ ස්ථිර නිවාස ලබා දීම, "සැමට නිවහන" නිවාස වැඩසටහන, චීන ආධාර වැඩසටහන යටතේ අඩු අදායම්ලාභී පුද්ගලයින් සඳහා නිවාස ඒකක 2,000 ක් ඉදිකිරීම සහ වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ඉන්දියන් ආධාර වැඩසටහන යටතේ නිවාස ඒකක 10,000 ක් ඉදිකිරීම හා වතු නිවාස වැඩසටහන ද ඇතුළත්ව 2025 වසරේ පළමු මාස හය තුළ නිවාස ඉදිකිරීම් හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් රජය විසින් රු. මිලියන 5,506 ක් වැය කර ඇත.

නාගරික සංවර්ධන

2025 වසරේ පළමු මාස හය සඳහා නාගරික සංවර්ධනය වෙනුවෙන් රජය විසින් රු. මිලියන 1,252 ක් වැය කර ඇත. එයින් රු. මිලියන 526 ක් පුනරාවර්තන වියදම් ලෙසත්, මහ කොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය, උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (අනුරාධපුර), සියක් නගර වැඩසටහන, වේරැස් ගඟ වැසි ජල අපවහන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය හා මහ කොළඹ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ද අතුළත්ව රු. මිලියන 726 ක් ප්‍රාග්ධන වියදම් ලෙසත් වැය කර ඇත.

පරිසරය

2025 වසරේ පළමු මාස හය තුළ පාරිසරික අංශය සඳහා රජය විසින් දරන ලද සමස්ත වියදම රු.

බිලියන 5.2 ක් වන අතර, එයින් රු. බිලියන 4.8 ක් පුනරාවර්තන වියදම් සහ රු. මිලියන 401 ක් ප්‍රාග්ධන වියදම් වේ. මෙම වියදම තුළ රු. මිලියන 68 ක් පරිසර සංරක්ෂණයටත්, රු. මිලියන 175 ක් වන ආවරණය පුළුල් කිරීම සහ වන ආරක්ෂණය සඳහාත්, රු.මිලියන 158 ක් විදුලි වැට ඉදි කිරීම ඇතුළු අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහාත් වැය කර ඇත.

මෙයට අමතරව, වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණය සම්බන්ධ ප්‍රධාන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 23 ක් වැය කර ඇති අතර, රු. මිලියන 38 ක් සහ රු. මිලියන 17 ක් පිළිවෙලින් සත්වෝද්‍යාන සහ උද්භිද උද්‍යාන සංවර්ධනය ආශ්‍රිත ප්‍රධාන කටයුතු සඳහා වැය කරන ලදී. ඉතිරි වියදම් පරිසරය සුරැකීම සඳහාත්, වනජීවී, වන සම්පත් හා වෙරළ සංරක්ෂණය සඳහාත් සහ සත්වෝද්‍යාන හා උද්භිද උද්‍යාන සංවර්ධනය සඳහාත් වූ වැඩසටහන් සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ආශ්‍රිත මෙහෙයුම් හා පරිපාලන කටයුතු වෙනුවෙන් දරා ඇත.

වාරිමාර්ග හා ජල කළමනාකරණය

2025 වසරේ පළමු මාස හය තුළ වාරිමාර්ග හා ජල කළමනාකරණය සඳහා වන වියදම රු. බිලියන 13.8 ක් වූ අතර මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන සඳහා රු. බිලියන 9.0 ක් වැය කර ඇත. ඉතිරි රු. බිලියන 4.8, අමාත්‍යාංශය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ වාරිමාර්ග පද්ධති සංවර්ධනය හා වැඩිදියුණු කිරීම සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලදී.

2.4 භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය

2025 පළමු භාගයේ දී ලැබූ කැපී පෙනෙන ජයග්‍රහන අනුව ආදායම් එකතු කිරීම නංවාලීම සඳහා රජය දරනු ලැබූ සාමූහික ප්‍රයත්නය සැළකිය යුතු හා ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල ලබා දී ඇති බව පැහැදිළිය. මෙම කාලපරිච්ඡේදය තුළ මුදල් ප්‍රවාහයන්හි ධනාත්මක ගමන් මග හේතුවෙන් භාණ්ඩාගාරය විසින් සාම්ප්‍රදායිකව මුහුණ දෙන මූල්‍ය අභියෝග වලට සාර්ථකව මුහුණ දීම පමණක් නොව, ආදායම් උත්පාදනය කරන ආයතනවල කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම අරමුණු කරගත් මෑත කාලීන ප්‍රතිසංස්කරණවල කාර්යක්ෂමතාව මැනවින් තහවුරු කර ඇත. විශේෂයෙන්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව වැනි ආයතන ඔවුන්ගේ පූර්ව නිශ්චිත ආදායම් ඉලක්ක ඉක්මවා යාමෙන් ප්‍රශංසනීය කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇති අතර, එමඟින් මූල්‍ය විනය සහ උපායමාර්ගික සැලසුම්කරණය සඳහා දැක්වූ දායකත්වය පිළිබිඹු වේ. ආදායම් ඉහළ යාම හේතුවෙන්, සමුච්චිත මුදල් සංචිතවලින් සැලකිය යුතු කොටසක් ණය සේවාකරණ බැඳීම් සඳහා වෙන් කිරීමට භාණ්ඩාගාරයට හැකියාව ලැබී ඇති අතර, එමඟින් බාහිර ණය ගැනීම් මත යැපීම අඩු කර වඩාත් තිරසාර මූල්‍ය පරිසරයක් ගොඩනැගීමට හැකි වී ඇත.

එනමුත්, රජයේ ඇමරිකානු ඩොලර් ආදායමේ හිඟය හේතුවෙන් විදේශ ණය ආපසු ගෙවීම් සම්බන්ධයෙන් ගැටළුකාරී තත්වයක් ඇති විය. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙම බැඳීම් ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ඇමරිකානු ඩොලර් ලබා ගැනීම සඳහා මුදල් ප්‍රවාහ ස්වාරක්ෂකය භාවිතා කරන ලදී. මීට අමතරව, අන්තර්ජාතික මූල්‍ය අරමුදලේහි සිව්වන වාරිකය ලෙස ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 350 ක් ලැබීම ඇමරිකානු ඩොලර් ද්‍රවශීලතා පීඩනය සමනය කිරීමට සැලකිය යුතු ලෙස දායක වූ අතර එමඟින් භාණ්ඩාගාරයේ මුදල් ප්‍රවාහය පවත්වා ගැනීමට සහාය විය. මෙම සිදුවීම් මාලාව බාහිර ණය සේවාකරණ බැඳීම් පවත්වා ගැනීම සඳහා බාහිර මූල්‍ය ආධාර වල අවශ්‍යතාව ඉස්මතු කරන අතර සීමිත විදේශ විනිමය සංචිත සන්දර්භය තුළ උපායමාර්ගික ද්‍රවශීලතා කළමනාකරණයේ වැදගත්කම අවධාරණය කරයි.

2.17 වගුව : රජයේ මුදල් ප්‍රවාහ ක්‍රියාකාරිත්ව ප්‍රකාශය (2025 ජන.- ජුනි)

රු. බිලියන

අයිතමය	ජනවාරි - ජුනි		
	2024	2025	
	තත්‍ය	ඇස්තමේන්තු	තාවකාලික
ආරම්භක මුදල් ශේෂය	599.5	805.1	805.1
ආදායම් හා වෙනත් ලැබීම් මගින් සමස්ථ මුදල් ගලා ඒම	1,812.3	2,267.9	2,275.1
මෙහෙයුම් ක්‍රියාකාරකම් වල සමස්ථ මුදල් ගලා යෑම්	-2,265.5	-2,918.9	-2,413.1
ආයෝජන කටයුතු සඳහා සමස්ථ මුදල් ගලායාම්*	-379.3	-450.9	-211.1
ශුද්ධ මුදල් අතිරික්තය / (හිඟය)	-832.6	-1,101.8	-349.2
දළ ණය ගැනීම් භාවිතය *	1,665.3	1,681.9	1,675.9
ණය ආපසු ගෙවීම්	-749.0	-763.3	-945.2
ශුද්ධ ණය ගැනීම් භාවිතය	916.4	918.6	730.7
පෙර වසරේ වාණිජ ණය ගැණීම් ශේෂය	-	-	-
ගැලපීම් ගිණුමේ ශේෂය (TED/ ශුද්ධ තැන්පතු යනාදිය)	-36.6	-	-106.9
අවසාන මුදල් ශේෂය	646.7	621.8	1,079.7

මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

* *භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2025 ජුනි 30 දිනට ගිණුම්ගත කරන ලද ව්‍යාපෘති / වැඩසටහන් ණය ඇතුළත් වේ.*

ඒ සමඟම, බැංකු අංශයේ වැඩිදියුණු වූ ද්‍රවශීලතා තත්ත්වය මගින් දේශීය මුදල් සහ ප්‍රාග්ධන වෙළඳපොළ තුළ සංසරණය වන අතිරික්ත ද්‍රවශීලතාවය හේතුවෙන් ස්ථාවර පොලී අනුපාත පවත්වා ගැනීමට හැකි වූ අතර එමඟින් අඛණ්ඩ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහාය විය. මේ අනුව, ඉහළ මුදල් සංචිතයක් සහිතව 2025 වර්ෂයේ ආරම්භය සනිටුහන් කර ඇති අතර, එය නව්‍ය ප්‍රතිපත්ති පියවරයන් සහ පරිපාලන උත්සාහයන්ගේ ක්‍රියාශීලී බව පෙන්නුම් කරයි. තවද, වැඩිදියුණු කළ ආදායම් මාර්ග හරහා ජනනය වන අතිරික්ත මුදල්, (වෙළඳපල අස්ථාවරත්වය අවම කිරීම සහ ද්‍රවශීලතා ප්‍රමාණවත් බව සහතික කිරීම අපේක්ෂා කෙරේ) විකල්ප අරමුදල් විධිවිධානයක් ලෙස කරවීමට, රාජ්‍ය බැංකු ආයතන වෙත යොමු කර ඇත.මෙම උපායමාර්ගික සංචිතය වසරේ මුල් මාස හය තුළ දේශීය හා විදේශීය ගෙවීම් බැඳීම් සපුරාලීම සඳහා සක්‍රීයව භාවිතා කර ඇත මෙම වර්ධනයන්, සමස්තයක් වශයෙන්, තිරසාර වර්ධනය, විචක්ෂණශීලී සම්පත් වෙන් කිරීම සහ ආර්ථික අවිනිශ්චිතතාවයන් හමුවේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නංවමින් මූල්‍ය කළමනාකරණය සඳහා ක්‍රියාශීලී සහ ඉදිරි දැක්මක් සහිත ප්‍රවේශයක් පෙන්නුම් කරනු ලබයි.

ඒ අනුව, 2025 වසරේ මුල් මාස හය තුළ, ආදායම සහ අනෙකුත් ලැබීම් මගින් මහා භාණ්ඩාගාරයට මුදල් ගලා ඒම රු. බිලියන 2,275.1 ක් වූ අතර, ඇස්තමේන්තුගත රු. බිලියන 2,267.9 ට සාපේක්ෂව එය ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 100.3 ක් විය. මේ අතර, 2025 වසරේ මුල් මාස හය තුළ, පුනරාවර්තන සහ රාජ්‍ය ආයෝජන සඳහා මුදල් පිටතට ගලායාම රු. බිලියන 2,624.3 ක් වූ අතර එය ඇස්තමේන්තුගත රු. බිලියන 3,369.8 ට සාපේක්ෂව සියයට 77.9 ක් විය. තවද, පුනරාවර්තන වියදම් සඳහා මුදල් පිටතට ගලායාම, 2024 වර්ෂයේ එම කාලය හා සැසඳීමේදී රු. බිලියන 2,265.5 ට සාපේක්ෂව සියයට 6.5 ක වැඩිවීමක් පිළිබිඹු කරයි. මෙම වියදම් වැඩිවීමට ප්‍රධාන හේතුව වුයේ වැටුප් වැඩිවීම් සහ සමාජ ප්‍රතිලාභ වියදම් ඉහළ යාමයි.

2025 වසරේ ජූනි 30 දින වන විට මුළු මුදල් හිඟය රු. බිලියන 349.2 ක් වූ අතර එය 2024 වසරේ ජූනි මස අවසානයේ පැවති රු. බිලියන 832.6 ක හිඟයට සාපේක්ෂව සියයට 58.1 ක අඩුවීමක් පිළිබිඹු කරයි. එයට ප්‍රධාන වශයෙන් 2025 වසරේ පළමු භාගය තුළ ආදායම සහ අනෙකුත් ලැබීම් සියයට 25.5 කින් වැඩිවීම හේතු විය. පුනරාවර්තන සහ රාජ්‍ය ආයෝජන සඳහා මුදල් පිටතට ගලායාම සහ මුළු ණය ගැනීම් වල සැලකිය යුතු විචලනයක් පිළිබිඹු නොකළද, ණය ආපසු ගෙවීම පෙර වසරට සාපේක්ෂව සියයට 26.2 කින් ඉහල ගොස් ඇත. මෙය ප්‍රධාන වශයෙන් සිදුවී ඇත්තේ වැඩි වූ ආදායමෙන් කොටසක් ණය සේවා ගෙවීම් සඳහා භාවිතා කිරීම නිසා වන අතර ඒවා වෙළඳපොළ ණය ගැනීම් හරහා මූල්‍යකරණය කිරීමට වෙන් කිරීමයි. ඒ අනුව, 2025 වසරේ පළමු මාස හය අවසන් වන විට ධනාත්මක මුදල් ශේෂය රු.බිලියන 1,079.7 ක් ලෙස ඉහල නංවා ගැනීමට හැකිවිය.

2.5 රාජ්‍ය ණය කළමනාකරණය

2025 මූල්‍ය වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද මුළු දළ ණය ගැනීමේ සීමාව රු. බිලියන 4,000 ක් වන අතර, එයින් රු. බිලියන 1,494.5 ක් 2025 ජනවාරි 1 සිට ජූනි 30 දක්වා වූ කාලය සඳහා වෙන් කරන ලදී. මෙම ණය ගැනීම් තුල දේශීය හා විදේශීය මූලාශ්‍ර දෙකම ඇතුළත් වූ අතර එය පිළිවෙලින් රු. බිලියන 1,357.3 ක් සහ රු. බිලියන 137.5 ක් විය. මෙම ණය ගැනීම්වල මූලික අරමුණු වූයේ ණය සේවා බැඳීම් සඳහා මුදල් සැපයීම සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා සහාය වීමයි.වාර්තා කරන ලද දිනය වන විට, 2025 වසරේ පළමු භාගයේ මුළු ණය ගැනීම්වලින් ආසන්න වශයෙන් සියයට 90.8 ක් දේශීය මූලාශ්‍ර වලින් වශයෙන් ලබා ගන්නා ලදී. භාණ්ඩාගාර බැඳුම්කර දේශීය ණය සේවා ගෙවීම් සඳහා පමණක් භාවිතා කරන ලදී.

රජය අනුමත ණය ගැනීමේ සීමාව භාවිතා කරමින් 2025 ජනවාරි 1 සිට ජූනි 30 දක්වා, රු. බිලියන 1,357.3 ක් රැස් කල අතර, එය ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බැඳුම්කර හරහා ණය ගැනීම් පිළිබිඹු කරයි. මෙම කාලපරිච්ඡේදය තුළ භාණ්ඩාගාර බිල්පත් වල පෙනෙන සෘණ ශුද්ධ නිකුත් කිරීම, රු. බිලියන 149.8 ක් වූ අතර එයින් පෙන්නුම් කරන්නේ නව නිකුත් කිරීම් ඉක්මවා පිටතට ගලා යාම සිදු වී ඇති බවයි. එනම් භාණ්ඩාගාර බිල්පත් ආපසු ගෙවීම්වල හිඟ ප්‍රමාණය මූල්‍යනය කිරීම සඳහා භාණ්ඩාගාර මුදල් ප්‍රවාහය යොදා ගත් බවයි.

2.18 වගුව : දේශීය ණය ගැනීම (2025 ජන - ජූනි)

ණය මෙවලම	රු. බිලියන
භාණ්ඩාගාර බැඳුම්කර (දළ ණය ගැනීම්)	1,357.3
එකතුව	1,357.3

මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

2.19 වගුව : දේශීය ණය ගැනීම (2025 ජන - ජූනි)

ණය මෙවලම	රු. බිලියන
භාණ්ඩාගාර බිල්පත් (ශුද්ධ)	(149.8)
එකතුව	**(149.8)**

මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

2.20 වගුව : 2025.06.30 දිනට භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති බැංකු ඇපකර හා සහන ලිපි හිඟ වටිනාකම් ලැයිස්තුව

අනු අංකය	බැංකුවේ හෝ ආයතනයේ නම	ආයතනයේ නම	2025.06.30 දිනට නිකුත් කර ඇති වටිනාකම (රු. මිලි.)		2025.06.30 දිනට ශේෂය (රු. මිලි.)	
1	ආසියානු සංවර්ධන බැංකුව	ලංකා විදුලිබල මණ්ඩලය	119,986.96	134,985.33	90,452.17	105,450.54
		ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	14,998.37		14,998.37	
2	ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව	ලංකා බැංකුව සහ මහජන බැංකුව	53,994.13	53,994.13	29,996.74	29,996.74
3	ලංකා බැංකුව	සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව	500.00	428,127.85	500.00	299,152.05
		ලංකා විදුලිබල මණ්ඩලය	4,540.00		1,239.54	
		ලංකා ධීවර සංස්ථාව	250.00		158.62	
		ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	100,000.00		77,724.75	
		ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය	835.00		35.83	
		ජනතා වතු සංවර්ධන මණ්ඩලය	200.00		80.21	
		ලංකා කෝල් කම්පැණි පුද්ගලික සමාගම	49,500.00		13,087.29	
		සීමාසහිත ජාතික ව්‍යාපාර කළමණාකාරීත්ව විද්‍යායතනය	8,600.00		5,225.00	
		ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	65,395.67		39,349.88	
		නෝර්ත් සී ලිමිටඩ්	38.63		37.41	
		මාර්ග සංවර්ධන අධිකාරිය	147,102.33		110,746.31	
		ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව	93.00		30.20	
		ශ්‍රී ලංකා එයාර් ලයින්ස් ලිමිටඩ්	44,396.58		44,396.58	
		රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව	1,126.81		990.61	
		රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව	2,400.00		2,399.99	
		මිහින් ලංකා ලිමිටඩ්	3,149.84		3,149.84	
4	චීන සංවර්ධන බැංකුව	ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	49,497.80	49,497.80	60,209.46	60,209.46
5	චයිනා නැෂනල් කෙමිකල් ඉංජිනියරින් අංක.14 කන්ස්ට්‍රක්ෂන් කම්පැනි ලිමිටඩ්	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	13,131.07	13,131.07	7,100.23	7,100.23
6	කොමර්ෂල් බැංකුව	ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	968.36	5,724.29	492.21	5,248.14
		මාර්ග සංවර්ධන අධිකාරිය	4,755.93		4,755.93	
7	ඩී.බී. ට්‍රස්ටීස් හොංකොං ලිමිටඩ්	ශ්‍රී ලංකා එයාර් ලයින්ස් ලිමිටඩ්	52,494.30	52,494.30	52,494.30	52,494.30
8	ඩී-එෆ්-සී-සී- බැංකුව	ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	6,026.24	11,922.75	3,339.63	8,149.18
		මාර්ග සංවර්ධන අධිකාරිය	5,896.51		4,809.55	
9	ඉන්දියා එක්සිම් බැංකුව	ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	77,001.63	77,001.63	46,803.91	46,803.91
10	හැටන් නැෂනල් බැංකුව	සී / ස ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම	4,000.00	43,578.26	4,000.00	31,623.28
		ලංකා විදුලිබල මණ්ඩලය	3,690.85		215.98	
		ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	15,754.26		7,274.15	
		මාර්ග සංවර්ධන අධිකාරිය	20,133.15		20,133.15	
11	හොංකොන් ඇන්ඩ් ෂැංහයි බැංකුව	සී / ස ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම	13,239.95	13,239.95	8,849.04	8,849.04
12	චීනයේ කර්මාන්ත හා වාණිජ බැංකුව	ලංකා විදුලිබල මණ්ඩලය	12,590.35	12,590.35	7,958.14	7,958.14
13	අයි.එන්.ජී. බැන්ක්, එන් වී ඔෆ් නෙදර්ලන්ඩ්ස්	ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	29,177.65	29,177.65	25,086.23	25,086.23
14	ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA)	ශ්‍රී ලංකා එයාර් ලයින්ස් ලිමිටඩ්	3,479.62	3,479.62	3,479.62	3,479.62

අනු අංකය	බැංකුවේ හෝ ආයතනයේ නම	ආයතනයේ නම	**2025.06.30** දිනට නිකුත් කර ඇති වටිනාකම (රු. මිලි.)		**2025.06.30** දිනට ශේෂය (රු. මිලි.)	
15	ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය	සී / ස ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම	154,820.16	154,820.16	55,710.45	55,710.45
16	ජාතික සංවර්ධන බැංකුව	ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	21,380.43	27,679.63	14,471.89	20,771.73
		මාර්ග සංවර්ධන අධිකාරිය	6,299.21		6,299.84	
17	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	ලංකා විදුලිබල මණ්ඩලය	5,000.00	190,272.35	3,500.00	172,760.14
		ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය	33,896.09		31,474.94	
		ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	32,710.61		27,106.37	
		මාර්ග සංවර්ධන අධිකාරිය	114,415.66		108,994.82	
		ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව	3,500.00		934.01	
		ටෙක්නො පාර්ක් ඩිවලොප්මන්ට්	750.00		750.00	
18	මහජන බැංකුව	ලංකා විදුලිබල මණ්ඩලය	15,333.33	175,718.35	10,527.07	134,779.54
		ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	2,317.25		1,505.84	
		සීමාසහිත ලංකා නැව් සංස්ථාව	21,570.80		14,263.45	
		ලංකා සතොස ලිමිටඩ්	5,241.00		4,734.02	
		ජාතික කඩදාසි සංස්ථාව	140.00		48.53	
		ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	7,245.93		3,366.15	
		වී අලෙවි මණ්ඩලය	751.99		751.99	
		මාර්ග සංවර්ධන අධිකාරිය	56,791.60		41,815.73	
		ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව	3,599.61		3,599.61	
		ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාව	100.00		81.90	
		ශ්‍රී ලංකා එයාර් ලයින්ස් ලිමිටඩ්	57,562.01		50,284.49	
		රාජ්‍ය මුද්‍රණ සංස්ථාව	1,165.00		-	
		ටෙක්නො පාර්ක් ඩිවලොප්මන්ට්	750.00		750.00	
		මිහින් ලංකා ලිමිටඩ්	3,149.84		3,050.76	
19	ඉන්දියානු සංචිත බැංකුව	ශ්‍රී ලංකා මහ බැංකුව	330,392.77	330,392.77	330,392.77	330,392.77
20	සම්පත් බැංකුව පී.එල්.සී.	මාර්ග සංවර්ධන අධිකාරිය	14,500.00	14,500.00	9,886.36	9,886.36
21	සීමාසහිත ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව	නෝර්ත් සී ලිමිටඩ්	60.00	60.00	55.36	55.36
22	යුනික්‍රෙඩිට් බැංක් ඔස්ට්‍රියා ඒජී	ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	17,798.14	17,798.14	14,351.07	14,351.07
23	වී අලෙවි මණ්ඩලය	සමුපකාර තොග ආයතනය	880.00	880.00	729.60	729.60
24	අපනයන සංවර්ධන මණ්ඩලය	ලංකා බැංකුව හා මහජන බැංකුව	60.00	60.00	60.00	60.00
		එකතුව	**1,841,126.39**	**1,841,126.39**	**1,431,097.85**	**1,431,097.85**

මූලාශ්‍රය : රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

3 වන පරිච්ඡේදය

රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යසාධනය

3.1 සමාලෝචනය

ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 විසින් 2024 වසරේ පළමු මාස හය තුළ වාර්තා කළ රු. බිලියන 280.7 ක සමස්ත ලාභයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 227.8 ක සමස්ත ලාභයක් වාර්තා කරමින් මිශ්‍ර කාර්යසාධනයක් වාර්තා කර ඇත. විශාලතම රාජ්‍ය බැංකු තුන වන ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව එක්ව ඔවුන්ගේ ලාභදායිත්වය රු. බිලියන 65.5 කින් වැඩි කර ගෙන ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ සේවක භාරකාර අරමුදල් මණ්ඩලයේ කාර්යසාධනය වැඩිවීම තුළින් 2024 වසරේ පළමු මාස හයට සාපේක්ෂව සාමූහිකව රු. බිලියන 16 කට ආසන්න අතිරේක ලාභයක් එකතු කිරීම මඟින් මේ සඳහා තවදුරටත් සහායක් ලැබී ඇත. කෙසේ වෙතත්, 2024 වසරේ පළමු මාස හය තුළ වූ රු. බිලියන 119.2 ක ලාභයට එරෙහිව 2025 වසරේ පළමු මාස හය තුළ ලංකා විදුලිබල මණ්ඩලය රු. බිලියන 13.2 ක අලාභයක් වාර්තා කිරීම හරහා රාජ්‍ය ව්‍යවසායය අංශයේ සමස්ත ලාභදායිත්වය සැලකිය යුතු ලෙස සීමා විය.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය වාණිජ ව්‍යවසායයන් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීමේ රජයේ පුළුල් අරමුණ ප්‍රකාරව රාජ්‍ය වාණිජ ව්‍යාපාර කළමනාකරණ පනතක් හඳුන්වා දීමට අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දුන් අතර, ඒ අනුව, මූලික කෙටුම්පත සමාලෝචනය කිරීම සඳහා 2025 වසරේ අප්‍රේල් මාසයේදී අමාත්‍ය මණ්ඩල කමිටුවක් පත් කරන ලදී. අමාත්‍ය මණ්ඩල කමිටු වාර්තාව මත පදනම්ව, 2025 වසරේ ජූනි මාසයේදී, රාජ්‍ය වාණිජ ව්‍යවසාය කළමනාකරණ පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. ඉහළ ප්‍රමිති ගත පාලනය, වගවීම හා විග්‍රහණයට යටත්ව මෙම ප්‍රතිසංස්කරණ සිදු වන අතර, මෙමඟින් සියලුම රාජ්‍ය වාණිජ ව්‍යවසායයන් වෘත්තීයමය වශයෙන්, ස්වාධීනව, ඵලදායීව සහ වාණිජ මූලධර්මවලට අනුකූලව කළමනාකරණය කිරීමට අපේක්ෂා කෙරේ. තවද, රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳ සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද කමිටුවක් විසින් රාජ්‍ය ව්‍යවසායයන් සමාලෝචනය කර ආයතන කිහිපයක් වසා දැමීම, ඒකාබද්ධ කිරීම ඇතුළු ප්‍රතිසංස්කරණ සඳහා දැනටමත් නිර්දේශ ලබා දී ඇත.

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද රාජ්‍ය බැංකු ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තියට අනුකූලව, රාජ්‍ය බැංකු සඳහා ස්වාධීන අධ්‍යක්ෂවරුන් තෝරා ගැනීම සඳහා පත් කරන ලද වෘත්තිකයන්ගෙන් සමන්විත කමිටුව විසින් 2025 වසරේ ජූලි මාසයේදී සියලුම රාජ්‍ය බැංකු සඳහා ඔවුන්ගේ නිර්දේශ ඉදිරිපත් කර ඇත. මේ අතර, 2025 වසරේ අගෝස්තු මාසයේදී, 2025 අංක 14 දරණ ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත සහතික කිරීමත් සමඟ බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ක්‍රියාත්මක වේ. මෙම ප්‍රතිසංස්කරණ මඟින් බලශක්ති ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ වගවීම වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් 2024 වසරේ පළමු මාස හය තුළ අයබදු සහ ලාභාංශ එකතු කිරීම රු. බිලියන 14.9 ක් වූ අතර, එය 2025 වසරේ පළමු මාස හය තුළ රු. බිලියන 11.7 ක් දක්වා අඩු වී ඇත.

3.2 රජය සතු ප්‍රධාන ව්‍යාපාර දහය පිළිබඳ සමාලෝචනය

ලංකා බැංකුව

2024 වසර අවසානය වන විට රු. බිලියන 4,985 ක් වූ ලංකා බැංකුවේ වත්කම් පදනම 2025 වසරේ ජූනි මස අවසානය වන විට රු. බිලියන 5,290 ක් දක්වා ආන්තික වශයෙන් ඉහළ ගොස් ඇත. 2024 වසර අවසානය වන විට රු. බිලියන 2,178 ක් වූ ණය සහ අත්තිකාරම් 2025 වසරේ ජූනි මස අවසානය වන විට රු. බිලියන 2,216 ක් දක්වා ආන්තික වශයෙන් ඉහළ ගොස් ඇත. 2024 වසර අවසානය වන විට රු. බිලියන 4,208 ක් වූ ලංකා බැංකුවේ තැන්පතු පදනම 2025 වසරේ ජූනි මාසය අවසානය වන විට තුළ රු. බිලියන 4,429 ක් දක්වා සියයට 5.2 කින් ඉහළ ගොස් ඇත. 2024 වසර අවසානය හා සැසඳීමේදී සියයට 7.20 ක් වූ අක්‍රීය ණය (අදියර III) අනුපාතය, 2025 වසරේ ජූනි මස අවසානය වන විට සියයට 7.13 ක් දක්වා සුළු වශයෙන් වැඩි දියුණු වී ඇත. 2024 වසරේ පළමු මාස හය සඳහා වාර්තා කරන ලද රු. බිලියන 22.4 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය සඳහා රු. බිලියන 61.1 ක බදු පෙර ලාභයක් වාර්තා කරමින් ලංකා බැංකුව ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයක් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවයක් පිළිබිඹු කර ඇත. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2025 වසරේ පළමු මාස හය තුළ ශුද්ධ පොලී ආදායම රු. බිලියන 102.7 ක් දක්වා සියයට 78.6 කින් ඉහළ යාමයි.

මහජන බැංකුව

2024 වසර අවසානය වන විට රු. බිලියන 3,298 ක් වූ මහජන බැංකුවේ වත්කම් පදනම 2025 ජූනි මස අවසානය වන විට රු. බිලියන 3,572 ක් දක්වා සියයට 8.3 කින් ඉහළ ගොස් ඇත. 2024 වසර අවසානයේ රු. බිලියන 2,855 ක් වූ බැංකුවේ තැන්පතු පදනම, 2025 ජූනි මස අවසානය වන විට රු. බිලියන 3,125 ක් දක්වා සියයට 9.5 කින් වැඩි වී ඇත. 2024 වසර අවසානයේ රු. බිලියන 1,522 ක් වූ ණය හා අත්තිකාරම්, 2025

ජූනි මස අවසානය වන විට රු. බිලියන 1,592 ක් දක්වා සියයට 4.6 කින් වර්ධනය වී ඇත. 2024 වසර අවසානය වන විට සියයට 10.26 ක් වූ අක්‍රීය ණය (අදියර III) අනුපාතය 2025 ජූනි මස අවසානය වන විට සියයට 9.39 ක් දක්වා ආන්තික වශයෙන් වැඩි දියුණු වී ඇත. 2024 වසරේ පළමු මාස හය සඳහා වාර්තා කරන ලද රු. බිලියන 2.6 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය සඳහා රු. බිලියන 28 ක සියලු කාලයේ ඉහළම බදු පෙර ලාභයක් මහජන බැංකුව විසින් වාර්තා කර ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ශුද්ධ පොලී ආදායම සියයට 151 කින් රු. බිලියන 69.3 ක් දක්වා ඉහළ යාමයි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

2024 වසර අවසානය වන විට රු. බිලියන 1,752 ක් වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වත්කම් පදනම 2025 ජූනි මස අවසානය වන විට රු. බිලියන 1,811 ක් දක්වා ආන්තික වර්ධනයක් වාර්තා කර ඇත. 2024 වසර අවසානයේ රු. බිලියන 1,556 ක් වූ බැංකුවේ තැන්පතු පදනම, 2025 ජූනි මස අවසානය වන විට රු. බිලියන 1,576 ක් දක්වා සියයට 1.3 කින් වර්ධනය වී ඇත. 2024 වසර අවසානය වන විට පැවති රු. බිලියන 532 ක් වූ ණය සහ අත්තිකාරම් ශේෂය 2025 වසරේ ජූනි මාස අවසනාය වනවිට රු. බිලියන 514 ක් දක්වා සියයට 3.4 කින් පහළ ගොස් ඇත. 2024 වසර අවසානය වන විට සියයට 5.18 ක්වූ අක්‍රීය ණය (අදියර III) අනුපාතයට සාපේක්ෂව 2025 ජූනි මස අවසානය වන විට එය සියයට 2.83 ක් දක්වා වර්ධනය වී ඇත. 2024 වසරේ පළමු මාස හය තුළ වාර්තා කළ රු. බිලියන 20 ක් වූ බදු පෙර ලාභය හා සසඳන විට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ බදු පෙර ලාභය රු. බිලියන 31 ක් දක්වා සියයට 55 ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කර ඇත. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ශුද්ධ පොලී ආදායමේ වැඩිවීම සහ හානිකරණ ගාස්තු ආපසු ගැලපීමයි.

සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 2025 වසරේ පළමු මාස හය තුළ රු. මිලියන 2,378 ක බදු පෙර ලාභයක් වාර්තා කළ අතර, එය 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ලැබූ රු. මිලියන 1,753 ට සාපේක්ෂව සියයට 35.6 ක වැඩිවීමකි. සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පූර්ණ හිමිකාරීත්වය දරණ පරිපාලිත සමාගම් වන සී/ස ශ්‍රී ලංකා ජීවිත රක්ෂණ සමාගම 2024 වසරේ පළමු මාස හය තුළ වාර්තා කළ රු. මිලියන 15,298 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. මිලියන 14,417 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇති අතර, සී/ස ශ්‍රී ලංකා සාමාන්‍ය රක්ෂණ සමාගම විසින් 2025 වසරේ පළමු මාස හය සඳහා 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ලැබූ රු. මිලියන 1,763 ට සාපේක්ෂව රු. මිලියන 2,087 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත.

ලංකා විදුලිබල මණ්ඩලය

2025 වසරේ පළමු මාස හය තුළ විදුලි බලය සඳහා වූ ඉල්ලුම 2024 වසරේ පළමු මාස හය හා සැසඳීමේදී ගිගාවොට් පැය 7,491 සිට ගිගාවොට් පැය 7,814 ක් දක්වා සියයට 4.3 කින් ඉහළ ගිය ද, 2024 වසරේ පළමු මාස හය හා සැසඳීමේදී 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ විදුලි අලෙවියෙන් උපයාගත් ආදායම රු. බිලියන 314.4 සිට රු. බිලියන 192.6 ක් දක්වා සියයට 38.8 කින් සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ 2025 වසරේ පළමු මාස හය තුළ විදුලි ඒකකයක විකුණුම් මිල 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී කි.වො. පැයට රු. 41.97 සිට කි.වො. පැයට රු. 24.64 ක් දක්වා අඩුවීම තුළින් සාමාන්‍ය අවසන් පාරිභෝගික විදුලි ගාස්තුව අඩුවීමයි.

කෙසේ වෙතත්, පැවති හිතකර කාලගුණික තත්ත්වය හේතුවෙන් තාප විදුලි උත්පාදනය මත යැපීම අඩුවීම නිසා 2024 වසරේ පළමු මාස හය හා සැසඳීමේදී 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේදී සෘජු උත්පාදන පිරිවැය රු. බිලියන 158.1 සිට රු. බිලියන 144.3 ක් දක්වා සියයට 8.7 කින් පහළ ගොස් ඇත. සෘජු උත්පාදන පිරිවැය පහළ ගිය ද, 2025 වසරේදී සාමාන්‍ය අවසන් පාරිභෝගික විදුලි ගාස්තුව අඩු කිරීම හේතුවෙන් 2024 වසරේ පළමු මාස හය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) වාර්තා කළ රු. බිලියන 99.7 ක් වූ දළ ලාභයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 11.2 ක දළ අලාභයක් වාර්තා කර ඇත. ඒ අනුව, 2024 වසරේ පළමු මාස හය තුළ ලං.වි.ම. යෙහි පරිපාලිත සමාගමක් වන ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් ලිමිටඩ් හි කොටස් බැහැර කිරීමෙන් ලද රු. බිලියන 26 ක ලාභය ද ඇතුළත්ව වාර්තා කළ රු. බිලියන 119.2 ක ශුද්ධ ලාභයට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 13.2 ක ශුද්ධ අලාභයක් වාර්තා කර ඇත.

2024 වසරේ පළමු මාස හය තුළ උත්පාදන සංයුතිය ජල: තාප (ගල් අඟුරු): සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය, සුළං සහ වහළමත සවිකල සූර්ය බලශක්තිය: සහ තාප (ඉන්ධන) 30: 36: 18: 16 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය සඳහා 34: 31: 23: 12 ලෙස වෙනස් වී ඇත. ජල විදුලිය, විශේෂයෙන්ම වහළමත සවිකල සූර්ය බලශක්තිය ඇතුළුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය භාවිතය ඉහළ යාම, වැඩි පිරිවැය සහිත ගල් අඟුරු සහ ඉන්ධන මත පදනම් වූ උත්පාදන ප්‍රභවයන් මත යැපීම අඩු කිරීමට හේතු විය. ඒ අනුව, විකුණුම් ස්ථානයේ ඒකකයක පිරිවැය 2024 වසරේ පළමු මාස හය තුළ පැවති කි.වො. පැයට රු. 31.10 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය සඳහා කි.වො. පැයට රු. 27.43 ක් දක්වා පහළ ගොස් ඇත.

2024 වසර අවසානය වන විට ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් වෙත ගෙවිය යුතුව පැවති රු. බිලියන 14.1 ක් වූ ශේෂය, 2025 වසරේ ජූනි මස අවසානය වන විට රු. බිලියන 19.8 ක් වූ අතර එය ලං.වි.ම. යෙහි වෙළඳ ගෙවිය යුතු ශේෂය වන රු. බිලියන 52.6 න් සියයට 37.6 ක අගයක් වේ.

2025 වසරේ සිදු කළ විදුලි ගාස්තු සංශෝධනයන් දෙක හේතුවෙන් සාමාන්‍ය අවසන් පාරිභෝගික විදුලි ගාස්තුව 2025 ජනවාරි මස සියයට 20 කින් අඩු වූ අතර, 2025 ජූනි මස සියයට 15 කින් ඉහළ යන ලදී.

මේ අතර, 2024 අංක 36 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතට යෝජනා කරන ලද සංශෝධන අනුව, 2025 අංක 14 දරණ ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත 2025 අගෝස්තු 18 වන දින සම්මත කරන ලදී. එම පනතේ විධිවිධාන ප්‍රකාරව උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම සහ ජාතික පද්ධති ක්‍රියාකරු සඳහා පූර්ණ රාජ්‍ය හිමිකාරීත්වය සහිත සමාගම් හතරක් ස්ථාපිත කරන ලදී.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2025 වසරේ පළමු මාස හය තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සිදු කළ ඛනිජ තෙල් සහ ඛනිජ තෙල් නිෂ්පාදනයන්හි ආනයනික පිරිවැය 2024 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ ඇ.ඩො. මිලියන 1,235 ට සාපේක්ෂව ඇ.ඩො. මිලියන 1,040 ක් දක්වා අඩු විය. මෙම පහත වැටීමට මූලික වශයෙන් හේතු වූයේ ගෝලීය වෙළෙඳපොළේ ඉන්ධන මිල පහත වැටීම සහ එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය ඉහළ යාමයි. එහි ප්‍රතිඵලයක් ලෙස, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ විකුණුම් පිරිවැය 2024 වසරේ පළමු භාගයේදී වාර්තා කළ රු. බිලියන 467.7 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේදී රු. බිලියන 377.9 ක් දක්වා සියයට 19.2 කින් අඩු විය.

ඒ අනුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිවැටුම ද 2024 වසරේ පළමු මාස හය තුළ පැවති රු. බිලියන 544.3 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේදී රු. බිලියන 439.5 ක් දක්වා සියයට 19.3 කින් කැපී පෙනෙන පහළ යාමක් අත්දකින ලදී. මෙම ප්‍රවණතාවයන් පිළිබිඹු කරමින්, 2024 වසරේ පළමු මාස හයෙහි ශුද්ධ ලාභය වූ රු. බිලියන 20.7 ට සාපේක්ෂව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ ශුද්ධ ලාභය රු. බිලියන 17.0 ක් දක්වා සියයට 17.9 කින් පහත වැටුනි.

වගකීම් අතින්, තෙල් වෙනුවට තේ හුවමාරු ගිවිසුම හරහා හිඟ මුදල්වලින් කොටසක් පියවීම පිළිබිඹු කරමින් ජාතික ඉරාන තෙල් සමාගමට (NIOC) ගෙවිය යුතු මුදල 2024 ජූනි අවසානය වන විට පැවති ඇ.ඩො. මිලියන 191 සිට 2025 ජූනි අවසානය වන විට ඇ.ඩො. මිලියන 130.96 ක් දක්වා අඩු වී ඇත.

ශ්‍රී/ ස ශ්‍රීලංකන් ගුවන් සමාගම

ශ්‍රීලංකන් ගුවන් සමාගමේ 2025/26 මූල්‍ය වර්ෂයේ පළමු මාස තුන තුළ දී මගී ආදායමෙහි වර්ධනයක් වාර්තා කළ ද, පිරිවැය ව්‍යුහයෙන් ඇති කළ පීඩනය හා අධික ණය බර හේතුවෙන් එම සමාගමේ ලාභදායීත්වය කෙරෙහි මිශ්‍ර මූල්‍ය ප්‍රතිඵල වාර්තා කරනු ලැබ ඇත. 2025/26 මූල්‍ය වර්ෂයේ පළමු මාස තුනේ දී ඉහළ ගුවන් ගමන් වාර ගණන සහ 2024/25 මූල්‍ය වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයේ වූ සියයට 74.8 ට සාපේක්ෂව සියයට 82.3 ක් දක්වා පැටවුම් සාධකය ඉහළයාම හේතුවෙන් රු. බිලියන 1.5 ක වාර්ෂික වර්ධනයක් සහිතව ගුවන් මගී ආදායම රු. බිලියන 51.7 ක් දක්වා ඉහළ ගොස් ඇත. ගුවන් ගමන් වාරයන්හි සියයට 23 ක වර්ධනයක් සනිටුහන් කරමින් 2025/26 පළමු කාර්තුව තුළ දී ගුවන් ගමන් 3,217 ක් මඟින් මිලියනයකට අධික මගීන් සංඛ්‍යාවක් ගුවන් සමාගම විසින් රැගෙන ගොස් ඇත. කෙසේ වෙතත්, 2025/26 මූල්‍ය වර්ෂයේ පළමු මාස තුන තුළ භාණ්ඩ ආදායම සහ අනෙකුත් ආදායම රු. බිලියන 7.1 ක් සහ රු. බිලියන 3.8 ක් දක්වා පිළිවෙලින් සියයට 13 කින් සහ සියයට 28 කින් අඩු වී ඇති අතර, 2024/25 මූල්‍ය වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 63.8 ක් වූ ශුද්ධ ගුවන් ප්‍රවාහන ආදායම රු. බිලියන 62.7 ක් දක්වා පහත වැටී ඇත.

සලකා බලන කාලපරිච්ඡේදය තුළ, ගුවන් යානා ඉන්ධන සහ ගුවන් යානා සහ අමතර එන්ජින් සඳහා කල්බදු පිරිවැය පහත වැටුණද, ගුවන් යානා නඩත්තු පිරිවැය ඉහළ යාම හේතුවෙන් මුළු මෙහෙයුම් වියදම් රු. බිලියන 67.8 ක් දක්වා ආන්තික වශයෙන් ඉහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024/25 මූල්‍ය වර්ෂයේ පළමු මාස තුන තුළ දී සමාගමෙහි ප්‍රධාන ආදායම් ප්‍රභවය වන ගුවන් ප්‍රවාහන අංශයෙන් වාර්තා කළ රු. බිලියන 3.5 ක මෙහෙයුම් අලාභයට සාපේක්ෂව, 2025/26 මූල්‍ය වර්ෂයේ පළමු මාස තුන තුළ සමාගමෙහි මෙහෙයුම් අලාභය රු. බිලියන 5.2 ක් ලෙස වැඩි වී ඇත. ශ්‍රීලංකන් කේටරින් සමාගම වෙතින් ලැබුණු දායකත්වයේ සහාය හේතුවෙන් මූල්‍ය ගාස්තු සහ විදේශ විනිමය බලපෑමට පෙර රු. බිලියන 1.1 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කිරීමට ශ්‍රීලංකන් සමූහයට හැකි විය. කෙසේ වෙතත්, රු. බිලියන 6.4 ක් වූ මූල්‍ය පිරිවැය, රු. බිලියන 4.9 ක් වූ විනිමය අලාභ සහ දඩ මුදල් ගිණුම්ගත කිරීමෙන් පසු, සමූහය 2025/26 වසරේ පළමු මාස තුන තුළ රු. බිලියන 10.7 ක ශුද්ධ අලාභයක් වාර්තා කළ අතර, එය 2024/25 මූල්‍ය වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රු. බිලියන 12.9 ක ශුද්ධ අලාභයට සාපේක්ෂව සාධනීය තත්ත්වයකි.

ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ශේෂ පත්‍රය සලකා බැලීමේදී, සමාගම තවදුරටත් සැලකිය යුතු මූල්‍ය පීඩනයක් යටතේ කටයුතු කරනු ලබයි. 2025 වසරේ ජූනි මස අවසානය වන විට, ගුවන් යානා භාවිත හිමිකම් වත්කම්, වෙළඳ ලැබිය යුතු දෑ සහ නඩත්තු සංචිත ඇතුළුව ගුවන් සමාගම විසින් රු. බිලියන 191.5 ක මුළු වත්කම් ප්‍රමාණයක් වාර්තා කර ඇත. කෙසේ වෙතත්, රු. බිලියන 628.3 ක සමුච්චිත අලාභ හේතුවෙන් කොටස් හිමියන් සඳහා වන ප්‍රාග්ධනය රු. බිලියන 415.2 ක සෘණ අගයක් බවට පත්වී ඇත. ගුවන් සමාගම මුහුණ දෙන ඉහළ උත්තෝලනය සහ ද්‍රවශීලතා අවදානම් පෙන්නුම් කරමින්, 2025 ජූනි අවසානය වන විට මුළු වගකීම් රු. බිලියන 606.7 ක් ලෙස වාර්තා වේ.

ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය යථා තත්ත්වයට පත්වීම සහ කලාපීය සම්බන්ධතාවය වර්ධනය වීම මධ්‍යයේ, ඉහළ යන මගී ඉල්ලුම තුළ ශ්‍රීලංකන් ගුවන් සමාගමට ප්‍රතිලාභ අත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, ණය සේවාකරණ පිරිවැය සහ සීමිත ආදායම් විවිධාංගීකරණය හේතුවෙන් ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ලාභදායීතාවය සීමා වීමක් ද පෙන්නුම් කරයි. උක්ත කරුණු හේතුකොට ගෙන පිරිවැය තාර්කිකකරණය සහ ගුවන් යානා ඇණිය උපායමාර්ගිකව ප්‍රශස්තිකරණය තුළින් ව්‍යාපාර තිරසාරභාවය සඳහා පුළුල් සැලැස්මක් තිබීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින්, ශ්‍රීලංකන් ගුවන් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025/26 වසරේ සිට වසර පහක කාලයක් සඳහා ව්‍යාපාරික සැලැස්මක් අනුමත කර ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

2024 වසරේ ජූනි මස අවසානය වන විට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදු කළ නල ජල සැපයුම හා ආරක්ෂිත පානීය ජල සැපයුම පිළිවෙළින් සියයට 62.4 ක් සහ සියයට 98.1 ක් වූ අතර, එයට සාපේක්ෂව 2025 වසරේ ජූනි මස අවසානය වන විට නල ජල සැපයුම හා ආරක්ෂිත පානීය ජල සැපයුම පිළිවෙලින් සියයට 63.7 ක් සහ සියයට 99.1 ක් දක්වා ඉහළ නැංවීමට සමත් වී ඇත. කෙසේ වෙතත්, 2024 වසරේ ජූනි මස අවසානය වන විට සියයට 2.07 ක් වූ මලාපවහන ආවරණ කාර්ය සාධනය 2025 වසරේ ජූනි මස අවසානය වන විට සැලකිය යුතු ලෙස වෙනසක් වී නොමැත.

2025 වසරේ පළමු මාස හය තුළ, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පද්ධතියට නව ජල සම්බන්ධතා 100,000 කට ආසන්න ප්‍රමාණයක් එක් කර ඇත. 2025 වසරේ පළමු මාස හය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය රු. බිලියන 41.5 ක ආදායමක් වාර්තා කර ඇති අතර, 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 42.8 ක ආදායමක් වාර්තා කර ඇත. කෙසේ වෙතත්, 2025 වසරේ ජනවාරි මස විදුලි ගාස්තු අඩු කිරීම හා සම්බන්ධිත පොම්ප කිරීමේ පිරිවැය අඩුවීම හේතුවෙන් මෙම කාල සීමාව තුළ විකුණුම් පිරිවැය රු. බිලියන 15 ක් දක්වා සියයට 20 කින් සැලකිය යුතු ලෙස අඩු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, මණ්ඩලය විසින් සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 26.5 ක දළ ලාභයක් වාර්තා කර ඇති අතර, 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය සඳහා වාර්තා කර ඇති දළ ලාභය රු. බිලියන 24 කි. ඒ අනුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2025 වසරේ පළමු මාස හය තුළ රු. බිලියන 20.6 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කර ඇති අතර, 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා කර ඇති මෙහෙයුම් ලාභය රු. බිලියන 19.1 කි. මේ අතර, දේශීය පොලී අනුපාත ලිහිල් කිරීම මූල්‍ය පිරිවැය රු. බිලියන 3.6 ක් දක්වා සියයට 41.9 කින් සැලකිය යුතු ලෙස අඩුවීමට දායක වී ඇති අතර, 2025 වසරේ පළමු මාස හය තුළ ලබා ඇති රු. බිලියන 17.7 ක ශුද්ධ ලාභය, 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ලබා ඇති රු. බිලියන 13.8 ට සාපේක්ෂව සියයට 28.3 ක වැඩිවීමකි.

සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා ජල නිෂ්පාදනය සහ ජල අලෙවිය යන දෙකම පෙර වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 1 කින් පමණ ඉහළ ගොස් ඇති අතර, එය පිළිවෙලින් ඝන මීටර් මිලියන 419 ක් සහ ඝන මීටර් මිලියන 317 ක් විය. තවද, ආදායම් නොලබන ජලය මෙම කාලපරිච්ඡේදය තුළ පහත වැටීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වූ සියයට 24.4 ට සාපේක්ෂව එම අගය සියයට 24.2 ක් දක්වා අඩු වී ඇත.

තව ද, 2025 වසරේ පළමු මාස හය තුළ අයවැය සහාය යටතේ ව්‍යාපෘතිවල ඉතිරි වැඩ නිම කිරීම පහසු කිරීම වෙනුවෙන් තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය, ගම්පහ, අත්තනගල්ල, මීනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය, අලුත්ගම, මතුගම සහ අගලවත්ත ජල සම්පාදන ව්‍යාපෘතිය සහ පොල්ගහවෙල, අලව්ව සහ පොතුහැර ජල සම්පාදන ව්‍යාපෘතිය වැනි ප්‍රධාන ජල සම්පාදන ව්‍යාපෘතිවල වගකීම් පියවීම සඳහා දේශීය සහ විදේශීය බැංකුවල ණය ආපසු ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් රු. බිලියන 23.25 ක ප්‍රාග්ධන දායකත්වයක් ලබා දී ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

මූල්‍ය ශක්‍යතාවය සහ ස්ථාවරභාවය අවධාරණය කරමින් 2025 වසරේ පළමු මාස හය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයක් පෙන්නුම් කර ඇත. 2024 වසරේ පළමු මාස හය තුළ වාර්තා කළ රු. බිලියන 42.5 ට සාපේක්ෂව, සලකා බලන කාලපරිච්ඡේදයේ දී අධිකාරියෙහි සමස්ත ආදායම රු. බිලියන 52.0 ක් දක්වා ඉහළ ගොස් ඇත. 2024 වසරේ පළමු මාස හය තුළ අධිකාරිය විසින් වාර්තා කළ රු. බිලියන 18.4 ක් වූ මෙහෙයුම් ලාභයට සාපේක්ෂව, 2025 වසරේ පළමු මාස හය තුළ රු. බිලියන 23.7 ක වියදමක් දරමින් අධිකාරිය විසින් රු. බිලියන 28.3 ක මෙහෙයුම් ලාභයක් අත්කර ගෙන ඇත. ශුද්ධ මූල්‍ය ආදායම සහ මධ්‍යස්ථ විදේශ විනිමය අලාභය ගිණුම්ගත කිරීමෙන් පසු, 2025 වසරේ පළමු මාස හය තුළ රු. බිලියන 29.2 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇති අතර, එය 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ රු. බිලියන 19.8 ක ශුද්ධ ලාභයට සාපේක්ෂව කැපී පෙනෙන වර්ධනයකි.

මෙහෙයුම් ක්‍රියාවලිය තුළ, 2025 වසරේදී අඩි විස්සේ බහාලුම් ඒකක මිලියන 8 ක් ඉක්මවා හැසිරවීමේ අභිප්‍රාය ඇතිව, කොළඹ වරාය කලාපීය ප්‍රතිනැව්ගත කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස එහි භූමිකාව ශක්තිමත් කිරීමට අඛණ්ඩව ක්‍රියා කරමින් සිටී. නැගෙනහිර බහාලුම් පර්යන්ත අදියර II, ජය බහාලුම් පර්යන්ත අදියර V, බටහිර බහාලුම් පර්යන්ත අදියර II සහ කොළඹ උතුරු වරාය ව්‍යාපෘතිය සඳහා සූදානම් කිරීමේ කටයුතු ඇතුළත් ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධනයන් මඟින් අධිකාරියෙහි ධාරිතාව සහ කාර්යක්ෂමතාව තවදුරටත් පුළුල් කරනු ඇත.

ඉදිරියේදී, වරාය අධිකාරියෙහි වැඩිදියුණු වූ ලාභදායිත්වය, ශක්තිමත් ශේෂ පත්‍රය සහ උපායමාර්ගික පුළුල් කිරීමේ ව්‍යාපෘති මඟින් එහි දිගුකාලීන වර්ධනය සඳහා ස්ථිර පදනමක් සැපයෙනු ඇත. ප්‍රධාන නෞකා ගමන් මාර්ග ආසන්නයෙහි ශ්‍රී ලංකාව පිහිටීමේ වාසිය ලබා ගනිමින් ප්‍රතිනැව්ගත කිරීමේ ධාරිතාවන් වැඩි කර ගැනීමට, තරඟකාරිත්වය වැඩි දියුණු කිරීමට සහ රජයේ පුළුල් සංවර්ධන ක්‍රියාදාමයට සහාය වීමට අධිකාරිය සූදානම්ව සිටී.

ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම

ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම 2025 වසරේ පළමු මාස හය තුළ රු. බිලියන 27.3 ක මුළු ආදායමක් වාර්තා කළ අතර, එය 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ලබාගත් රු. බිලියන 20.8 ක් වූ මුළු ආදායමට සාපේක්ෂව සියයට 31 ක සැලකිය යුතු වර්ධනයක් විය. තවද, මුළු ආදායමෙන් සියයට 85 ක් පමණ ගුවන් සේවා නොවන ප්‍රභවයන්ගෙන් උපයාගෙන

ඇත. 2025 වසරේ පළමු මාස හය තුළ මෙහෙයුම් වියදම් රු. බිලියන 11.1 ක් දක්වා අඩු වූ අතර, එය 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 11.8 ක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2025 වසරේ පළමු මාස හය තුළ ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ මෙහෙයුම් ලාභය රු. බිලියන 16.1 ක් දක්වා රු. බිලියන 7.1 කින් වැඩි විය. කෙසේවෙතත්, 2024 වසරේ පළමු මාස හය තුළ වාර්තා වූ රු. බිලියන 4.6 ක් වූ විනිමය ලාභයට සාපේක්ෂව 2025 වසරේ පළමු මාස හය තුළ වාර්තා වූ රු. බිලියන 4.3 ක විනිමය අලාභය හේතුවෙන් ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ බදු පෙර ශුද්ධ ලාභය රු. බිලියන 14.6 ක් දක්වා සියයට 15.6 කින් අඩු වී ඇත. රු. බිලියන 4.8 ක බදු ප්‍රතිපාදනයකින් පසුව, සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම විසින් රු. බිලියන 9.8 ක ශුද්ධ ලාභයක් වාර්තා කළ අතර, එය 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 14.9 ක් විය.

2025 වසරේ ජූනි මාසය අවසන් වන විට, මුළු වත්කම් රු. බිලියන 243 ක් සමඟ ශක්තිමත් ශේෂ පත්‍රයක් පවත්වා ගෙන යාමට ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම සමත් වූ අතර, එය 2024 වසර අවසානයේ පැවති රු. බිලියන 222.4 ක මුළු වත්කම්වලට සාපේක්ෂව සියයට 9.3 ක වැඩිවීමකි. වත්කම් පදනමේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ නොනිමි වැඩ, වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දේ සහ කෙටිකාලීන ආයෝජනවල වැඩිවීමයි. කෙසේ වෙතත්, 2025 වසරේ ජූනි මාසය අවසන් වන විට සමාගම සැලකිය යුතු ණය බරක් ද දරා සිටි අතර, මුළු ණය ගැනීම් රු. බිලියන 103.0 ඉක්මවන අතර, ණයකර වටිනාකම රු. බිලියන 4.0 ක් වේ. සමස්තයක් වශයෙන්, ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ ශක්තිමත් ලාභදායිත්වයක් සහ රඳවා ගත් ඉපැයුම් මගින් සාධනීය මූල්‍ය කාර්යසාධනයක් පිළිබිඹු කරන අතර, ඉහළ උත්තෝලනය සහ විනිමය අලාභ පැවතීම මගින් ණය සහ මූල්‍ය කළමනාකරණය වඩාත් විචක්ෂණශීලී ලෙස පවත්වාගෙන යාමේ වැදගත්කම ඉස්මතු කරයි.

වගුව **3.1 : රජය සතු ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්වල ප්‍රතිසංස්කරණ/ ගෙන ඇති ප්‍රධාන පියවර**

ආයතනය	ප්‍රතිසංස්කරණ/ ගෙන ඇති ප්‍රධාන පියවර
රාජ්‍ය බැංකු	• වෙළෙඳපොළ තුළ රාජ්‍ය බැංකු වඩාත් තරඟකාරී තත්ත්වයට පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ පරිදි පාලන සහ අවදානම් කළමනාකරණ පිළිවෙත් ශක්තිමත් කිරීම. ඒ අනුව, කුසලතා පදනම මත පත් කරන ලද ස්වාධීන අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩලයේ බහුතරය නියෝජනය විය යුතු අතර, එමඟින් පාලනයේ ස්වාධීනත්වය සහතික කිරීම. • මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා GovPay, රාජ්‍ය ඩිජිටල් ගෙවීම් ක්‍රමවේදය සහ LankaQR වැනි ක්‍රමවේදයන් වෙත ප්‍රවේශය පුළුල් කිරීම සහ ඒකාබද්ධ කිරීම ශක්තිමත් කිරීම. • ශක්තිමත් අධීක්ෂණ යාන්ත්‍රණයක් සහ වැඩිදියුණු කළ නැවත අයකර ගැනීමේ ක්‍රියාවලීන් හරහා ණය කළඹේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම. • කාලීන නියාමන අවශ්‍යතා සමඟ යාවත්කාලීන වීම, අත්‍යවශ්‍ය වෙනස්කම් සිදුකිරීම සහ පාරදෘශ්‍ය වාර්තාකරණ භාවිතයන් පවත්වාගෙන යාම. • දැනට සිටින ගනුදෙනුකරුවන් වෙත සහය දීමට සහ නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා නව නිෂ්පාදිත සංවර්ධනය කිරීම. • මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීමේ අභිලාෂයෙන් වරප්‍රසාද නොලත් ප්‍රජාව වෙත මූල්‍ය සේවා ලබාදීම පුළුල් කිරීම.
සී/ස ශ්‍රීලංකන් ගුවන් සමාගම	• ඇ.ඩො. මිලියන 210 ක් සහ රු. බිලියන 31.4 ක් වටිනා ශ්‍රීලංකන් ගුවන් සමාගමේ දීර්ඝකාලීන නොගෙවූ ණය ප්‍රතිව්‍යුහගත කිරීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇති අතර, මහා භාණ්ඩාගාරය විසින් ශ්‍රීලංකන් ගුවන් සමාගමට ලබා දෙනු ලබන හිමිකම් දායකත්වය හරහා එම ණය සේවාකරණය කිරීමට නියමිතය.
ලංකා විදුලිබල මණ්ඩලය	• 2025 අංක 14 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත 2025 අගෝස්තු 18 වන දින සහතික කරන ලදී. • ආයතනයේ උත්පාදන, සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ අංශ අතර වැඩි ස්වාධීනත්වයක් සහ විනිවිදභාවයක් සහතික කරමින් ලං.වි.ම. යෙහි කටයුතු බෙදා වෙන් කිරීම සඳහා නව සීමිත වගකීම් සහිත සමාගම් හතරක් සංස්ථාපනය කරන ලදී.
ශ්‍රී ලංකා වරාය අධිකාරිය	• 2025 ජූලි මාසයේදී අමාත්‍ය මණ්ඩලය විසින් නැගෙනහිර බහාලුම් පර්යන්තය කළමනාකරණය සහ ක්‍රියාත්මක කිරීම සඳහා "කොළඹ නැගෙනහිර බහාලුම් පර්යන්තය (පුද්ගලික) සමාගම" නමින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට පූර්ණ අයිතිය සහිත පරිපාලිත සමාගමක් සංස්ථාපනය කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

මූලාශ්‍ර:රාජ්‍ය ව්‍යවසායයන් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

වගුව 3.2: ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 හි බදු පෙර ලාභය

රු. මිලියන

	රාජ්‍ය ව්‍යවසාය	2023	2024(අ)	2025.06.30(අ) දිනට
1	ලංකා බැංකුව	40,342	106,904	61,087
2	මහජන බැංකුව	15,345	41,584	27,989
3	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	4,287	26,431	31,274
4	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	-1,165	158	249
5	නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව	2,650	412	111
6	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	1,183	3,210	2,194
7	සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය	64,959	63,177	32,902
8	සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව	10,704	3,546	2,378
9	ජාතික රක්ෂණ භාර අරමුදල	13,329	16,793	9,626
10	ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව	1,056	852	344
11	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය	-3,885	-3,182	483
12	ලංකා විදුලිබල මණ්ඩලය	57,633	144,394	-13,162
13	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	120,346	33,265	17,018
14	ශ්‍රී ලංකා වරාය අධිකාරිය	40,359	46,734	29,195
15	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	5,235	23,945	17,673
16	සීමා සහිත ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම	33,639	28,671	14,574
17	සීමා සහිත ශ්‍රීලංකන් ගුවන් සමාගම	3,871	-7,595	-12,041*
18	ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය	2,189	547	927
19	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව(අ)	-2,709	-1,041	-247
20	ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය	748	608	150
21	රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව	-2,246	-1,411	-169
22	සීමා සහිත මිල්කෝ (පුද්ගලික) සමාගම	-470	-43	628
23	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය(අ)	-136	281	-15
24	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව	-93	-69	-42
25	ජනතා වතු සංවර්ධන මණ්ඩලය(අ)	-156	-223	-25
26	සීමා සහිත කුරුණෑගල වැවිලි සමාගම	534	415	323
27	සීමා සහිත හලාවත වැවිලි සමාගම	303	219	384
28	සීමා සහිත කළුබෝවිටියන තේ කර්මාන්තශාලාව	69	-11	40*
29	ශ්‍රී ලංකා කජු සංස්ථාව	-5	14	-3
30	සීමා සහිත ලංකා ඛනිජ වැලි සමාගම	4,051	-77	489
31	සීමා සහිත ලංකා පොස්පේට් සමාගම	363	465	101*
32	සීමා සහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම	28	24	19*
33	සංවර්ධන ලොතරැයි මණ්ඩලය	3,516	4,197	2,764
34	ජාතික ලොතරැයි මණ්ඩලය	845	1,693	910
35	රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව	2,173	3,083	1,522
36	ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව	218	183	145
37	රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව	1,268	2,474	874
38	ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල	304	552	587
39	සීමා සහිත ස්වාධීන රූපවාහිනී ජාලය	-205	3	-77
40	ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව	-360	-247	-162
41	ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව	-528	-158	-30
42	ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය	57	85	45
43	රාජ්‍ය දැව සංස්ථාව	1,274	825	-73
44	ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව	1,501	367	67
45	සීමාසහිත ලංකා සතොස සමාගම	-695	-1,097	-240
46	රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව	2,792	284	-61
47	ලංකා ධීවර සංස්ථාව(අ)	-47	-20	-1
48	ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව	640	-85	-23
49	සීමා සහිත ලංකා පොහොර සමාගම	61	-476	-
50	සීමා සහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම	162	-41	-
51	සීමා සහිත හොටෙල් ඩිවලොපර්ස් ලංකා සමාගම	-784	-268	-249
52	සීමා සහිත ලංකා සීනි සමාගම	2,835	-1,945	-2,618
එකතුව		**427,385**	**538,408**	**227,834**

මූලාශ්‍ර:රාජ්‍ය ව්‍යවසායයන් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

(අ)තාවකාලික

** 2025 අප්‍රේල් - ජූනි*

*** 2024 වර්ෂයේ දී සී/ස ලංකා පොහොර සමාගම සහ කොළඹ කොමර්ෂල් පොහොර සමාගම ඒකාබද්ධ කර අලුතින් පිහිටුවන ලද රාජ්‍ය පොහොර සමාගම 2025 වර්ෂයේ අප්‍රේල් සිට ජූනි දක්වා කාලය තුළ රු මිලියන 241 ක ලාභයක් උපයා ඇත*

වගුව 3.3: රාජ්‍ය ව්‍යවසායයන් වෙතින් ලද අයබදු / ලාභාංශ ආදායම

රු.මිලියන

රාජ්‍ය ව්‍යවසාය	2023	2024	2025.06.30 දිනට
අයබදු	**60,497**	**33,191**	**10,181**
මහජන බැංකුව	-	-	-
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	5,000	10,000	-
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම	23,000	9,000	-
රාජ්‍ය දැව සංස්ථාව	641	-	447
රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව	300	300	282
ජාතික රක්ෂණ භාර අරමුදල	2,000	2,919	1,000
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය	2,000	1,468	1,388
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය	390	25	120
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය	533	928	-
ජාතික ලොතරැයි මණ්ඩලය	1,000	1,060	200
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය	40	13	-
ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව	620	300	-
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය	500	500	-
සිවිල් ගුවන් සේවා අධිකාරිය	4,000	750	500
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව	-	100	-
ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය	150	850	-
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය	7,000	-	5,000
ජාතික ගමනාගමන කොමිෂන් සභාව	300	250	100
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	75	-	-
ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධන අධිකාරිය	500	-	-
ශ්‍රී ලංකා වරාය අධිකාරිය	8,066	607	-
ජාතික ඖෂධ නියාමන අධිකාරිය	646	880	716
මාර්ග සංවර්ධන අධිකාරිය	75	1,749	-
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම	350	15	-
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය	200	-	10
ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ ජාතික ආයතනය	115	85	-
පශ්චාත් උපාධි අධ්‍යයන කළමනාකරණ ආයතනය	25	4	20
වෙනත් රාජ්‍ය ව්‍යවසායයන්	2,971	1,388	398
ලාභාංශ	**15,204**	**7,889**	**1,540**
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	30	-	-
ලංකා බැංකුව	173	-	-
මහජන බැංකුව	158	-	-
සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව	2,272	1,271	-
සීමා සහිත ගුවන්තොටුපළ සහ ගුවන් සේවා(ශ්‍රී ලංකා) (පුද්ගලික)සමාගම	5,500	1,286	-
සීමා සහිත ලංකා ඛණිජ වැලි සමාගම	2,500	158	-
සීමා සහිත ලංකා පොස්පේට් සමාගම	220	75	25
සීමා සහිත ලංකා ලේලන්ඩ් සමාගම	6	-	-
සීමා සහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම	125	75	-
සීමා සහිත මන්තායි සෝල්ට් සමාගම (සී/ස ජාතික ලුණු සමාගම)	120	-	-
සීමා සහිත ලංකා පොහොර සමාගම	22	15	-
සීමා සහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම	60	30	-
සීමා සහිත පරන්තන් කෙමිකල් සමාගම	305	131	-
සීමා සහිත රජයේ වාණිජ නීතිගත සංස්ථාව	150	50	-
සීමා සහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම	223	-	-
සීමා සහිත ඩී ලා රූ ලංකා පුද්ගලික සමාගම	-	1,324	-
සීමා සහිත ලංකා විදුලිබල සමාගම	697	436	-
සීමා සහිත ලංකා කාර්මික වතු සමාගම	174	98	
සීමා සහිත ලංකා කෘෂි කර්මාන්ත සමාගම	167	202	131
වැවිලි සමාගම්	554	559	60
සීමා සහිත ලංකා සීනි සමාගම	1,597	-	-
ලංකා ත්‍රිපෝෂ සමාගම	75	100	11
වෙනත් රාජ්‍ය ව්‍යවසායයන්	75	2,078	1,313
එකතුව	**75,701**	**41,080**	**11,721**

මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යවසායයන් හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

4 වන පරිච්ඡේදය

විදේශ මූල්‍යයනය

4.1 සමාලෝචනය

2024 වර්ෂයේ දී ශ්‍රී ලංකාව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ ප්‍රධාන සන්ධිස්ථාන කිහිපයක් සපුරා ගෙන ඇති අතර, එය ණය තිරසරභාවය පිළිබඳ ඉලක්ක සපුරාගැනීම සඳහා අත්‍යවශ්‍ය වන තීරණාත්මක පියවරකි. 2025 වර්ෂයේ දී ප්‍රධාන සංවර්ධන පාර්ශ්වකරුවන් සමඟ ද්විපාර්ශ්වික සංශෝධන ගිවිසුම් අත්සන් කිරීම තුළින් ශ්‍රී ලංකාව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ උත්සාහයන්හි තවදුරටත් ප්‍රගතියක් වාර්තා කර ඇත. එම ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය අවසන් වීමට ඉතා ආසන්න වෙමින් පවතී. 2025 මාර්තු 24 දින ජපාන රජය සමඟ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව නිමාවට පත්විය. අනතුරුව ඉන්දියානු අපනයන-ආනයන බැංකුවේ සහයෝගීතා ණය මාලාව සහ ගැනුම්කරුවන්ගේ ණය පහසුකම් යටතේවන ද්විපාර්ශ්වික ණය සම්බන්ධයෙන් වූ සංශෝධන ගිවිසුම් පිළිවෙළින් 2025 මාර්තු 25 සහ 2025 අප්‍රේල් 3 යන දිනයන්හිදී අත්සන් කරන ලදී. අනතුරුව, 2025 ජුනි 16 දින, ශ්‍රී ලංකාව හා ප්‍රංශ ජනරජය අතර ද්විපාර්ශ්වික සංශෝධන ගිවිසුම් අත්සන් කරන ලදී. 2025 ජුනි මාසය අවසානය වන විට, ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා හඳුනාගත් ණය ප්‍රමාණය මත පදනම්ව, ශ්‍රී ලංකාව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියෙන් සියයට 92 ක් සාර්ථකව නිම කර ඇත.

ඉහත සන්දර්භය තුළ, ශ්‍රී ලංකාව අදාළ සංවර්ධන හවුල්කරුවන්ගේ ණය සේවාකරණය නැවත ආරම්භ කර ඇත. තවද, 2025 ජුනි මස අවසානය වන විට, ශ්‍රී ලංකාව අදාළ සංවර්ධන හවුල්කරුවන් සහ බැඳුම්කර හිමියන් සමඟ ණය සහ බැඳුම්කර 194 ක් ආවරණය වන පරිදි සංශෝධිත ගිවිසුම් 36 ක් අත්සන් කිරීම අවසන් කර ඇති අතර, අනෙකුත් ද්විපාර්ශ්වික සංවර්ධන හවුල්කරුවන් වෙත ණය ප්‍රතිව්‍යුහගතකරණ යෝජනා යොමුකර ඇත. ඊට අදාළව ණය දත්ත ගැලපීම සහ මෙම ඉතිරි සංවර්ධන හවුල්කරුවන් සමඟ වෙන් වෙන්ව නීතිමය ගිවිසුම් සකස් කිරීම සිදු කෙරෙමින් පවතී.

4.2 විදේශ මූල්‍යයනය එකඟතා

2025 වසරේ පළමු භාගය තුළ ද්විපාර්ශ්වික, බහුපාර්ශ්වික හෝ විදේශ වාණිජ ණයහිමියන් සමඟ නව මූල්‍යයනය එකඟතා ඇති කර ගෙන නොමැත.

4.3 විදේශ මූල්‍යයනය ප්‍රතිලාභ හා උපයෝජනය

2025 ජනවාරි 1 සිට ජුනි 30 දක්වා කාලය තුළ ලද මුළු විදේශ ප්‍රතිලාභ ප්‍රමාණය ඇ. ඩො. මිලියන 547.5 ක් විය.

මෙම ප්‍රතිලාභවලින් ඉහළම ප්‍රමාණය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබුණු අතර, එය සමස්තයෙන් ආසන්න වශයෙන් සියයට 61 ක් වේ. අනතුරුව ඉහළම ප්‍රමාණය පිළිවෙලින් ලෝක බැංකුව (සියයට 16) සහ ආසියානු සංවර්ධන බැංකුව (සියයට 11) සමඟ අත්සන් කරන ලද ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලාභ වේ.

4.1 වගුව: 2025 ජනවාරි 1 සිට ජුනි 30 දක්වා විදේශ මූල්‍යන ප්‍රතිලාභ ප්‍රමාණය

සංවර්ධන පාර්ශ්වකරු/ණය දෙන ආයතනය	ප්‍රතිලාභ ප්‍රමාණය * (ඇ. ඩො. මි.)
	ණය
ද්විපාර්ශ්වික	**17.7**
ජපානය	10.7
අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල	4.4
නෙදර්ලන්තයේ මධ්‍යම සමුපකාරය	1.3
කොරියාව	1.2
බහුපාර්ශ්වික	**529.8**
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල	332.7
ලෝක බැංකුව	86.5
ආසියානු සංවර්ධන බැංකුව	58.6
ඔපෙක් අරමුදල	33.1
ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව	17.9
කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල	1
එකතුව	**547.5**

මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

සටහන්: එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන ප්‍රතිලාභ අගයයන් ඇ.ඩො. බවට පරිවර්තනය කිරීමේදී, එක් එක් ප්‍රතිලාභයන් සිදුවූ දිනයන්හි පැවති විනිමය අනුපාතිකය භාවිතා කර ඇත.

විශේෂ ගැනුම් හිමිකම් විනිමය ඇ.ඩො. බවට පරිවර්තනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පෙර මාසයේ අවසානයේ පැවති මාසික විනිමය අනුපාතික භාවිතා කර ඇත.

**තාවකාලික අගයන්*

මෙම ප්‍රතිලබ්ධිවලින් සියයට 65 ප්‍රමාණයක් අයවැය මූල්‍යකරණ අංශය සඳහා උපයෝජනය කර ඇති අතර, අනතුරුව මානුෂීය සහාය අංශයේ ව්‍යාපෘතිවල සියයට 7 ක්ද, ජල සම්පාදන සහ සනීපාරක්ෂක අංශයේ ව්‍යාපෘතිවල සියයට 5 බැගින් වූ ප්‍රමාණයක් ද උපයෝජනය කර ඇත.

4.1 රූප සටහන : 2025 ජනවාරි මස 1 සිට ජූනි මස 30 දින දක්වා සිදුවූ ප්‍රතිලබ්ධි සංවර්ධන පාර්ශ්වකරු අනුව (ඇ. ඩො. මිලියන)



මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

4.2 රූප සටහන : 2025 ජනවාරි 1 සිට ජූනි 30 දක්වා සිදුවූ ප්‍රතිලබ්ධි ප්‍රධාන ආර්ථික අංශ අනුව (ඇ. ඩො. මිලියන)



මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

*** වෙනත් = කෘෂිකර්මය, අධ්‍යාපනය සහ පුහුණු, සෞඛ්‍ය සහ සමාජ සුභසාධනය, ඉඩම් සංවර්ධනය, විදුලිබල සහ බලශක්ති, ග්‍රාමීය සංවර්ධනය*

4.4. විදේශ ණය ප්‍රමාණය සහ විදේශ ණය සේවාකරණය

2025 ජූනි මාසය අවසන් වන විට රජය ලබාගෙන තිබූ විදේශ ණය ප්‍රමාණය ඇ. ඩො. බිලියන 37.1 ක් විය[1]. රජයේ මුළු විදේශ ණයවලින් සියයට 36 ක් බහුපාර්ශ්වික ණය වන අතර, වාණිජ ණය සියයට 34 ක් ද ද්විපාර්ශ්වික ණය සියයට 30 ක් ද වේ. වාණිජ ණයවලින් ආසන්න වශයෙන් සියයට 81 ක් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ISB) වලින් සමන්විත වන අතර, ඉතිරිය විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් වලින් සමන්විත වේ.

බහුපාර්ශ්වික ණයහිමියන් අතරින්, ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුව එක්ව මුළු බහුපාර්ශ්වික ණය ප්‍රමාණයෙන් සියයට 85 කට වැඩි ප්‍රමාණයක් නියෝජනය කරනු ලබයි. ද්විපාර්ශ්වික ණයවලින්, සියයට 59 ක් පැරිස් සමාජ නොවන ණයහිමියන් සතු වූ අතර ඉතිරි සියයට 41 පැරිස් සමාජ සාමාජික රටවලින් සමන්විත වේ.

2025 ජනවාරි 1 වන දින සිට ජූනි 30 වන දින දක්වා මුළු ණය සේවාකරණය[2] ඇ.ඩො. මිලියන 1,358.9 ක් වූ අතර, එයින් ඇ.ඩො. මිලියන 863.6 ක් ණය වාරික ආපසු ගෙවීම සඳහා යොදවා ඇති අතර, ඇ.ඩො. මිලියන 495.3 ක ප්‍රමාණය පොලී ගෙවීම් සඳහා යොදවා ඇත.

2025 ජූනි මස අවසානය වන විට නොපියවූ විදේශ ණය හිඟ ගෙවීම් නොමැත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අර්ථ දක්වා ඇති පරිදි විදේශ ණය හිඟ ගෙවීම් යනු ගිවිසුම්ගත ගිවිසුම්වල නිශ්චිතව දක්වා ඇති පරිදි, අදාළ සහන කාලයකට යටත්ව, නියමිත කාලසීමාවේදී ගෙවා නොමැති අනේවාසික ණය-සේවා බැඳීම් (මූලික ගෙවීම් සහ පොලී ගෙවීම්) වේ. කෙසේ වෙතත්, මතභේදයට තුඩු දී ඇති හිඟ ණය සහ ණය සේවා බැඳීම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන අධීක්ෂණය සඳහා විදේශ ණය හිඟ ගෙවීම් ලෙස නොසැලකේ. එනම්, නැවත කාලසටහන්ගත කිරීමේ හෝ ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුමක් අපේක්ෂා කරන ණය සේවාව නොගෙවීමෙන් ඇතිවන හිඟ මුදල් මෙම අර්ථ දැක්වීමෙන් බැහැර කර ඇත[3].

[1] - තාවකාලික අගයයන්, ණය සේවාකරණය, තාවකාලිකව නතර කිරීමේ ප්‍රතිපත්තිමය තීරණයෙන් පසු එකතු වූ නොගෙවූ ණය වාරික ද ඇතුලුව මධ්‍යම රජයේ හිඟ විදේශ ණය පමණක් නිරූපණය කර ඇත.
- භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරයන්හි අනේවාසික ආයෝජන ඇතුලත් නොවේ.
- ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයන්හි ගෙවීමට ඇති ණය ප්‍රමාණ එහි හිමිකාරිත්වයේ නේවාසික/ අනේවාසික තත්ත්වය මත වර්ගීකරණය කර නොමැත.

[2] ණය සේවාකරණ = ණය ආපසු ගෙවීම +පොලී ගෙවීම

[3] මූලාශ්‍රය: 2025 ජූලි දිනැති ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වාර්තාව අංක 25/162